# කාර්ය සාධන වාර්තාව
# செயலாற்றுகை அறிக்கை
# PERFORMANCE REPORT
# 2012





## කෘෂිකර්ම අමාත්‍යාංශය
## கமத்தொழில் அமைச்சு
## Ministry of Agriculture


"ගොවිජන මන්දිරය"
80/5 රජමල්වත්ත පාර
බත්තරමුල්ල

"கொவிஜனமந்திரய",
80/5, ரஜமல்வத்தை வீதி
பத்தரமுல்லை

"Govojana Mandiraya"
80/5, Rajamalwatta Lane
Battaramulla

## දැක්ම

"ආහාර සුරක්ෂිතතාවය හා ජාතික සමෘද්ධිය උදෙසා කාර්යක්ෂම,ඵලදායී හා ශක්තිමත් කෘෂිකාර්මික අංශයක්"

## මෙහෙවර

"ස්වභාවික සම්පත් තිරසාර කළමණාකරණය තුලින් සමාජීය වශයෙන් පිළිගත් නව්‍ය හා වානිජමය නැඹුරුවකින් යුතුව,

ගෝලීය තරඟකාරී නිෂ්පාදනයන්

බිහිකරන ව්‍යවසායකත්ව කෘෂිකර්මාන්තයක් සාක්ෂාත් කර ගැනීම"

# පටුන


පිටු අංක

**1) පෙරවදන.** **4**

**2) සාමාන්‍ය පාලනය.** **6-13**

i. කාර්ය මණ්ඩල තොරතුරු.
ii. මානව සම්පත් සංවර්ධනය.
iii. වත්කම් අත්පත් කරගැනීම්.
iv. අළුත්වැඩියා,ඉදිකිරීම් හා නඩත්තු කටයුතු.

**3) අමාත්‍යාංශයේ ප්‍රධාන සංවර්ධන වැඩසටහන්.** **14-35**

i. අපි වවමු - රට නඟමු විශේෂ කෘෂිකාර්මික වැඩසටහන.
ii. පාංශු සංරක්ෂණ පනත ක්‍රියාත්මක කිරීම.
iii. ක්ෂුද්‍ර ජල සම්පාදන සංවර්ධනය සහ වැසි ජල සංරක්ෂණය.
iv. වියළි කලාපීය ජීවනෝපායන් සඳහා සහාය වීමේ හා හවුල්වීමේ වැඩසටහන(IFAD).
v. ආහාර නිෂ්පාදනය සඳහා ජපන් ප්‍රදාන(2KR).
vi. බෝග පුරෝකතන වැඩසටහන.
vii. කාබනික පොහොර නිෂ්පාදනය හා භාවිතය දිරිගැන්වීමේ වැඩසටහන.
viii. ජපන් ප්‍රතිපාර්ශවීය අරමුදල(2KR)රජයේ බීජ ගොවිපල් සංවර්ධනය. (පරන්තන් හා මුරුන්කන්).
ix. ජාතික කෘෂිකාර්මික පර්යේෂණ සැලැස්ම(NARP).
x. ලොකු ළූණු බීජ නිෂ්පාදන වැඩසටහන.
xi. දැයට කිරුළ ජාතික සංවර්ධන වැඩසටහන.
xii. මන්නාරම් දිස්ත්‍රික්කයේ අවතැන් වූ ජනතාවගේ ආහාර සුරක්ෂිතතාව තහවුරු කිරීම සඳහා සහය වීම.
xiii. සහල් අපනයන වැඩසටහන 2012.

**4) විශේෂ සංවර්ධන වැඩසටහන්/ව්‍යාපෘති.** **36-40**

**5) ගොවි භාරකාර අරමුදල.** **41-43**

**6) අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක ආයතන වල සංවර්ධන වැඩසටහන්.** **44-71**

i. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව.
ii. ශ්‍රී ලංකා හදබිම අධිකාරිය.
iii. හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු ආයතනය.
iv. පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනය.
v. ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව.
vi. ජාතික ආහාර ප්‍රවර්ධන මණ්ඩලය.
vii. ජාතික පොහොර ලේකම් කාර්යාලය.
viii. සී/ස ලංකා පොහොර සමාගම.
ix. සී/ස කොළඹ කොමර්ෂල් පොහොර සමාගම.

**7) මූල්‍ය වාර්තා සහ විගණන තොරතුරු.** **72-76**

i. අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රගතිය - 2012 වර්ෂය.
ii. අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන කටයුතු.

# පෙරවදන

පසුගිය වසරේ අමාත්‍යාංශ කාර්ය සාධන වාර්තාව නිකුත් කරන අවස්ථාවේ එයට සටහනක් තබන්නේ ඉමහත් සතුටිනි. ගෙවුනු වසර අමාත්‍යාංශයට මෙන්ම සමස්ථ රටටම අභියෝගාත්මක වසරක් සේ සලකමි. දීර්ඝ කාලීන සංවර්ධන වුවමනා වෙනුවෙන් අතිමහත් සම්පත් ප්‍රමාණයක් ආයෝජනය කරන යුගයක රටක් වශයෙන් ළගාකරගත යුතු අභිමතාර්ථ රාශියකි. ඒ සඳහා කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ දායකත්වය ඉතා වැදගත්ය.

ජාතික ආර්ථිකයේ ප්‍රධානතම අංශයක් වන කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ ප්‍රධානතම ආයතන වන්නේ කෘෂිකර්ම අමාත්‍යාංශය හා ඊට අනුබද්ධ ආයතන ව්‍යුහයයි. අමාත්‍යාංශයේ සංවර්ධන ඉලක්කය කරා යාමේදී කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා හදබිම අධිකාරිය, හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු ආයතනය, පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයනතය, ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව, ජාතික ආහාර ප්‍රවර්ධන මණ්ඩලය, ජාතික පොහොර ලේකම් කාර්යාලය, සී/ස ලංකා පොහොර සමාගම සහ සී/ස කොළඹ කොමර්ෂල් පොහොර සමාගම යන ආයතන සුවිශේෂී දායකත්වයක් සපයයි.

අමාත්‍යාංශය 2012 වසරේ දී ප්‍රධාන සංවර්ධන වැඩසටහන් 13 ක් ක්‍රියාත්මක කරන ලදී. ඒ සඳහා පසුගිය වර්ෂයේදී අමාත්‍යාංශය වෙත රුපියල් මිලියන 1878.541 ක ප්‍රතිපාදන කෘෂි සංවර්ධන වැඩසටහන් වෙනුවෙන් වෙන් කරන ලද අතර, ඉන් රුපියල් මිලියන 1533.398 ක මූල්‍ය ප්‍රගතියක් වසර තුළ අත්පත් කරගන්නට හැකියාව ලැබිණි.

කෘෂි සංවර්ධනය හා සැලසුම් ගත කෘෂිකර්මය කෙරෙහි ප්‍රමුඛ අවධානය යොමුකරමින් අමාත්‍යාංශය හා ඊට අනුබද්ධ ආයතන ක්‍රියාකිරීමෙන් වඩාත් ප්‍රශස්ථ ප්‍රතිඵල අත්කර ගත හැකි අතර, කෘෂිකර්ම අංශයේ ජාතික දායකත්වය අඛණ්ඩව ඉහළ අගයකින් යුක්තව ජාතික නිෂ්පාදිතයේ අන්තර්ගත කළ හැකි බව විශ්වාස කරමි.

2012 වර්ෂයේදී අමාත්‍යාංශයේ කටයුතු සාර්ථකව ඉටු කිරීමේදී ගරු විෂයභාර අමාත්‍ය මහින්ද යාපා අබේවර්ධන මැතිතුමා හා අමාත්‍ය කාර්යමණ්ඩලය ලබා දුන් සහයෝගය ස්තූති පූර්වකව සිහිපත් කරනු කැමැත්තෙමි.

මෙම කාර්ය සාධන වාර්තාව සකස් කිරීම සඳහා අවශ්‍ය තොරතුරු ලබාදුන් සියළුම අංශ හා ආයතන ප්‍රධානීන්ටත්,මෙම කාර්ය ඉටු කල සැලසුම්, මෙහෙයුම් හා ඇගයුම් අංශයටත් මාගේ ස්තූතිය පිරිනමමි.

විජේරත්න සකලසූරිය,
ලේකම් ,
කෘෂිකර්ම අමාත්‍යාංශය.

# අමාත්‍යාංශය භාරව කටයුතු කළ ගරු අමාත්‍යවරු /ලේකම්වරු සහ ආයතන ප්‍රධානීන්
# (2012.01.01 දින සිට 2013.03.31 දින දක්වා)

- **<u>කෘෂිකර්ම අමාත්‍යතුමා</u>**

  ගරු මහින්ද යාපා අබේවර්ධන මැතිතුමා.

- **<u>අමාත්‍යාංශයේ ලේකම්</u>**

  විජේරත්න සකලසූරිය මහතා.

- **<u>අමාත්‍යාංශයට අනුබද්ධ ආයතන වල ප්‍රධානීන්</u>**

1. කේ.ජී.ශ්‍රියාපාල මහතා - කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් - කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
2. ඊ.එම්.අභයරත්න මහතා - අධ්‍යක්ෂ-හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය
3. ආචාර්ය ජයන්ත ඩයස් සමරසිංහ මහතා - සභාපති -ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව
4. නන්දසේන හේරත් මහතා - සභාපති - ශ්‍රී ලංකා හදබිම අධිකාරිය
5. ජගත් පාලිත ජයවර්න මහතා - සභාපති - පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනය
6. කුමුදුනී ගුණසේකර මිය - සභාපතිනිය - ජාතික ආහාර ප්‍රවර්ධන මණ්ඩලය
7. රන්ජන් ධර්මවර්ධන මහතා - අධ්‍යක්ෂ - ජාතික පොහොර ලේකම් කාර්යාලය
8. බුද්ධික මඩිහහේවා මහතා - සභාපති - සී/ස ලංකා පොහොර සමාගම
9. එන්.එස්.එම්.සම්සුදීන් මහතා - සභාපති - සී/ස කොළඹ කොමර්ෂල් පොහොර සමාගම

# 02.සාමාන්‍ය පරිපාලනය

## *i.කාර්ය මණ්ඩල තොරතුරු*

### <u>2012.12.31 දිනට අමාත්‍යාංශයේ මාණ්ඩලික නිලධාරීන්</u>

| අනු අංකය | නම | තනතුර |
|---|---|---|
| 1 | ඩබ්ලිව්.සකලසූරිය මහතා | ලේකම් |
| 2 | ඒ.එල්.ඒ.අසෝක සිරිවර්ධන මහතා | අතිරේක ලේකම් (පාලන) |
| 3 | ජී.ඒ.එම්.එස්.ඇමිටියගොඩ මහතා | අතිරේක ලේකම් (කෘෂි සංවර්ධන) |
| 4 | ආචාර්ය ඩී.බී.ටී. විජේරත්න මහතා | අතිරේක ලේකම් (කෘෂි තාක්ෂණ) |
| 5 | එස්.එල්.ජී.බන්දුසිරි මහතා | ප්‍රධාන ගණකාධිකාරී |
| 6 | එච්.ජී.ජී.ජේ. ධර්මසේන මහතා | අධ්‍යක්ෂ (සංවර්ධන) |
| 7 | ජී.ඩී.ජේ.එල්.සුනිල් ගෝවින්න මහතා | අධ්‍යක්ෂ (කෘෂි සේවා) |
| 8 | එල්.යූ.එන්.සුමනසේකර මිය | අධ්‍යක්ෂ (කෘෂි තාක්ෂණ) |
| 9 | ඩබ්.ඩී. ධර්මසිරි මහතා | අධ්‍යක්ෂ (ස්වාභාවික සම්පත්) |
| 10 | එල්.කේ.හතුරුසිංහ මහතා | අධ්‍යක්ෂ (ව්‍යාපෘති) |
| 11 | ආචාර්ය ජේ.ඩී.එච්. විජේවර්ධන මහතා | අධ්‍යක්ෂ (කාබනික පොහොර) |
| 12 | එන්.ජී. රත්නායක මහතා | අධ්‍යක්ෂ (සැලසුම් හා මෙහෙයුම්) |
| 13 | ඩබ්.කේ.එල්.ඊ. වලල්ලාවිට මහතා | ප්‍රධාන අභ්‍යන්තර විගණක |
| 14 | එස්.ඒ. ශ්‍රියානි මිය | ගණකාධිකාරී (ප්‍රසම්පාදන) |
| 15 | එස්.ඩී. නන්දන මහතා | ගණකාධිකාරී (ගෙවීම්) |
| 16 | පී.එන්.එන්. ජයනෙත්ති මහතා | නියෝජ්‍ය අධ්‍යක්ෂ (ව්‍යාපෘති) |
| 17 | එම්.ජී.ඒ.පී. කුමාර මහතා | නියෝජ්‍ය අධ්‍යක්ෂ (කාබනික පොහොර) |
| 18 | ඩී.එන්. හෙට්ටිආරච්චි මිය | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (ආයතන/වැ.බ.) |
| 19 | බී.එච්.සී. ශිරෝමාලි මිය | සහකාර අධ්‍යක්ෂ (සංවර්ධන) |
| 20 | ආර්.ටී. බුලත්සිංහල මිය | සහකාර ලේකම් (පාලන I) |
| 21 | එම්.ඒ.එස්.කේ. ගුණවර්ධන මිය | සහකාර අධ්‍යක්ෂ (සංවර්ධන ) |
| 22 | කේ.එස්.පී. පියතිස්ස මිය | සහකාර ලේකම් (ආයතන ) |
| 23 | ඊ.එම්.එස්. ඒකනායක මහතා | සහකාර අධ්‍යක්ෂ (සැලසුම් ) |
| 24 | ධම්මික එදිරිසූරිය මහතා | සහකාර අධ්‍යක්ෂ (ස්වභාවික සම්පත්) |
| 25 | එම්.කේ.රාජපක්ෂ මිය | සහකාර ලේකම් (පාලන II) |
| 26 | බී.ආරියපාල මහතා | භාෂා පරිවර්තක |

| අනු අංකය | නම | තනතුර |
|---|---|---|
| 27 | එස්.වයි.අබේවර්ධන මිය | අමාත්‍යාංශ ලේකම්ගේ සම්බන්ධීකරණ ලේකම් |
| 28 | පී.ඒ.එම්.කරුණාරත්න මහතා | සංඛ්‍යාලේඛණඥ |
| 29 | එල්.එල්.පී.කිත්සිරි පෙරේරා මහතා | සහකාර ලේකම් (කම්කරු සබඳතා) |
| 30 | පී.එජ්.එස්.චන්ද්‍රිකා මිය | පරිපාලන නිලධාරි (වැ.බ.) |
| 31 | ඩබ්.ජේ.පෙරේරා මහතා | පරිපාලන නිලධාරි (වැ.බ.) |

**<u>2012.01.01 සිට 2012.12.31 දක්වා ස්ථාන මාරු වී ගිය මාණ්ඩලික නිලධාරීන්, අනෙකුත් නිලධාරීන් සහ කණිෂ්ට සේවකයන්</u>**

| අනු අංකය | නම | තනතුර | දිනය |
|---|---|---|---|
| 1 | ඩී.එම්.ආර්.බී.දිසානායක මහතා ශ්‍රී.ල.ප.සේ. (වි.ශ්‍රේ.) | විධායක අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා හඳබිම අධිකාරිය | 2012.06.18 |
| 2 | තුෂාරා ඩී.පතිරගේ මිය ශ්‍රී.ල.ප.සේ.( I) | ජ්‍යෙෂ්ඨ සහාකාර ලේකම් (පාලන) | 2012.08.01 |
| 3 | පී.එල්. නන්දසිරි මහතා ශ්‍රී.ල.ප.සේ. (වි.ශ්‍රේ.) | අතිරේක ලේකම් (පාලන) | 2012.08.15 |
| 4 | එල්.පී.ලියනගේ මිය ශ්‍රී.ල.ප.සේ. (I) | ජ්‍යෙෂ්ඨ සහාකාර ලේකම් (ආයතන) | 2012.09.26 |
| 5 | අයි.යූ.කේ.සෙනෙවිරත්න මහතා ශ්‍රී.ල.සැ.ල.සේ.(III) | සහකාර අධ්‍යක්ෂ (සැලසුම්) | 2012.12.20 |
| 6 | පී.ඩබ්.එල්.වීරසිංහ මහතා | රා.කළ.ස. III | 2012.05.04 |
| 7 | එස්.එච්.හෙට්ටිආරච්චි මිය | රා.කළ.ස. III | 2012.08.07 |
| 8 | කේ.ජී.එස්.සී.ආරියදාස මහතා | රා.කළ.ස. II | 2012.10.17 |
| 9 | එන්.ඩී.වී.ධම්මිකා මිය | කෘෂි.සං.සහකාර | 2012.02.02 |
| 10 | ආර්.එල්.එච්.රාජපක්ෂ මහතා | සංවර්ධන සහකාර | 2012.03.14 |
| 11 | එච්.ජී.එන්.සුමනතිලක මිය | සංවර්ධන සහකාර | 2012.04.02 |
| 12 | කේ.එස්. එස්.ජයසේන මිය | කෘෂි.නිෂ්.ව්‍යා. සහකාර | 2012.04.23 |
| 13 | එම්.සී.බාලසූරිය මිය | සංවර්ධන සහකාර | 2012.05.02 |
| 14 | ඩී.කේ.එස්.එන්.ගුණවර්ධන මිය | සංවර්ධන සහකාර | 2012.05.02 |
| 15 | ටී.විදානපතිරණ මහතා | සංවර්ධන සහකාර | 2012.05.10 |
| 16 | එම්. එම්.එන්.බණ්ඩාර මහතා | කෘෂි.සං.සහකාර | 2012.05.16 |
| 17 | ඩී.ඒ. ඩී.ජීවන්ත සිල්වා මහතා | කෘෂි.සං.සහකාර | 2012.05.16 |
| 18 | බී.එස්.කේ.ද සිල්වා මහතා | කා.සේ.සේ. II | 2012.01.27 |
| 19 | ඒ.ඩබ්.එස්.එච්.බී.අටුගොඩ මහතා | රියදුරු II ආ | 2012.01.09 |
| 20 | එස්.ඕ.එම්.එල්.ජයලත් මහතා | රියදුරු II ආ | 2012.03.14 |
| 21 | කේ.පී.ඒ.යූ.සිල්වා මහතා | රියදුරු II ආ | 2012.04.30 |

## 2012.01.01 සිට 2012.12.31 දක්වා ස්ථාන මාරු වී පැමිණි මාණ්ඩලික නිලධාරින්, අනෙකුත් නිලධාරීන් සහ කණිෂ්ට සේවකයන්

| අනු අංක | නම | තනතුර | දිනය |
|---|---|---|---|
| 1 | ඩබ්ලිව්.සකලසූරිය මහතා ශ්‍රී.ල.ප.සේ.(වි.ශ්‍රේ.) | ලේකම් | 2012.01.02 |
| 2 | එම්.ජී.ජී.පී.කුමාර මහතා ශ්‍රී.ල.කෘ.සේ.(II /I ) | සහකාර අධ්‍යක්ෂ (කාබනික පොහොර) | 2012.01.05 |
| 3 | ජී.ඩී.ජේ.එල්.සුනිල් ගෝවින්න මහතා ශ්‍රී.ල.කෘ.සේ. (I ) | අධ්‍යක්ෂ(කෘෂි සේවා ) | 2012.03.13 |
| 4 | එම්.බී.ආර්.පුෂ්පකුමාර මහතා ශ්‍රී.ල.ප.සේ.(I) | විධායක අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා හඳබිම අධිකාරිය | 2012.07.02 |
| 5 | ඒ.එල්.ඒ.අසෝක සිරිවර්ධන මහතා ශ්‍රී.ල.ප.සේ. (වි.ශ්‍රේ.) | අතිරේක ලේකම් (පාලන) | 2012.08.21 |
| 6 | එම්.කේ.රාජපක්ෂ මිය ශ්‍රී.ල.ප.සේ.(III ) | සහාකර ලේකම් (පාලන) | 2012.09.24 |
| 7 | ඒ.ජී.එන්.පී.කරුණාරත්න මෙය | රා.කළ.ස.II | 2012.01.17 |
| 8 | පී.ජී.සුසන්ත ජයලත් මහතා | කා.සේ.සේ.III | 2012.02.01 |

## 2012.01.01 සිට 2012.12.31 දක්වා විශ්‍රාම ගිය මාණ්ඩලික නිලධාරීන්, අනෙකුත් නිලධාරීන් සහ කණිෂ්ඨ සේවකයන්

- **2012.01.01 සිට 2012.12.31 දක්වා කිසිදු මාණ්ඩලික නිලධාරියෙක් විශ්‍රාම ගොස් නොමැත.**

| අනු අංක | නම | තනතුර | දිනය |
|---|---|---|---|
| 1 | එම්.එම්.එස්.බී.මල්ලව මහතා | රා.කළ.ස. I | 2012.04.01 |
| 2 | පී.ඒ.ඩී.හේමරත්න මහතා | රා.කළ.ස. I | 2012.10.25 |
| 3 | යූ.එච්.කරුණාසිරි මහතා | ප්‍රවාහන සහකාර | 2012.04.26 |
| 4 | එම්.ආර්.එල්.හේමචන්ද්‍ර මහතා | රියදුරු II | 2012.05.04 |
| 5 | ඊ.පී.සමරසිංහ මහතා | රියදුරු II | 2012.05.06 |
| 6 | ඩබ්.එම්.ලයනල් අමරතුංග මහතා | රියදුරු II ආ | 2012.10.05 |
| 7 | ඩබ්.සෝමසිරි මහතා | රියදුරු I | 2012.12.09 |
| 8 | ජී.එච්.පියදාස මහතා | කා.සේ.සේ. I | 2012.02.05 |
| 9 | එල්.ෂෙල්ටන් සිල්වා මහතා | කා.සේ.සේ. I | 2012.09.09 |

## 2012.01.01 සිට 2012.12.31 දක්වා උසස්වීම් ලැබී ස්ථාන මාරු වී ගිය නිලධාරින්

| නම | තනතුර | දිනය |
|---|---|---|
| එච්.පී.එස්.හේවාවසම් මෙය | රා.කළ.ස. I | 2012.07.13 |

## 2012.01.01 සිට 2012.12.31 දක්වා වෙනත් සේවාවන් සඳහා නිදහස් කරන ලද නිලධාරින්

| නම | තනතුර | දිනය |
|---|---|---|
| එම්.පී.එස්.අමරතුංග මිය (ගුරු සේවයට) | රා.කළ.ස. I | 2012.04.23 |

## ii. මානව සම්පත් සංවර්ධනය

### පුහුණු වැඩසටහන්

| | වැය විෂය අංකය | වැය වූ මුදල |
|---|---|---|
| දේශීය පුහුණු වීම් | 118-1-2-2401 අමාත්‍යාංශය | 787,102.00 |
| | 118-2-3-2401 කෘෂි සංවර්ධන අංශය | 43,750.00 |
| විදේශීය පුහුණු වීම් | 118-1-1-1102 අමාත්‍ය කාර්යාලය | 4,285,010.73 |
| | 118-1-2-1102 අමාත්‍යාංශය | 868,916.80 |
| | 118-2-3-1102 කෘෂි සංවර්ධන අංශය | 2,898,036.31 |

### දේශීය පුහුණු වැඩසටහන්

| අනු අංකය | පුහුණු වැඩසටහන | සහභාගි වූ නිළධාරීන් |
|---|---|---|
| 1 | රියදුරු පුහුණු වැඩමුළුව. | සියලුම රියදුරු මහතුන් සඳහා |
| 2 | පුස්තකාල හා විඥාපන විද්‍යා උපාධි ඩිප්ලෝමා පාඨමාලාව. | කේ.ජී.එස්.ගුණතිලක මහතා. |
| 3 | විශ්‍රාම වැටුප් සකස් කිරීම පිළිබඳ වැඩමුළුව. | මාණ්ඩලික නිළධාරීන් , රාජ්‍ය කළමණාකාර සහකාර සේවයේ සහ සංවර්ධන සහකාර සේවයේ නිළධාරීන්. |
| 4 | වාහන වලින් පිටවන වායු දූෂ්‍ය කාරක අවම කිරීම පිණිස ප්‍රවාහන නිලධාරීන් සහ එම ක්ෂේත්‍රයේ නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන. | යූ.එල්.බී.දසනායක මහතා කළමණාකරණ සහකාර |
| 5 | තරුණ නායක බව පුහුණු වැඩසටහන | කාංචනා ගුණවර්ධන මිය (සහකාරලේකම්/ආයතන) |
| 6 | පරිපාලනමය නීති සහ මානව සම්පත් සංවර්ධනය පුහුණු වැඩසටහන | ආර්.ටී.බුලත්සිංහල මිය<br>ස. ලේකම් (පාලන I)<br>ඩී.එන්.හෙට්ටිආරච්චි මිය<br>ජ්‍යෙ.ස.ලේකම් (ආයතන) |
| 7 | ලේකම්වරුන් හා අතිරේක ලේකම්වරුන් සඳහා වන ක්‍රමෝපායායනික දාම කළමණාකරණය පිළිබඳ සම්මන්ත්‍රණය | පී.එල්.නන්දසිරි මහතා<br>අතිරේක ලේකම් (පාලන) |
| 8 | ඉහළ සේවා ඵලදායිතාවන් සඳහා කළමනාකරණය | කළමනාකරණ සහකාර - 02 |
| 9 | සුපිරි එස් 5 ඵලදායිතා මෙවලම් ලෙස | කළමනාකරණ සහකාර -03 |
| 10 | රාජ්‍ය ආයතනවල නීතිමය කටයුතු කළමණාකරණය කිරීම පිළිබඳ වැඩමුළුව | පී.එස්.ඩබ්. හේවගේ මිය-නීති සහකාර<br>එච්.සී.ඩී. ද සොයිසා -නීති සහකාර |
| 11 | තොරතුරු තාක්ෂණ පිළිබඳ පශ්චාත් උපාධි පාඨමාලාව | එච්.එම්.අයි.දේශප්‍රිය මහතා- තොරතුරු තාක්ෂණ සහකාර |
| 12 | පුස්තකාල හා තොරතුරු විද්‍යාව පිළිබඳ ජාතික සම්මේලනය | කේ.ජී.එස්.ගුණතිලක මහතා |

| | | |
|---|---|---|
| 13 | අභ්‍යන්තර විගණනය පිළිබඳ පුහුණු වැඩසටහන | ඩබ්.කේ.එල්.වලල්ලාවිට මහතා (ප්‍රධාන අභ්‍යන්තර විගණක) |
| 14 | කාර්යාල කළමණාකරණය හා කාර්යාල ක්‍රම පිළිබඳ වැඩමුළුව | උපාධිධාරී අභ්‍යාසලාභීන් |
| 15 | රියදුරු මහතුන් සඳහා පුහුණුව ලබා දීම පිළිබඳ වැඩමුළුව | තෝරාගත් රියදුරන් 05 |
| 16 | ලේකම්කරණ කුසලතා වර්ධනය - දෙදින පුහුණු වැඩමුළුව | ඒ.එස්.එදිරිසිංහ මිය |
| 17 | සංවර්ධන නිලධාරීන් සඳහා එක්දින පුහුණු වැඩමුළුව | උපාධිධාරී අභ්‍යාසලාභීන් 05 |
| 18 | තත්ත්ව පාලන කව | මධුසරණී රාජපක්ෂ මිය සහකාර ලේකම් (පාලන I I) |
| 19 | නව පරපුරේ භාවිතය සඳහා පුස්තකාල විධි වෙනස්වීම | කේ.ජී.එස්.ගුණතිලක මහතා |
| 20 | අභ්‍යන්තර විගණනකවරුන් සඳහා වැඩමුළුව | ඩබ්.කේ.එල්.වලල්ලාවිට මහතා (ප්‍රධාන අභ්‍යන්තර විගණක) |
| 21 | රාජ්‍ය අංශයේ ගිණුම් ප්‍රමිත පිළිබඳ පුහුණු වැඩසටහන | එස්.ශ්‍රියානි මිය (ගණකාධිකාරී- ප්‍රසම්පාදන)<br>ඩබ්.කේ.එල්.වලල්ලාවිට මහතා (ප්‍රධාන අභ්‍යන්තර විගණක) |
| 22 | වැටුප් සකස් කිරීම පිළිබඳ වැඩමුළුව | උනන්දුවක් දැක්වූ අමාත්‍යාංශයේ සියලුම නිලධාරීන් |
| 23 | වෘත්තිමය කාර්යයන් සඳහා වූ ඉංග්‍රීසි පාඨමාලාව | රාජ්‍ය කළමණාකාර සහකාර සේවයේ නිලධාරීන් 04 |
| 24 | රාජ්‍ය මූල්‍ය කළමණාකරණ පිළිබඳ පශ්චාත් උපාධි පාඨමාලාව | එස්.එල්.ජී.බන්දුසිරි මහතා (ප්‍රධාන ගණකාධිකාරී) |
| 25 | ගෝලීය කම්කරු වෙළඳපළ හා තරුණ සේවා නියුක්තිය | අජිත් පුෂ්පකුමාර මහතා (සහකාර අධ්‍යක්ෂ - කාබනික පොහොර) |
| 26 | ස්ථාවර තැන්පතු කළමණාකරණය පිළිබඳ පුහුණු වැඩසටහන | එස්.ඒ.ශ්‍රියානි (ගණකාධිකාරී)<br>ඩී.එල්.ජී.තිලකරත්න (අභ්‍යන්තර විගණන නිලධාරී) |
| 27 | වාර්ෂික විචලන හා අපහරණ පටිපාටිය (දෙදින) | බී.එස්.ඩී.එස්.වීරසිංහ (රාජ්‍ය කළමණාකාර සහකාර) |
| 28 | අමාත්‍යාංශයේ සියලුම මාණ්ඩලික නිලධාරීන් සඳහා වූ පුහුණු වැඩසටහන | සියළුම මාණ්ඩලික නිලධාරීන් |

## විදේශ පුහුණු වැඩසටහන

| නම | තනතුර | වැඩසටහන | කාලසීමාව | රට |
|---|---|---|---|---|
| 01.ඩබ්ලිව්. සකලසූරිය මහතා | ලේකම් | **ආසියාවේ ආහාර හා කෘෂිකර්ම සහයෝගිතාව පිළිබඳ 2 වැනි මහසභා රැස්වීම** | 2012.05.03 - 2012.05.05 | කොරියාව |
| | | **වියළි කලාපීය ජීවනෝපාය නැංවීමේ ව්‍යාපෘතියේ ඉඩම් භුක්තිය නිරීක්ෂණය කිරීමේ අධ්‍යයන චාරිකාව** | 2012.07.08 - 2012.07.13 | පිලිපීනය |

| | | | | |
|---|---|---|---|---|
| 02.එල්.යූ.එන්. සුමනසේකර මිය | අධ්‍යක්ෂ (කෘෂි තාක්ෂණ) | ඵලදායි මානව සම්පත් සංවර්ධනය තුලින් විමධ්‍යගත පාලනය සැපයීම පිළිබඳ CIRDAP-NIRD සහයෝගිතා ජාත්‍යන්තර පුහුණු වැඩසටහන | 2012.01.19 - 2012.01.28 | ඉන්දියාව |
| | | **2012 ලෝක ජල සතිය** | **2012.08.25 - 2012.08.30** | ස්විඩනය |
| 03.ආර්.එස්. මැලැව්වතන්ත්‍රි මිය | කෘෂි සංවර්ධන සහකාර | තිරසාර සංවර්ධනය සහ පාරිසරික කළමණාකරණය පිළිබඳ උසස් සහතික පත්‍රය | 2012.01.18- 2012.03.15 | ඉන්දියාව |
| | | තිරසාර කෘෂිකර්මය පිළිබඳ පශ්චාත් විද්‍යා උපාධි පාඨමාලාව | 2012.07.20- 2014.05.31 | තායිලන්තය |
| 04. කේ.ජයසිංහ මිය | කෘෂි සංවර්ධන සහකාර | එළවළු නිෂ්පාදනය පිළිබඳ පුහුණු වැඩසටහන | 2012.02.15- 2012.04.30 | ඊජිප්තුව |
| 05. එන්.ප්‍රියලාල් මහතා | කෘෂි සංවර්ධන සහකාර | විකල්ප බලශක්ති පිළිබඳ පුහුණු වැඩසටහන | 2012.01.30- 2012.02.24 | ඉන්දියාව |
| | | ඊජිප්තු ජනරජයෙන් පිරිනැමෙන කෘෂි අංශයේ ශිෂත්වය (පාංශු හා ජල කළමණාකරණය) | 2012.10.01- 2012.12.15 | ඊජිප්තුව |
| 06.ආර්.ටී. බුලත්සිංහල මිය | සහකාර ලේකම් | කෘෂි ව්‍යාප්ති කළමණාකරණයේ නව ප්‍රසාරණයන් පිළිබඳ ජාත්‍යාන්තර පුහුණු වැඩසටහන | 2012.02.18- 2012.02.29 | ඉන්දියාව |
| 07.පි.එන්.එන්. ජයනෙත්ති මහතා | නියෝජ්‍ය අධක්ෂ (ව්‍යාපෘති) | ශ්‍රී ලංකා බංගලාදේශ ඒකාබද්ධ කොමිසමේ 4 වැනි සැසිය සඳහා ශ්‍රී ලංකා නියෝජිතවරයන් යැවීම | 2012.03.07- 2012.03.08 | බංග්ලාදේශය |
| | | ශ්‍රී ලංකාව හා වියට්නාමය අතර ඒකාබද්ධ කොමිසමේ 3 වැනි රැස්වීම | 2012.07.16- 2012.07.17 | වියට්නාමය |
| 08.ඩබ්ලිව්.එච්. තීක්ෂණ මහතා | කෘෂි සංවර්ධන සහකාර | කෘෂි අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය දේශීය දැනුම හා අදාල තාක්ෂණය යොදාගැනීම පිළිබඳ පුහුණු වැඩසටහන | 2012.03.07- 2012.03.28 | තායිලන්තය |
| 09.ශාන්ති ජයසුරිය මිය | කෘෂි මෙහෙයුම් නිළධාරී | ගැමියන්ගේ හා ආහාර සුරක්ෂිතතාව පිළිබඳ අවධානයක් යොමු කරමින් ස්ත්‍රී පුරුෂ සමාජ භාවිතය, සමානාත්මතාව පිළිබඳ ජනතාව දැනුවත් කිරීම | 2012.02.27- 2012.03.10 | බ්‍රසීලය |
| 10.මිල්ටන් ලම්බියස් මහතා | කෘෂි සංවර්ධන සහකාර | ග්‍රාමීය පානීය ජලය සහ සනීපාරක්ෂක ව්‍යාපෘති කළමණාකරණය පිළිබඳ CIRDAP සහ NIRD සහයෝගිතා ජාත්‍යාන්තර පුහුණු වැඩසටහන | 2012.03.19- 2012.03.28 | ලාඕසය |

| | | | | |
|---|---|---|---|---|
| | | කෘෂිකාර්මික ග්‍රාමීය සංවර්ධනය පිළිබඳ පශ්චාත් උපාධි වැඩසටහන | 2011.11 සිට | කොරියාව |
| 11. ශ්‍යාමලී පියතිස්ස මිය | සහකාර ලේකම් | සාක් කලාපීය දේශගුණ වෙනස් වීම් පිළිබඳ විශේෂ පුහුණු වැඩසටහන | 2012.03.29 | කොරියාව |
| 12.ජී.එල්.එස්.එන්. ලියනගේ මිය | කෘෂි මෙහෙයුම් නිළධාරී | දකුණු ආසියාවේ තිරසාර ඉඩම් කළමණාකරණය හා දේශගුණ විපර්යාස වලට අනුව ඉඩම් හායනය වීම තක්සේරු කිරීම හා අධීක්ෂණය | 2012.03.14- 2012.03.16 | චීනය |
| 13.පී.එල්.නන්දසිරි මහතා | අතිරේක ලේකම් (පාලන) | කෘෂිකර්මය පිළිබඳ තාක්ෂණය හඳුන්වා දීම හා ව්‍යාප්ති සේවා හා තාක්ෂණය පිළිබඳ දැනුවත් වීම | 2012.06.25- 2012.06.30 | තායිලන්තය |
| 14.ආචාර්ය ඩී.බී.ටී.විජේරත්න මහතා | අතිරේක ලේකම් (කෘෂි තාක්ෂණ) | ආසියා පැසිපික් කලාපීය 31 වැනි FAO සමුළුව | 2012.03.12 - 2012.03.16 | වියට්නාමය |
| | | NPO ප්‍රධානීන්ගේ 53 වැනි වැඩමුළුව | 2012.10.23 - 2012.1025 | ඉන්දුනීසියාව |
| | | ආසියාවේ ආහාර හා කෘෂි සහයෝගීතාව පිළිබඳ 02 වැනි මහා සභාව | 2012.05.03 - 2012.05.05 | කොරියාව |
| | | කෘෂිකර්මාන්තයේ දේශගුණ විපර්යාස ජය ගැනිම සඳහා වූ ක්‍රමෝපායන් පිළිබඳ AFACI ඉහල මට්ටමේ නිලධාරි හමුව | 2012.11.04 - 2012.11.07 | තායිලන්තය |
| 15. කේ.ජයසිංහ මිය | වැඩසටහන් සහකාර | කෘෂි ව්‍යාපෘති කළමණාකරණය | 2012.01.01- 2012.02.28 | ඉන්දියාව |
| 16.එච්.ජී.ජී.ජේ. ධර්මසේන මහතා | අධ්‍යක්ෂ (සංවර්ධන) | අග්නිදිග ආසියානු රටවල පසු අස්වනු ගුණාත්මක බව හා ආහාර සුරක්ෂිතතාව පිළිබඳ වැඩමුළුව | 2012.04.30- 2012.05.04 | තායිලන්තය |
| | | ප්‍රමාණවත් ආර්ථික න්‍යාය පිළිබඳ වැඩමුළුව | 2012.08.26 -2012.08.30 | තායිලන්තය |
| 17.එල්.කේ. හතුරුසිංහ මහතා | අධ්‍යක්ෂ (ව්‍යාපෘති) | 18 වැනි ජාත්‍යන්තර කෘෂිකාර්මික ප්‍රදර්ශනය | 2012.05.15 - 2012.05.17 | ඊශ්‍රායලය |
| | | ලෝක ආහාර සුරක්ෂිතතාවය පිළිබඳ 35 වැනි සැසියට ආරාධනා | 2012.10.15 - 2012.10.20 | ඉතාලිය |
| 18.ජී.ඒ.එම්.එස්. ඇමටියගොඩ මහතා | අතිරේක ලේකම් (කෘෂි සංවර්ධන) | ලෝක ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ 144 වැනි සැසිය | 2012.06.11- 2012.06.15 | ඉතාලිය |
| 19. එන්.ජී. රත්නායක මහතා | අධ්‍යක්ෂ (සැලසුම්) | කෘෂිකර්මය පිළිබඳ තාක්ෂණය හඳුන්වා දීම හා ව්‍යාප්ති සේවා හා තාක්ෂණය පිළිබඳ දැනුවත් | 2012.06.25- 2012.06.30 | තායිලන්තය |

| | | විම | | |
|---|---|---|---|---|
| 20.එස්.එල්.ජී. බන්දුසිරි මහතා | ප්‍රධාන ගණකාධිකාරි | කෘෂිකර්මය පිළිබඳ තාක්ෂණය හඳුන්වා දීම හා ව්‍යාප්ති සේවා හා තාක්ෂණය පිළිබඳ දැනුවත් විම | 2012.06.25-2012.06.30 | තායිලන්තය |
| 21. වෛද්‍ය සී.සී.වයි. අබේවර්ධන මහතා | පෝෂණ සම්බන්ධී කාරක | සෞඛ්‍ය සහ ස්නායු පිළිබඳ බෝ නොවන රෝග පිළිබඳ කලාපීය වැඩමුළුව. | **2012.04.24-2012.04.26** | මියන්මාරය |
| 22.ආර්.ජ්.ඩී.ඩී. එන්. රණසිංහ මිය. | කෘෂි සංවර්ධන සහකාර | කෘෂිකාර්මික භාණ්ඩ වල අගය එකතු කිරීම නව වෙළඳපළවල් සඳහා නව ප්‍රවේශයක් පිළිබඳ පුහුණුව | 2012.07.09-2012.07.14 | පිලිපීනය |
| 23. ඩබ්ලිව්.ආර්.එන්. ප්‍රනාන්දු මිය | වැඩසටහන් සහකාර | ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධනය පිළිබඳ පුහුණු වැඩසටහන | 2012.08.10-2012.09.25 | ඊජිප්තුව |

## ***iii.වත්කම් අත්පත් කර ගැනීම***

- අමාත්‍යාංශයේ ප්‍රවාහන කටයුතු සඳහා නව වෑන් රථයක් හා මෝටර් රථයක් මිලදී ගන්නා ලදි.

| වාහන අංකය | වටිනාකම (මිලියන) | මිලදී ගත් දිනය |
|---|---|---|
| WP-NB 2832 | 9.1 | 2012.03.27 |
| WP-KS 4826 | 8.5 | 2012.04.27 |

## ***iv.අලුත් වැඩියා,ඉදිකිරීම් හා නඩත්තු කටයුතු***

- අමාත්‍යාංශ ගොඩනැගිල්ලේ වැහිපීලි බොහොමයක ජලය රැඳී තිබීම නිසා ඩෙංගු මදුරුවන් බෝවීමේ ප්‍රවණතාවයක් දක්නට ලැබුණි. ඒ අනුව අමාත්‍යාංශ ගොඩනැගිල්ලේ සවි කර තිබූ වැහිපීලි ගලවා ඉවත් කර ඩෙංගු මදුරුවන් බෝවීම වැළැක්වීමට කටයුතු කරන ලදි.මේ සඳහා වියදම රු.214,780.00 කි.
- ගරු අමාත්‍ය කාර්යාලය, අතිරේක ලේකම් (පාලන) කාර්යාලය ,විගණන, ව්‍යාපෘති, නඩත්තු, ආයතන, සංවර්ධන යන අංශ වල ජනේල සඳහා Vertical Blind යොදා කාර්යාල ප්‍රියජනක ස්ථානයන් බවට පත් කරන ලදි. මේ සඳහා වියදම රු.650,550.00 කි.
- අමාත්‍යාංශයේ රැස්වීම් ශාලාවේ,ලී බඩු පොලිෂ් කර Vertical Blind දමා නවීකරණය කරන ලදි. මේ සඳහා වියදම රු.178,600.00 කි.
- ශ්‍රවනාගාරයේ තිර රෙදි අලුතින් යොදා තීන්ත ආලේප කර නවීකරණය කරන ලදි. මේ සඳහා වියදම රු.278,753.00 කි.
- ගරු ඇමතිතුමාගේ කාර්යාලයේ අලුත්වැඩියා කටයුතු සිදු කරන ලදි. මේ සඳහා වියදම රු.271,789.00 කි.
- අමාත්‍යාංශ ගොඩනැගිල්ලේ F.T. 7,8,9 වැසිකිළි සහ පොදු වැසිකිළිය සම්පූර්ණයෙන් අලුත්වැඩියා කරන ලදි. මේ සඳහා වියදම රු.1,300,047.00 කි.
- අනවසර පදිංචිකරුවන් ඉවත් කල ඉඩම් කොටසේ මායිම් වැට අලුතින් සකස් කිරීම. **මේ සඳහා වියදම රු.283,849.00 කි.**

## 03.අමාත්‍යාංශයේ ප්‍රධාන සංවර්ධන වැඩසටහන්.

2012 මුදල් වර්ෂයේදී භාණ්ඩාගාර ප්‍රතිපාදන මත ප්‍රධාන සංවර්ධන වැඩසටහන් 13 ක් ක්‍රියාත්මක වු අතර ඒ සඳහා වෙන් කළ ප්‍රතිපාදනයන් වර්ෂය තුල නැවත සංශෝධනයට ලක් විය.2012.12.31 දිනට 82% ක මූල්‍ය ප්‍රගතියක් අත්කර ගැනීමට හැකිවිය.

**<u>2012 වර්ෂයේ අමාත්‍යාංශ ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක වූ ප්‍රධාන සංවර්ධන වැඩසටහන්</u>**

| අනු අංක | වැඩසටහන | වෙන් කළ ප්‍රතිපාදන (රු.මි) | සංශෝධිත ප්‍රතිපාදන (රු.මි) | වියදම (රු.මි) | ප්‍රගතිය (%) |
|---|---|---|---|---|---|
| **1.** | අපි වවමු - රට නඟමු විශේෂ වැඩසටහන | 460 | 460 | 313.11 | 68.1% |
| **2.** | පාංශු සංරක්ෂණ පනත ක්‍රියාත්මක කිරීම | 20 | 12.414 | 9.427 | 76% |
| **3.** | ක්ෂුද්‍ර ජල සම්පාදන සංවර්ධනය සහ වැසි ජල සංරක්ෂණය | 20 | 7.586 | 6.160 | 81% |
| **4** | **වියළි කලාපීය ජීවනෝපායන් සඳහා සහාය වීමේ හා හවුල්වීමේ වැඩසටහන(IFAD)** | 613 | 573 | 530.391 | 92.6% |
| **5.** | ආහාර නිෂ්පාදනය සඳහා ජපන් ප්‍රදාන(2KR) | 585 | 493.709 | 430.466 | 87.2% |
| **6.** | බෝග පුරෝකථන වැඩසටහන | 4.0 | 3.0 | 2.126 | 71% |
| **7.** | කාබනික පොහොර නිෂ්පාදනය හා භාවිතය දිරිගැන්වීමේ වැඩසටහන | 125 | 100 | 92.742 | 93% |
| **8.** | **ජපන් ප්‍රතිපාර්ශවිය අරමුදල(2KR)රජයේ බීජ ගොවිපල් සංවර්ධනය(පරන්තන් හා මුරුන්කන්)** | 84.847 | 72.752 | 52.599 | 72.3% |
| **9.** | ජාතික කෘෂිකාර්මික පර්යේෂණ සැලැස්ම(NARP) | 20 | 10 | 5.056 | 50.6% |
| **10.** | ලොකු ළූණු බීජ නිෂ්පාදන වැඩසටහන | 25 | 25 | 7.472 | 30% |
| **11.** | දැයට කිරුළ සංවර්ධන වැඩසටහන | 60 | 60 | 38.315 | 64% |
| **12.** | **මන්නාරම් දිස්ත්‍රික්කයේ අවතැන් වූ ජනතාවගේ ආහාර සුරක්ෂිතතාව තහවුරු කිරීම සඳහා සහය වීම** | 40 | 60.14 | 44.594 | 76% |

| | | | | | |
|---|---|---|---|---|---|
| | උප එකතුව | **2056.847** | 1877.601 | 1532.46 | 81.6% |
| **13.** | සහල් අපනයන වැඩසටහන 2012 | - | 0.940 | 0.940 | 100% |
| | මුළු එකතුව | **2056.847** | **1878.541** | **1533.398** | **82%** |

2012 වර්ෂයේ දී ක්‍රියාත්මක කළ සියළුම සංවර්ධන වැඩසටහන් මහින්ද චින්තන ඉදිරි දැක්ම අනුව යමින් රටේ කෘෂිකාර්මික උන්නතිය සඳහා සෘජු දායකත්වයක් ලබා දෙන ලදී.එහිදී වැඩසටහන් අනුව ලබා ගත් භෞතික ප්‍රගතිය පහත පරිදි දක්වා ඇත.

## 01. "අපි වවමු - රට නඟමු" විශේෂ කෘෂි සංවර්ධන වැඩසටහන

වගා කළ හැකි සෑම බිම් අඟලක්ම වගා කිරීමේ ජාතික කෘෂිකර්ම ප්‍රතිපත්තිය ඉලක්ක කර ගනිමින්,දේශීයව නිපදවිය හැකි ආහාර ද්‍රව්‍ය වැඩි වශයෙන් නිපදවමින්,ආනයන සීමාකර පිටරටට ගලායන විදේශ විනිමය ඉතිරිකිරීමේ අරමුණින්,කෙටි කාලීන හා මධ්‍ය කාලීන උපාය මාර්ග අනුගමනය කර දේශීය ආහාර නිෂ්පාදනය දිරිගැන්වීම සඳහා ක්‍රියාත්මක වූ අපි වවමු - රට නඟමු විශේෂ සංවර්ධන වැඩසටහන යටතේ ක්‍රියාත්මක වූ විවිධ උප වැඩසටහන් /ව්‍යාපෘති වල 2012 ප්‍රගතියක් පහත දක්වා ඇත.

2012 වර්ෂයේ අපිවවමු -රට නගමු වැඩසටහන සඳහා රු.මි. 460 ක ප්‍රතිපාදන වෙන් වූ අතර 68 %ක මූල්‍ය ප්‍රගතියක් අත්කර ගෙන ඇත.

### 1.ආදර්ශ ගම්මාන වැඩසටහන

අපි වවමු රට නගමු වැඩසටහන මගින් 2012 වර්ෂය සඳහා රුපියල් මිලියන 5.5ක් වෙන්කර තිබූ අතර, රුපියල් මිලියන 3.76ක මුදලක් වැයකර ඇත.

ශ්‍රී ලංකා හදබිම අධිකාරියට වෙන් කෙරෙණු රුපියල් මිලියන 2.5 න් රුපියල් මිලියන 1.69ක් වැය කර නුවරඑළිය දිස්ත්‍රික්කයේ වලපනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කන්දයාය ගම්මානයේ ගොවි පවුල් 350ක් තෝරාගෙන ඔවුන් පාංශු සංරක්ෂණය හා ජල කළමණාකරණය පිළිබඳ පුහුණු කර ඇත

පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනය මගින් ඔවුන් වෙත වෙන් කර ඇති රුපියල් මිලියන 3ක මුදලින් රුපියල් මිලියන 2.06 ක් වැය කොට ඇත. කුරුණෑගල, පොළොන්නරුව , නුවරඑළිය , ගාල්ල , අම්පාර හා මාතර යන දිස්ත්‍රික්ක වලින් මෙම ගම්මාන තෝරාගෙන ඇති අතර ආහාර සුරක්ෂිතතාවය හා පශ්චාත් අස්වැන්න පිළිබඳ පුහුණු වැඩසටහන් අපේක්ෂිත මට්ටමට සිදුකර උපකරණ කට්ටල ඔවුන් අතර බෙදා දී ඇත.

### 2.ප්‍රජා මූලික බීජ නිෂ්පාදන ගම්මාන පිහිටුවීමේ ව්‍යාපෘතිය

2012 වර්ෂය තුළදී ප්‍රජා මූලික බීජ නිෂ්පාදන ගම්මාන පිහිටුවීම සඳහා කෘෂිකර්ම අමාත්‍යාංශය මගින් රුපියල් මිලියන 35ක මුදලක් වෙන් වූ අතර, රුපියල් මිලියන 19.61ක් වියදම් කර ඇත. මේ යටතේ ඌව හා බස්නාහිර පළාත් හැර සෙසු පළාත් හතෙහි බීජ ගම්මාන 46ක් පිහිටුවා ඇත. අත්කරගෙන ඇති භෞතික ප්‍රගතිය අතර,මිරිස් බීජ කි.ග්‍රෑම් 900නිෂ්පාදනය කර ඇත.හෙක්ටයාර 496 ක් පමණ මිරිස් අස්වැන්න නෙළන අවධියේ ඇත. රටකජු බීජ කි.ග්‍රෑම් 25,000 නිෂ්පාදනය කර ඇත.බීජ අර්තාපල් කි.ග්‍රෑම් 26,900 ක් නිෂ්පාදනය කර ඇති අතර, $G_0$ ,$G_1$, $G_2$,$G_3$ බීජ නිෂ්පාදනය කර ගොවීන් අතර බෙදා දීමට කටයුතු කර ඇත. රතුළූණු සත්‍ය බීජ කි.ග්‍රෑම් 300 ක් නිෂ්පාදනය කර තිබේ. රතුළූණු බල්බ බීජ මෙ.ටො 144.5 ක් නිෂ්පාදනය කර ඇත.

## 3.අවාරයේ සහ නව ප්‍රදේශ වල රතු ළූණු හා ලොකු ළූණු වගාව ව්‍යාප්ත කිරිමේ වැඩසටහන





අවාරයේ සහ නව ප්‍රදේශ වල රතු ළූණු හා ලොකු ළූණු වගාව ව්‍යාප්ත කිරිමේ වැඩසටහනෙහි ප්‍රධාන අරමුණු වනුයේ අප රටෙහි රතු ළූණු හා ලොකු ළූණු අවශ්‍යතාවය දේශීයව සම්පූර්ණ කිරීමත් වසර පුරා අඛණ්ඩ සැපයීමක් පවත්වාගෙන යාමයි. වසර 03ක් තුල ක්‍රියාත්මක කිරිමට නියමිත මෙම වැඩසටහන 2010 හා 2011 වසර වලදී බස්නාහිර පළාත හැර සියළුම පළාත් තුළ ආදර්ශන මට්ටමින් ක්‍රියාත්මක විය. 2012 වර්ෂයේදි මුළු ව්‍යාපෘතිය සඳහා රු.මි. 20 ක් වෙන් කර තිබූ අතර, රුපියල් මිලියන 12.27ක මුදලක් 2012 වර්ෂය තුළ වැය කර ඇත. ඒ යටතේ තෝරාගත් ප්‍රතිලාභින් හට බීජ ලබාදිම, දැනුවත් කිරිම් හා පුහුණු පන්ති පැවැත්වීම සිදු කර ඇත.එමෙන්ම රතු ළූණු අක්කර ½ බිම් කොටස් 178ක් හා ලොකු ළූණු අක්කර ½ බිම් කොටස් 548ක් වගා කරන ලදි.

හම්බන්තොට දිස්ත්‍රික්කයේ අවාරයේ ලොකු ළූණු වගාව සඳහා අක්කරයකට මෙ.ටො 17ක් සහ යාපනය දිස්ත්‍රික්කයේ අවාරයේ රතු ළූණු වගාව සඳහා අක්කරයකට මෙ.ටො 20 ක සාමාන්‍ය අස්වැන්නක් ලබාගෙන ඇත.

## 4.දියගම මහින්ද රාජපක්ෂ ජාත්‍යන්තර ක්‍රීඩා සංකීර්ණයේ පරිසර හිතකාමී කෘෂිබෝග පද්ධතියක් ස්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය

ව්‍යාපෘතියට ගතවන කාලය වසර 02ක් වන අතර (2012 – 2013) අවශ්‍ය සමස්ත ප්‍රතිපාදනය රුපියල් මිලියන 65කි. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ හෝමාගම පළතුරු සංවර්ධන හා පර්යේෂණ අධ්‍යක්ෂ කාර්යාලයේ මූලිකත්වයෙන් හා යුධ හමුදාවේ සම්බන්ධීකරණයෙන් ක්‍රියාත්මක වන මෙම වැඩසටහන සඳහා 2012 වසරට වෙන්කර තිබූ මුළු මුදල රුපියල් මිලියන 25 කි.







**පරිසර හිතකාමී කෘෂි බෝග පද්ධතිය**

2012 වර්ෂය අවසන් වන විට රුපියල් මිලියන 15.22ක මූල්‍ය ප්‍රගතියක් අත්කරගෙන ඇත. ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් අතර සූර්ය කෝෂ විද්‍යුත් ශක්තිය උපදවා ප්‍රයෝජනයට ගැනීම, බින්දු ජල සම්පාදන පද්ධතියක් ස්ථාපනය කිරීම, ක්‍රීඩා භූමියට ගැළපෙන අන්දමේ භූමි අලංකරණය, සම්පත් ප්‍රතිචක්‍රිකරණය, ශ්‍රව්‍ය-දෘශ්‍ය ඒකකයක් හා අලෙවි පියසක් පිහිටුවීම,විවිධ වර්ගයේ පළතුරු මිශ්‍ර උයනක් ඇති කිරීම, ජීව වායු ඒකකයක් හා ගව ගාලක් පිහිටුවීම දැනට සිදුකර ඇත.

2013 වසරේද මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමට යෝජිත අතර, ඒ සඳහා වෙන් කර ඇති මුළු මුදල රුපියල් මිලියන 10 කි.

## 5. මල් හට ගැන්වීම උත්තේජනය කිරීම මඟින් අඹ හා දූරියන් ඵලදාව ඉහළ නැංවීමේ ව්‍යාපෘතිය

අඹ හා දූරියන් වල අස්වැන්න 40%කින් වැඩි කිරීමේ අරමුණ ඇතිව රුපියල් මිලියන 1.12 ක ප්‍රතිපාදන වෙන්කර තිබුනි. 2012 වර්ෂය තුල රුපියල් මිලියන 1.11 ක් වැය කර ඇත. මෙම ව්‍යාපෘතිය මහනුවර දිස්ත්‍රික්කය ප්‍රධාන කොටගෙන ආරම්භ කළ අතර, මේ වන විට එය මාතලේ දිස්ත්‍රික්කය තුළද ක්‍රියාත්මක කර ඇත.මෙම ප්‍රතිකර්මය ගස් 2,600 කට පමණ සිදුකර ඇත. මේ වන විට අඹ , දූරියන් ගස් 1,100 ක පමණ මල් හටගැනීම සිදුවී ඇත. ව්‍යාපෘතිය පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන් 10 ක් පවත්වා ඇත. වැඩසටහන පිළිබඳව දැනුවත් කිරීම සඳහා රූපවාහිනී වැඩසටහනක් 03ක්ද ගුවන්විදුලි වැඩසටහන් 5 ක් හා පුවත්පත් දැන්වීම් 4 ක් පල කොට ඇත. ඊට අමතර ක්ෂේත්‍ර දින වැඩමුළු 2 ක් සිදු කර ඇති අතර අත් පත්‍රිකා 5000 ක් පමණ මුද්‍රණය කර බෙදාහැර ඇත.



වැඩි පලතුරු අස්වැන්නක් -දූරියන්



නියමිත කප්පාදු ක්‍රම අනුගමනය - අඹ

## 6.කාබන්ඩයොක්සයිඩ් වායුව අධික පරිසරයක හරිතාගාර වගාවන් සිදු කිරීමට නව තාක්ෂණය හඳුන්වා දීම.

මේ සඳහා රුපියල් මිලියන 2.32 ක මුදලක් වෙන්කර තිබූ අතර රුපියල් මිලියන1.94 ක් වැය කොට ඇත. කාබන්ඩයොක්සයිඩ් වායුව වැඩි පරිසරයක තක්කාලි, ස්ට්‍රෝබෙරි හා අර්තාපල් ක්ෂුද්‍ර බීජ නිෂ්පාදනය සිදුකිරීම සඳහා යොදා ගැනීමට ගන්නෝරුව, බණ්ඩාරවෙල හා සීතාඑළිය යන ප්‍රදේශවල නව හරිතාගාර ඉදි කිරීමත් තිබෙන හරිතාගාර අළුත්වැඩියා කිරීමත් සඳහා උපකරණ මිලදී ගැනීමක් සිදු කොට ඇත. දැනට ලැබී ඇති ප්‍රතිඵල අනුව තක්කාලිවල ඉක්මන් එල දැරීම හා වැඩි අස්වැන්නක් නිරීක්ෂණය වී තිබේ.

## 7.පහත රට තෙත් කළාපයේ කුඹුරු ඉඩම් වල ඵලදායිතාවය ඉහල නැංවීම.

පහතරට තෙත් කලාපයේ කුඹුරු ඉඩම් වල අස්වැන්න අඩු වීමට හේතු පිළිබඳ අධ්‍යනයක් කිරිමට හා එම හේතු මග හරවා ගෙන කලාපයේ අස්වැන්න ඉහල දැම්ම සඳහා යෝග්‍ය ප්‍රායෝගික වැඩ පිළිවෙළක් ඉදිරිපත් කිරිම මඟින් ගොවි ජනතාවගේ ජීවන තත්වය නඟා සිටුවිම මෙම වැඩසටහනෙහි අරමුණ වේ.මෙම ව්‍යාපෘතිය සඳහා 2012 වර්ෂයට රුපියල්

මිලියන 5ක් වෙන් වූ අතර රුපියල් මිලියන 1.95 ක් වැය කර ඇත. මෙම ව්‍යාපෘතිය කොළඹ, ගම්පහ, කළුතර ගාල්ල, මාතර, රත්නපුර, කෑගල්ල යන දිස්ත්‍රික්ක තුල ක්‍රියාත්මක කිරිමට සැළසුම් කර ඇති අතර එම දිස්ත්‍රික්කවල මූලික සමීක්ෂණ කටයුතු අවසන් කර ඇත.බිත්තර වී ගම්මානයක් පිහිටුවා ඇති අතර, වී ප්‍රභේද 12 ක් බෙදා හැර ඇත. පත්‍ර වර්ණ දර්ශක 400ක් පමණ ගොවීන් අතර බෙදා දී ඇත. පුහුණු පන්ති 09 ක් පවත්වා ඇත.

## 8.පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනය මගින් ක්‍රියාත්මක කරන වැඩසටහන්

| වැඩසටහන | වෙන් කල මුදල (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය |
|---|---|---|
| i.පසු අස්වනු හානිය අවම කිරීම සඳහා ඇසුරුම් ගෘහ තාක්ෂණ ස්ථාපනය කිරීම | 1.9 | 40.18% |
| ii.නව පලතුරු එළවළු අලෙවිසැල් දිස්ත්‍රික් මට්ටමින් ප්‍රචලිත කිරීමේ ව්‍යාපෘතිය | 0.72 | 20.91% |
| iii.රයිස්ක්‍රීම් මැෂින් දිස්ත්‍රික් මට්ටමින් ලබා දීම | 1.0 | 28.57% |

## 9. clinical trials

<u>විශ්ව විද්‍යාල කෘෂිකර්ම සංවර්ධනය සඳහා දායක කර ගැනීම</u>

| ව්‍යාපෘතිය | විශ්ව විද්‍යාලය | වෙන් කල මුදල (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය (රු.මි.) |
|---|---|---|---|
| **1. පසු අස්වනු හානි අවම කිරීම සහ නිෂ්පාදන වලට අගය එකතු කිරීම *** | **රුහුණු විශ්ව විද්‍යාලය** | **1.1** | **0.39** |
| **2.බදුල්ල දිස්ත්‍රික්කයේ උද්‍යාන භෝග වගාවේදී අනුගමනය කළ යුතු යෝග ක්‍රම හා විධි ප්‍රවර්ධනය කිරීම.** | **ඌව-වෙල්ලස්ස විශ්ව විද්‍යාලය** | **1.0** | **0.4** |
| **3.කුරුඳු වල ඖෂධීය ගුණය සනාථ කිරීමේ ව්‍යාපෘතිය** | **පේරාදෙනිය විශ්ව විද්‍යාලය** | **5.0** | **0.34** |

*මෙම ව්‍යාපෘතිය යටතේ වාෂ්පීකරණ සිසිලනයක් 06 ක් සාදා නිම කර ඇති අතර ඒවායේ පර්යේෂණ ආරම්භ කර ඇත.

## 10.ගොවිපළ සංවර්ධන වැඩසටහන

ගොවිපළ සංවර්ධන වැඩසටහන 2012 සඳහා රු.මි. **83.925** ක් පහත සඳහන් ආයතන පහ යටතේ ඇති ගොවිපලවල් 40 කට ආසන්න ප්‍රමාණයක් සඳහා ලබාදී ඇති අතර, එහි 2012 වසරේ මූල්‍ය ප්‍රගතිය පහත දැක්වේ.

| | ගොවිපල් අයත් ආයතන | ඇස්තමේන්තු මුදල (රු.මි.) | වියදම් වූ මුදල(රු.මි.) | 2012 වසරට අදාල මූල්‍ය ප්‍රගතිය |
|---|---|---|---|---|
| **01.** | සහල් පර්යේෂණ හා සංවර්ධන ආයතනය | 9.64 | 8.514 | 88% |
| **02.** | බීජ සහතික කිරීමේ | 3.01 | 1.685 | 56% |

| | | | | |
|---|---|---|---|---|
| | මධ්‍යස්ථානය | | | |
| 03. | ක්ෂේත්‍රබෝග පර්යේෂණ සංවර්ධන ආයතනය බීජ සහතික කිරීමේ මධ්‍යස්ථානය | 26.50 | 26.015 | 93% |
| 04. | ව්‍යාප්ති හා පුහුණු මධ්‍යස්ථානය | 17.20 | 17.154 | 98% |
| 05. | උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය | 27.575 | 25.973 | 91% |
| | **මුළු මුදල** | **83.925** | **79.341** | **92 %** |

## 11.අතිරේක ආහාර බෝග නිෂ්පාදන වැඩසටහන

දේශීය පරිභෝජනයට අවශ්‍ය අතිරේක ආහාර බෝග ආනයනය සීමා කිරීමේ අරමුණින් ක්‍රියාත්මක කළ මෙම වැඩසටහන දිවයිනේ සියලුම දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි 2012 වසර තුළ ක්‍රියාත්මක විය. මේ යටතේ රු.මි. 163.75 ක් වෙන් කළ අතර, ඉන් රු.මි. 83.77 ක් වියදම් දරා ඇත.

මෙම වැඩසටහන යටතේ මුං ඇට, කව්පි,රටකජු, තල,මිරිස්,බඩඉරිඟු,කුරක්කන්,උඳු,සෝයා බෝංචි,අර්තාපල් යන බෝග වගා කිරීම සඳහා ගොවීන්ට අවශ්‍ය බීජ හා රෝපණ ද්‍රව්‍ය, ජල සම්පාදන පද්ධති (ස්ප්‍රින්ක්ලර්), ටාපෝලින් ලබාදීම හා ගොවීන් පුහුණු කිරීම සිදුකර ඇත. මෙම වැඩසටහන මඟින් ගොවීන් 2566 ක් පුහුණු කර ඇති අතර, හෙක්ටයාර් 6113 ක අතිරේක ආහාර බෝග වගා කර ඇත.ස්ප්‍රින්ක්ලර් ජලසම්පාදන පද්ධති 65ක් පමණ ස්ථාපනය කර ඇත. අර්තාපල් බීජ නිෂ්පාදනය සඳහා නුවරඑළිය හා බදුල්ල දිස්ත්‍රික්කවල පොලිතීන් ගෘහ ඉදිකර ඇත.

## 12.පලතුරු බෝග නිෂ්පාදන වැඩසටහන

පළතුරු නිෂ්පාදනය ඉහල නැංවීමේ අරමුණින් 2012 වසර තුළ ක්‍රියාත්මක කළ මෙම වැඩසටහන සඳහා රු. මිලි. 26ක් වෙන්කල අතර ඒ යටතේ අඹ, අන්නාසි,කෙසෙල්, ගස්ලබු, දොඩම්, අලිගැට පේර, දෙලුම්, මිදි හා පැෂන් ෆෘට් වගා පුනරුත්ථාපනයට හා නව වගා පිහිටුවීමට අවශ්‍ය රෝපණ ද්‍රව්‍ය හා ආධාර ලබාදීම සිදුකර ඇත.

අන්නාසි වගා වැඩසටහන යටතේ රු.මි. 13 ක් වැයකරමින් දිස්ත්‍රික්ක 10ක අන්නාසි වගා වැඩසටහන ක්‍රියාත්මක කර ඇති අතර පලතුරු බෝග නිෂ්පාදන වැඩසටහන සඳහා රු.මි. 23.6 ක් වැයකර ඇත.

## 13.විශේෂ කෘෂිකර්ම වැඩසටහන

මෙම වැඩසටහන සඳහා රු.මි. 5.65 ක් වෙන්කළ අතර ඒ යටතේ පුදුකුඩිඉරුප්පු ප්‍රදේශයේ හඳුනාගත් ගොවිපවුල් වෙත කෘෂි උපකරණ ලබා දීම,මාතර ගොඩගම යාය සංවර්ධනය හා පලතුරු පැළ ලබා දීම සඳහා රු.මි. 5.644 ක් වැයකර ඇත.

## 14.මාධ්‍ය වැඩසටහන්

මාධ්‍ය වැඩසටහන් සඳහා රු.මි. 7.25 ක් වෙන් වු අතර මූල්‍ය ප්‍රගතිය රු.මි. 6.076 කි.ගොවි ගෙදරින් මහගෙදරට ගුවන් විදුලි වැඩසටහන් 36 ක් ද, රන්අටුව රූපවාහිනී වැඩසටහන් 36 ක් ද, විකාශනය කෙරුණි.කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතේ නිෂ්පාදනය වු මේ

සියළු වැඩසටහන් ජනතාව අතර කෘෂිකර්මාන්තය පිළිබඳ නව පිබිදීමක් ඇති කිරීමට ඉවහල් විය.

## 15.පළිබෝධනාශක භාවිතය අවම කිරීම

| වැඩසටහන | අනුමත මුදල (රු.මි) | මූල්‍ය ප්‍රගතිය (රු.මි) | මූල්‍ය ප්‍රගතියේ ප්‍රතිශතය | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|
| **පළිබෝධ නාශක භාවිතය අවම කිරීම.** | 5.3 | **3.6** | 68% | කෘෂි රසායන අලෙවිය හා තාක්ෂණ සහායකයන් සඳහා පුහුණු පාඨමාලා පවත්වන ලදී. |

## 16. අතිරේක ආහාර බෝග නිෂ්පාදන කඩිනම් වැඩසටහන -පළාත්

| පළාත | අනුමත මුදල (රු.මි) | මූල්‍ය ප්‍රගතිය (රු.මි) | මූල්‍ය ප්‍රගතියේ ප්‍රතිශතය | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|
| උතුර | 2.00 | **1.77** | 88% | උඳු , රටකජු, කුරක්කන් බීජ මිළදී ගෙන ඇත. ප්‍රතිලාභීන් තෝරා ඇත. |
| මධ්‍යම | 2.00 | **0.2** | 100% | රඹුටන්,අඹ,ඩ්‍රැගන්ෆෲට්,අලිගැට පේර,දූරියන්,දෙහි,පැෂන්ෆෲට්, පෙයාර්ස්,කෙසෙල් ඉලක්ක ගත හෙක්ටයාර් ප්‍රමාණයම වගා කර ඇත. |
| වයඹ | 2.00 | **1.93** | 97% | බඩ ඉරිඟු, මුං,රටකජු බීජ මිළදී ගෙන ඇත. |
| උතුරු මැද | 2.00 | **1.1** | 55% | කව්පි, තල, කුරක්කන්, මිරිස් වගා කරමින් වැඩසටහන ක්‍රියාත්මක කර ඇත. |
| නැගෙනහිර | 2.00 | **1.99** | 99.9% | මුං , උඳු , රටකජු, කව්පි බීජ මිළදී ගෙන ඇත. |
| සබරගමුව | 1.87 | **1.78** | 96% | බීජ යෙදවුම් සැපයීම බඩ ඉරිගු මුං රතුළූනු වගා සිදු කර ඇත. |
| ඌව | 2.00 | **1.97** | 99% | මුං තල වියලි මිරිස් රතු ළූනු කව්පි සෝයා වගා කරමින් වැඩසටහන ක්‍රියාත්මක කර ඇත. |
| බස්නාහිර | 2.00 | **1.72** | 86% | කොම්පෝස්ට් පොහොර කොහොඹ කෘමිනාශක හා පැල ලබා දී ඇත. |
| දකුණ | 2.00 | **0.83** | 84% | අක්කර 40 ක් වගා කර ඇත.පුහුණු පංති 16 ක් පවත්වා ඇත.<br>වතුර පොම්ප 9 ක් නිකුත් කර ඇත. |

## 17.හදබිම අධිකාරිය මගින් ක්‍රියාත්මක කරන වැඩසටහන්

| ව්‍යාපෘතිය | විස්තරය | අනුමත මුදල (රු.මි.) | වැය වූ මුදල (රු.මි.) |
|---|---|---|---|
| i.සමෝදානික කෘෂි ඉඩම් සංවර්ධන ව්‍යාපෘතිය | වලපනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සජීවිකාරකයින් පුහුණු කර කෘෂි උපකරණ ලබාදී කාබනික පොහොර නිෂ්පාදන වැඩසටහනක් ආරම්භ කිරීම. | 2.5 | 1.67 |
| ii.අතිරේක ආහාර භෝග විශේෂීකරණ වැඩසටහන (මොණරාගල දිස්ත්‍රික්කය) | තාක්ෂණික පුහුණුව,කෘෂි උපකරණ හා බීජ හා යෙදවුම් ලබාදී අතිරේක ආහාර බෝග වගාව ව්‍යාප්ත කිරීමට කටයුතු යොදා ඇත. | 7.25 | 4.56 |
| iii.රණවිරු සහභාගිත්ව හා භෝග ඵලදායිතා වැඩසටහන | මහනුවර,මුලතිව්,වව්නියා,අනුරාධපුර,කිලිනොච්චි,යාපනය හා පොළොන්නරුව යන දිස්ත්‍රික්ක වල හමුදා කඳවුරු 30 ක් සඳහා අවශ්‍ය කෘෂි උපකරණ ලබාදී කඳවුරු භූමියේ වගා කටයුතු සඳහා උනන්දු කිරීම. | 11.35 | 2.29 |

## 18. ජාතික ආහාර ප්‍රවර්ධන මණ්ඩලය මගින් ක්‍රියාත්මක කරන වැඩසටහන්

| වැඩසටහන | විස්තරය | අනුමත මුදල (රු.මි.) | වැය වූ මුදල (රු.මි.) |
|---|---|---|---|
| i.දේශීය ආහාර ප්‍රචලිත කිරීමේ වැඩසටහන | දේශීය ආහාර ප්‍රචලිත කිරීමේ වැඩසටහන යටතේ වැඩමුළු 30 ක් පවත්වා සහභාගී වූවන් සඳහා ස්වපෝෂ හා සහල් පිටි පැකට් 01 බැගින් බෙදාදීම | 2.99 | 1.20 |
| ii. බුත්තල ගොවිපල සංවර්ධනය කිරීමේ වැඩසටහන | ගොවිපල සංවර්ධනය කිරීම යටතේ මිරිස්,දොඩම්,අඹ හා පැපොල් වගා කිරීම. | 3.23 | 1.40 |
| iii.තණමල්විල ගොවිපල සංවර්ධනය කිරීමේ වැඩසටහන | සාම්ප්‍රදායික වී වගාව ප්‍රධාන වශයෙන් සිදුකරන ලද අතර, මිරිස් පැපොල් වගා කිරීම සිදුකර ඇත. | 3.23 | 1.40 |
| iv.වඩ්ඩකච්චි ගොවිපල සංවර්ධනය කිරීමේ වැඩසටහන | ගොවිපල සංවර්ධනය කිරීම යටතේ වගා ලිඳක් සාදා මිරිස් හා වී වගාව සිදුකර ඇත. | 6.97 | 4.9 |

## 2.පාංශු සංරක්ෂණ පනත ක්‍රියාවට නැංවීමේ වැඩසටහන

පාංශු ඛාදනය හේතුවෙන් පසට සිදුවන හානි අවම කිරීමේ අරමුණෙන් ස්ථාපනය කරන ලද 1951 අංක : 25 දරණ පාංශු සංරක්ෂණ පනත ක්‍රියාවට නැංවීම මගින් ශ්‍රී ලංකාවේ පාංශු

ඛාදනය අවම කිරීමත් එමගින් ඉඩම්වල ඵලදායිතාව වැඩි කර කෘෂිකාර්මික ඵලදායිතාව ඉහළ නැංවීමත් මෙම වැඩසටහනේ අරමුණ වේ.

පාංශු සංරක්ෂණ වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ දී ශ්‍රී ලංකාවේ පාංශු ඛාදනයට වැඩි නැඹුරුවක් ඇති පළාත් වලට වැඩි අවධානයක් යොමු කරනු ලැබේ. මේ අනුව ඌව, සබරගමුව, මධ්‍යම, වයඹ, දකුණ හා බස්නාහිර පළාත් වලට අයත් දිස්ත්‍රික්ක වල පාංශු ඛාදනයට ලක් වන ගොවි බිම් හඳුනා ගෙන ගොවීන්ගේ දායකත්වය ඇතිව සංරක්ෂණ ක්‍රම මඟින් ඉඩම් සංවර්ධනය කිරීමත්, සංවර්ධනය කළ ඉඩම්වල බෝග වගා කිරීමත්, පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීමත් සඳහා පාංශු සංරක්ෂණ පනත ක්‍රියාවට නැංවීමේ වැය ශීර්ෂය යටතේ මුදල් ප්‍රතිපාදන වෙන් කරනු ලැබේ.

2012 වසරේ දී මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා රු.මි.14.8 ක ප්‍රතිපාදනයක් වෙන් කරන ලද අතර මෙම ප්‍රතිපාදන උපයෝගී කරගෙන පළාත් 06 කට අයත් දිස්ත්‍රික්ක වල පාංශු සංරක්ෂණ කටයුතු සැලසුම් කරන ලදි. ඒ අනුව ගොවිබිම් අක්කර 700 ක් පාංශු සංරක්ෂණය කිරීම, ගොවීන් පුහුණු කිරීම, පාංශු සංරක්ෂණ ආදර්ශන පිහිටුවීම, බීජ හා රෝපණ ද්‍රව්‍ය, උපකරණ ලබා දීම, ප්‍රචාරක වැඩසටහන් ක්‍රියාත්මක කිරීම ආදී කටයුතු සැලසුම් කරන ලදි.



ගල්වැටි - දැරණියගල



ජීව වැටි - පිටබැද්දර

මෙම සංවර්ධන කටයුතු දිස්ත්‍රික් ලේකම් කාර්යාල, පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව හා කෘෂිකර්ම දෙපාර්තමේන්තුව යන ආයතන මගින් ක්‍රියාත්මක කරන ලදි. මේ වැඩසටහන 2012 වසර අවසන් වන විට රුපියල් මිලියන 10.2 ක මූල්‍ය ප්‍රගතියක් අත්කර ගෙන ඇති අතර ඉඩම් අක්කර 500 ක පාංශු සංරක්ෂණ කටයුතු සම්පූර්ණ කර ඇත.

## 3.ක්ෂුද්‍ර ජල සම්පාදන හා වැසි ජල සංරක්ෂණ වැඩසටහන

වියළි කලාපීය ජල හිඟයට විකල්ප පිළියමක් ලෙස වර්ෂා ජලය එක්රැස් කර බෝග නඩත්තුව සහ පානීය ජල අවශ්‍යතාවය සපුරා ගැනීමට ගොවි ප්‍රජාව දිරි ගැන්වීම තුළින් ග්‍රාමීය ජන ජීවිතය සුරක්ෂිත කිරීම හා දිළිඳුකම තුරන් කිරීමට දායක වීමේ අරමුණු ඇතිව මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වේ. මේ සඳහා ක්ෂුද්‍ර ජල සම්පාදනය වැසි ජල සංරක්ෂණ වැය ශීර්ෂය යටතේ මුදල් ලබාදෙන අතර එම මුදල් යොදාගෙන ජල හිඟ ප්‍රදේශවල වර්ෂා ජලය රැස්කිරීමේ ටැංකි ඉදි කිරීම, පොකුණු ඉදි කිරීම, වර්ෂා ජල සංරක්ෂණ ආදර්ශණ පිහිටුවීම, ක්ෂුද්‍ර ජල සම්පාදන කට්ටල 50% ගොවි දායකත්වය යටතේ ලබා දී ඒවා ස්ථාපනය, එළවළු හා පලතුරු වගා සංවර්ධනය,ගොවීන් දැනුවත් කිරීම හා ගෙවතු සංවර්ධනය කිරීම සිදු කෙරේ.





උතුරු මැද පළාතේ ක්ෂුද්‍ර ජල සම්පාදන ආදර්ශන

2012 වසර සඳහා රු.මි 2.8 ක් ක්ෂුද්‍ර ජල සම්පාදනය සඳහා ද, රු.මි.2.4 ක් වැසි ජල කළමනාකරණ වැඩසටහන සඳහා ද වෙන් කළ අතර, එමගින් නැගෙනහිර හා දකුණු පළාත්වලට අයත් දිස්ත්‍රික් ලේකම් කාර්යාල සහ පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තු මඟින් වර්ෂා ජලය සංරක්ෂණය කළයුතු හා ජල හිඟ ප්‍රදේශවල වර්ෂා ජල කළමනාකරණය සඳහා ගොවීන් පුහුණු කිරිම, වර්ෂා ජල ටැංකි සහ පොකුණු ඉදි කිරීම සහ ක්ෂුද්‍ර ජල සම්පාදන පද්ධති පිහිටුවීමෙන් එළවළු හා පලතුරු වගා බිම් සංවර්ධනය කිරීම සිදු කොට ඇත. ක්ෂුද්‍ර ජල සම්පාදන වැඩසටහන යටතේ 2012 වසර අවසන් වන විට පුහුණු වැඩමුළු 20 ක් පවත්වා ඇති අතර, ක්ෂුද්‍ර ජල සම්පාදන කට්ටල 40 ක් ගොවි බිම්වල ස්ථාපිත කර ඇත. මෙම ව්‍යාපෘතිය යටතේ රු.මි.2.8 ක වියදමක් දරා ඇති අතර 100% ක ප්‍රගතියක් දක්වා ඇත.වැසි ජල කළමනාකරණ ව්‍යාපෘතිය යටතේ 2012 වසර අවසන් වන විට වැසි ජල ටැංකි 17ක් ඉදි කර ඇති අතර 2007,2008 සහ 2009 වර්ෂවල ඉදි කරන ලද වැසි ජල පොකුණු යටතේ අක්කර 38.25 ක් පුනරුත්ථාපනය කර ඇත. පුහුණු වැඩමුළු 21 ක් පවත්වා ඇති අතර අක්.27.5 ක් සඳහා බීජ හා රෝපණ ද්‍රව්‍ය ලබා දී ගෙවතු අක්. 27.5 ක් සංවර්ධනය කර ඇත. මෙම වැඩසටහන යටතේ රු.මි.1.48 ක වියදමක් දරා ඇති අතර 61.67% ක මූල්‍ය ප්‍රගතියක් ලබා ඇත .

## 4.වියළි කලාපීය ජීවනෝපායන් සඳහා සහාය වීමේ හා හවුල්වීමේ වැඩසටහන(DZLISPP)

වියළි කලාපීය ජීවනෝපායන් සඳහා සහය වීමේ හා හවුල් වීමේ වැඩසටහන, කෘෂිකර්ම **අමාත්‍යාංශය** මගින් "කෘෂිකර්ම සංවර්ධනය සඳහා වන ජාත්‍යන්තර අරමුදල" (International Fund for Agriculture Development-IFAD) හි මූල්‍ය ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක වේ. ව්‍යාපෘති කටයුතු අධීක්ෂණය කරනු ලබන්නේ ලෝක බැංකුව විසිනි. මෙම ව්‍යාපෘතිය වසර 07 ක පමණ කාලයක් , එනම් 2005 දෙසැම්බර් සිට 2013 මාර්තු දක්වා ක්‍රියාත්මක අතර , ඒ සඳහා වෙන් කර ඇති මුදල රු .මි. 3000 ක් වන අතර 2012 අවසන් වන විට රු.මි.2730 ක (94%) ක ප්‍රගතියක් ලබා ඇත.අනුරාධපුර, කුරුණෑගල , බදුල්ල සහ මොණරාගල යන දිස්ත්‍රික්ක වල වියළි කලාපීය ප්‍රදේශ අයත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 44 ක ග්‍රාම නිලධාරී වසම් 1077 ක ග්‍රාමීය ගොවි ජනතාවගේ ජීවනෝපායන් දියුණු කිරීම මගින් ඔවුන්ගේ ආර්ථික ශක්තිය සහ ජීවන තත්ත්වය දියුණු කිරීමට කටයුතු කරනු ලැබේ.

2012 වර්ෂය සඳහා රු.මි. 573 ක් වෙන්කර තිබුණු අතර වර්ෂය අවසානයේ මූල්‍ය වියදම රු. මි 516 කි . ඒ අනුව 90% ක මූල්‍ය ප්‍රගතියක් අත් කර ගෙන ඇත. මෙහිදී මහා භාණ්ඩාගාරය වෙතින් තවත් රු.මි.40 ක් අදාල වර්ෂය සඳහා ලබා දිය යුතුව ඇත.

**මෙම ව්‍යාපෘතිය මගින් සංරචක 05 ක් යටතේ වූ ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කර ඇත. එනම්,**

1. උස් බිම් කෘෂිකර්ම සංවර්ධනය හා සත්ව පාලනය
2. සුළු වාරි මාර්ග පුනුරුත්ථාපනය සහ ජල කළමණාකරනය
3. ප්‍රජා යටිතල පහසුකම් සංවර්ධනය
4. සුළු මූල්‍ය හා ආදායම් උත්පාදනය
5. අලෙවි කටයුතු ප්‍රවර්ධනය කිරීම

<u>ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රගතිය</u>

| සංරචකය | 2012 මූල්‍ය ප්‍රගතිය | සමුච්චිත මූල්‍ය ප්‍රගතිය (2012.12.31 දක්වා ) |
|---|---|---|

| | ප්‍රතිපාදන (රු.මි.) | වියදම (රු.මි.) | % | ප්‍රතිපාදන (රු.මි.) | වියදම (රු.මි.) | % |
|---|---|---|---|---|---|---|
| 1. උස්බිම් කෘෂිකර්ම සංවර්ධනය හා සත්ව පාලනය | 69 | 69 | 99% | 380 | 368.2 | 97% |
| 2. සුළු වාරි මාර්ග පුනුරුත්ථාපනය සහ ජල කළමණාකරනය | 60 | 60 | 99% | 488 | 462.4 | 95% |
| 3. ප්‍රජා යටිතල පහසුකම් සංවර්ධනය | 90 | 88 | 98% | 740 | 729.3 | 99% |
| 4. සුළු මූල්‍ය හා ආදායම් උත්පාදනය | 74 | 73 | 99% | 275 | 274.4 | 100% |
| 5. අලෙවි කටයුතු ප්‍රවර්ධනය කිරීම | 140 | 110 | 76% | 320 | 250.7 | 78% |
| 6. ව්‍යාපෘති කළමණාකරනය | 127 | 117 | 95% | 686 | 615 | 90% |
| 7. ඉඩම් භුක්තිය පිළිබඳ අධ්‍යයනය | 13 | - | | 42 | 30 | 71% |
| එකතුව | 573 | 516 | 90% | 2891 | 2730 | 94% |

<u>ව්‍යාපෘතියෙන් ලද ප්‍රතිලාභ</u>

**1.උස්බිම් කෘෂිකර්ම සංවර්ධනය හා සත්ව පාලන දියුණු කිරීම.**

ක්ෂේත්‍ර පාසල් ක්‍රමවේදය මඟින් ක්‍රියාත්මක වන මෙම වැඩසටහන මඟින් බීජ නිෂ්පාදනය වැඩි දියුණු කිරීම, අස්වැන්න 25% කින් පමණ වැඩි කිරීම සහ අලෙවි සම්බන්ධතා තුලින් ආදායම් තත්වය වැඩි දියුණු කිරීම සිදු කරනු ලැබේ. 2012 වර්ෂයේදී කෘෂි බෝග ක්ෂේත්‍ර පාසල් 322 ක් පිහිටු වන ලද අතර, ප්‍රතිලාභීන් ගොවීන් සංඛ්‍යාව 3000 කට අධිකය. කිරිගව පාලන සමිති 104 ක් පිහිටුවන ලද අතර, ප්‍රතිලාභී ගොවීන් සංඛ්‍යාව 2080 කි. බීජ සංවර්ධන වැඩසටහන යටතේ ගොවීන් 7 දෙනෙකු ආරක්ෂිත ගෘහතුළ කන්නයකට නිෂ්පාදනය කරන $G_0$ බීජ අල භාවිතාකර විශේෂ ඉඩම්වල $G_1$ බීජ නිෂ්පාදනය කරයි. දැනට ගොවීන් 3000 ක් පමණ මෙම ක්‍රමය යටතේ බීජ අර්තාපල් ($G_1$ බීජ අල) ලබා ගන්නා අතර, එමඟින් අර්තාපල් නිෂ්පාදනය වියදම රු.52/- සිටරු. 23/- දක්වා අඩුවී ඇත.

  

බදුල්ල බීජ අර්තාපල් නිෂ්පාදනය

ක්ෂේත්‍ර පාසැල් සඳහා ගොවි සංසද විසින් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට බීජ සැපයීමේ වැඩසටහන යටතේ මොනරාගල, තෙලුල්ල සංසද විසින් රටකජු, මුං, කව්පී බීජ 40,000 කි.ග්‍රෑ. සැපයීම සිදුකර ඇත. කුරුණෑගල දිස්ත්‍රික් සංසදය විසින් රටකජු බීජ 100,000 කි.ග්‍රෑ. සැපයීමත් සිදුකර ඇත.

 

**2.සුළු වාරිමාර්ග පුනරුත්ථාපනය.**

ව්‍යාපෘතිය විසින් සුළු වාරි මාර්ග 708 ක් (වැව් 374 ක් සහ අමුණු 334) පුනරුත්ථාපනය කරන ලද අතර, එමගින් අක්කර 18,850 ක් පමණ වාරි ජල පහසුකම් සැපයීමට හැකිව තිබේ. වාරි කර්මාන්ත තෝරා ගැනීමේදී ඉතා දුෂ්කරව පිහිටි ,ත්‍රස්තවාදීබලපෑම් වලට යටත් ව තිබූ වාරි කර්මාන්ත සඳහා ප්‍රමුඛත්වයක් ලබා දුන් අතර, පුනරුත්ථාපනය කරන ලද වාරි කර්මාන්ත වලින් 51 ක්ම මින් පෙර අක්‍රීය තත්වයේ තිබීම විශේෂත්වයක්.මේ නිසා අක්කර 3,270 ක වගා බිම් ප්‍රමාණයේ වැඩි වීමක් දක්නට ලැබේ.

2012 වර්ෂයේ දී පමණක් වැව් අමුණු 56 ක් පුනරුත්ථාපනය කරන ලද අතර , මුළු සුළු වාරි මාර්ග වැඩි දියුණු කිරීම මඟින් ප්‍රතිලාභ ලැබූ ගොවීන් සංඛ්‍යාව 1700 කට අධිකය.පුනරුත්ථාපනයෙන් පසුව වාරි නඩත්තු අරමුදලක් පිහිටුවා නඩත්තු භාරකරුවෙකු පත් කර තිරසාර නඩත්තු ක්‍රමවේදයක් ආරම්භ කර ඇත.



පුනරුත්ථාපනය කරන ලද වැව් හා අමුණු කීපයක්

**3.ප්‍රජා යටිතල පහසුකම් සංවර්ධනය.**

ව්‍යාපෘති බල ප්‍රදේශ වල ජීවත් වන ග්‍රාමීය ප්‍රජාවගේ අවශ්‍යතාවය වන කෘෂි මාර්ග,පානීය ජල පහසුකම්,වැසි ජල ටැංකි සහ වෙනත් පහසුකම් සැපයීම මගින් ජනතාවගේ සමාජ ආර්ථික තත්ත්වය නංවාලීම සිදු කරනු ලැබේ.ඒ අනුව කෘෂි මාර්ග 78 ක් ද, බහු කාර්ය ගොඩනැගිලි 4 ක් ද, පානීය ජල ව්‍යාපෘති 18 ක්ද, ප්‍රජාවගේ අවශ්‍යතා මත ශ්‍රම ශක්ති වැඩසටහන් (cash for work) 193 ක්ද, වෙනත් යටිතල පහසුකම් එනම්, සනීපාරක්ෂක , සූර්ය විදුලි බල ශක්ති,පාලම් හා බෝක්කු අළුත්වැඩියා කිරීම් යනාදී සංවර්ධන කටයුතු 98 ක් අවසන් කල අතර,මෙම සංරචකය තුලින් ප්‍රතිලාභ ලැබූ සංඛ්‍යාව 56,000 කට අධිකය.



කිරි එකතු කිරීමේ මධ්‍යස්ථාන හා ළදරු පාසල්

**4.අලෙවි සහ කුඩා ව්‍යාපාර සංවර්ධනය.**

අලෙවි ප්‍රවර්ධනයේ දී පෙර ගිවිසුම් 10,000 ක් යටතේ බෝග වගාවද, පෞද්ගලික අංශය සමඟ කිරි එකතු කිරීමේ මධ්‍යස්ථාන 90 ක් පිහිටුවීමද, සති පොලවල් 40 ක් වැඩිදියුණු කිරීමද, ප්‍රවාහන කටයුතු පහසු වීම සඳහා කෘෂි මාර්ග 700 ක් පමණ වැඩි දියුණු කිරීමද සිදු කරන ලදි. එමෙන්ම කාගීල්ස් ආයතනය සමඟ ඒකාබද්ධව වැලිමඩ හා මඩුල්ල කොට්ඨාශ වල එලවළු හා පළතුරු එකතු කිරීමේ මධ්‍යස්ථාන 02 ක් ඉදි කරන ලදි.



බදුල්ල,වංගියකුඹුර එලවළු හා පළතුරු එකතු කිරීමේ මධ්‍යස්ථාන



මඩුල්ල,රුවල්වෙල මධ්‍යස්ථාන

මෙමගින් දිනකට එලවළු මෙ.ටො. 5-7 අතර ප්‍රමාණයක් මිළදී ගැනීම නිසා ප්‍රදේශයේ ගොවීන්ට ඉමහත් සේවාවක් සිදු වී ඇත. 2012 වර්ෂයේදී ව්‍යාපෘති බල ප්‍රදේශ තුල කුඩා පරිමාණ අලෙවි ඒකක 32 ස්ථාපිත කළ අතර, එමඟින් ගොවි පවුල් 500 කට පමණ සෙත සැලසිනි.



කුරුණෑගල දිස්ත්‍රික්කයේ කුඩා ව්‍යාපාර සංවර්ධනය සඳහා ණය ලබා දීම.



කුකුල් පාලන ව්‍යාපෘතිය අනුරාධපුරය

**5.සුළු ණය ලබාදීම මඟින් ආදායම් උත්පාදනය.**

කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර ප්‍රවර්ධනය සඳහා "භාග්‍යා" සහ "අපේක්ෂා"නමින් වැඩසටහන් 02 ක් ක්‍රියාත්මක විය.මෙම වැඩසටහන තුලින් අඩු ආදායම්ලාභීන්ට ස්වයං රැකියාවන්හි නිරතව පවුලේ ආදායම වැඩිකර ගැනීමට අවශ්‍ය ණය පහසුකම් සැපයීම සිදු කරනු ලැබේ. 2012 වර්ෂයේදී පවුල් 1007 කට ණය ලබාදුන් අතර, ඒ සඳහා රු.මි. 73 ක් වැය කර තිබේ. මහ බැංකුව ඇතුළු රාජ්‍ය බැංකු සමඟ භාග්‍යා වැඩසටහන ක්‍රියාත්මක කළ අතර , ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය සමඟ අපේක්ෂා වැඩසටහන ක්‍රියාත්මක කරන ලදි. ප්‍රතිලාභීන්ගෙන් 80% ක් කාන්තාවන් වීම විශේෂයකි.





ගෘහ කර්මාන්තයක් ලෙස ඇලුමිනියම් නිෂ්පාදනය

ව්‍යාපෘතියේ සමුච්චිත ප්‍රගතිය (2012 .12.31 දක්වා)

| සංරචකය | සමුච්චිත භෞතික ප්‍රගතිය (2012.12.31 දක්වා ) | |
|---|---|---|
| | ඉලක්කය | ප්‍රගතිය |
| 1. උස්බිම් කෘෂිකර්ම සංවර්ධනය හා සත්වපාලනය | කෘෂි ක්ෂේත්‍ර පාසල් 3600 | කෘෂි ක්ෂේත්‍ර පාසල් 3228 |
| 2. සුළු වාරි මාර්ග පුනරුත්ථාපනය සහ ජල කළමණාකරනය | පුනරුත්ථාපනය කළ වැව් හා අමුණු 750 | පුනරුත්ථාපනය කළ වැව් හා අමුණු 708 |
| 3. ප්‍රජා යටිතල පහසුකම් සංවර්ධනය | • කෘෂි මාර්ග 750<br>• බහු කාර්ය ගොඩනැගිලි 138<br>• ජල ව්‍යාපෘති 105<br>• ශ්‍රම ශක්ති වැඩසටහන් 875<br>• වෙනත් යටිතල පහසුකම් 800 | • කෘෂි මාර්ග 738<br>• බහු කාර්ය ගොඩනැගිලි 120<br>• ජල ව්‍යාපෘති 114<br>• ශ්‍රම ශක්ති වැඩසටහන් 847<br>• වෙනත් යටිතල පහසුකම් 897 |
| 4. සුළු මූල්‍ය හා ආදායම් උත්පාදනය | ප්‍රතිලාභීන් 5000 | ප්‍රතිලාභීන් 4631 |
| 5. අලෙවි කටයුතු ප්‍රවර්ධනය කිරීම | • පෙර ගිවිසුම් 20,000<br>• වෙළඳපොල යටිතල පහසුකම් 300<br>• සුළු පරිමාණ ව්‍යවසායකයින් 2000<br>• අපේක්ෂා ණය ලබා ගත් ප්‍රතිලාභීන් 3000 | • පෙර ගිවිසුම් 11,443<br>• වෙළඳපොල යටිතල පහසුකම් 278<br>• සුළු පරිමාණ ව්‍යවසායකයින් 1646<br>• අපේක්ෂා ණය ලබා ගත් ප්‍රතිලාභීන් 2714 |

# 5.ආහාර නිෂ්පාදනය සඳහා ජපන් ප්‍රදාන(2KR)



ජපන් රජයේ ප්‍රදානයක් ලෙස අඩු වරප්‍රසාදලාභී ගොවීන්ගේ ආහාර සුරක්ෂිතතාවය තහවුරු කිරීම සඳහා කෘෂි යන්ත්‍රෝපකරණ ලබා දීමේ වැඩසටහන ක්‍රියාත්මක වේ.

මෙම වැඩසටහනේ 2KR -2010 වැඩසටහන යටතේ ජපානයෙන් යෙන් මිලියන 360 ක ප්‍රදානයක් ලැබුනු අතර ශ්‍රී ලංකා රජය විසින් තීරුබදු ඇතුළු දේශීයව වැය වන වියදම් දරනු ලැබීය. මෙම වැඩසටහන යටතේ රොටවේටරය සහිත රෝද 4 ට්‍රැක්ටර් 50 ක් 2011 වසරේදී ලැබුනු අතර, රොටවේටර සහිත රෝද 2 ට්‍රැක්ටර් 896 ක් ලබා දෙන ලදි.

2012 වර්ෂය සඳහා භාණ්ඩාගාර ප්‍රතිපාදන ලෙස රු.මි. 585 ක් වෙන් වු අතර එහි සංශෝධිත ප්‍රතිපාදන රු.මි. 493.7 කි.2012 වර්ෂය අවසන් වන විට මූල්‍ය ප්‍රගතිය රු.මි.430.466 කි.

2012 වර්ෂයේදී ලැබුනු රොටවේටරය සහිත රෝද 2 ට්‍රැක්ටර් 896 ත් ඊට අදාල අමතර කොටස් අතරින් ට්‍රැක්ටර් 820 ක් ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින් තෝරා ගන්නා ලද ගොවි සංවිධාන වල අඩු වරප්‍රසාදලාභී ගොවීන් වෙත සහන මුදලකට වාරික ගෙවීමේ පදනම මත ලබා දුන් අතර, ඉතිරි ට්‍රැක්ටර් 76ක් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ බීජ හා රෝපණ ද්‍රව්‍ය ගොවිපල් හා පර්යේෂණ ගොවිපල් වෙතද, දෙපාර්තමේන්තු ව්‍යාප්ති අංශයේ ගොවි පුහුණු කටයුතු සඳහාද ලබා දෙන ලදී.

## 6.බෝග පූරෝකථන වැඩසටහන

2012 වර්ෂය සඳහා රු.මි.3.0 ක ප්‍රතිපාදන වෙන් වූ අතර,රු.මි.2.85 ක් ලෙස ප්‍රතිපාදන සංශෝධනය විය. වර්ෂය අවසානයේ මූල්‍ය ප්‍රගතිය රු.මි. 2.126 කි.

- 2012 යල කන්නයටත් 2012/2013 මහ කන්නයටත් අදාල උපලේඛන හා ආකෘති පත්‍ර මුද්‍රණය කර ක්ෂේත්‍රයට බෙදා හැර අවසන් කරන ලදි.
- ප්‍රාදේශීය නිළධාරීන් හා කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකරුවන් දැනුවත් කිරීමේ වැඩසටහන් 06 ක් දිස්ත්‍රික්ක 06 ක ක්‍රියාත්මක කරන ලදි.
- යල සහ මහ කන්න 02 ම සඳහා වී සහ අතිරේක බෝග පිළිබඳව පූරෝකථන වාර්තා 03ක් සකස් කර ඇත.
- බඩ ඉරිඟු,ලොකු ලූණු සහ මුං,රතු ළූණු සඳහා (තුන්වන කන්නයද ඇතුලත්ව) කන්න සඳහා විශේෂ වාර්තා 03ක් සකස් කර ඇත.

## 7.කාබනික පොහොර නිෂ්පාදනය හා භාවිතය දිරි ගැන්වීමේ වැඩසටහන

කාබනික පොහොර නිෂ්පාදනය හා භාවිතය දිරි ගැන්වීමේ වැඩසටහනට 2012 වර්ෂය සඳහා වෙන් කල මුළු ප්‍රතිපාදන ප්‍රමාණය රු.මි. 100 කි. 2012 වර්ෂය තුළ මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමේදී රු.මි. 92.742 ක වියදමක් දරා ඇති අතර එහි මූල්‍ය ප්‍රගතිය දළ වශයෙන් 93% කි.



**අම්පාර දිස්ත්‍රික්කයේ කාබනික පොහොර නිෂ්පාදන පුහුණු වැඩසටහනක්**

පසුගිය වර්ෂ වලදී මෙන්ම 2012 වර්ෂයේද මෙම වැඩසටහන යටතේ විවිධ ක්‍රියාකාරකම් රැසක් සිදු කර ඇත. මෙහිදී ග්‍රාමීය මට්ටමින් කාබනික පොහොර නිෂ්පාදන වැඩසටහන ප්‍රධාන තැනක් ගන්නා ලදී. මේ සඳහා ගොවීන් 23,420 කගේ දායකත්වය අම්පාර හා හම්බන්තොට අන්තර් පළාත් බල ප්‍රදේශ වලින් ද මඩකලපුව හා ත්‍රිකුණාමලය දිස්ත්‍රික්ක වලින්ද ලබා ගන්නා ලදී.

මෙහිදී ගොවීන් කාබනික පොහොර නිෂ්පාදනයට දිරි ගැන්වීම සඳහා ඇඟිලි 3 උඳුලු මුල්ලුවක්,රොක් පොස්පේට් කි.ග්‍රෑම් 25 ක්, කළු පොලිතීන් කි.ග්‍රෑම් 3.5 ක් හා කි.ග්‍රෑම්5 මුහුන් බෑග් 1ක් ඇතුලත් ද්‍රව්‍ය කට්ටල 23,420 වැඩසටහනට සම්බන්ධ වූ ගොවීන්ට ලබා දී ඇත.

2012 වර්ෂය තුළ දී ගොවීන් 25,774 ක් හා නිලධාරීන් 2,310 ක් පුහුණු කර ඇත. මීට අමතරව කාබනික පොහොර වැඩසටහනේ නියමු මධ්‍යස්ථානය වන මාකඳුර ප්‍රාදේශීය කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය මඟින් කාබනික පොහොර නිෂ්පාදනය හා භාවිතය පිළිබඳ අත්පත්‍රිකා 364,650 ක් බෙදා දී ඇත.

2012 වර්ෂයේදී මෙම ව්‍යාපෘතියේ දායකත්වයෙන් ගොවීන් හා මාකඳුර, ප්‍රාදේශීය කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය මඟින් කොම්පෝස්ට් මෙ.ටො. 34,191 ක් පමණ නි[illegible] ම. 1 ක මිල රු. 7.00 ක් ලෙස [illegible]



මාකඳුර ප්‍රදේශීය කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ මුහුන් පැකට් බෙදා හැරීමට සූදානම් කිරීම

නිෂ්පාදනය කරන ලද කොම්පෝස්ට් හි මූල්‍ය වටිනාකම රු.මි. 239 ක් පමණ වේ.එයමෙම වැඩසටහන සඳහා වැය කළ මුළු මුදලට වඩා නිෂ්පාදනය වූ කොම්පෝස්ට් වල මූල්‍ය වටිනාකම වැඩිවීම මෙහිදී වැදගත් වේ.

මීට අමතරව වෙනත් විවිධ ක්‍රියාකාරකම් රාශියක් ද මෙම ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක කර ඇත. කොම්පෝස්ට් නිෂ්පාදනය දිරිගැන්වීම සඳහා පුහුණුවීම්, ප්‍රදර්ශණ හා වෙනත් වැඩසටහන් සඳහා සහභාගීවූවන්ට කි.ග්‍රෑම්. 5 මුහුන් පැකට් 18,365 ක් බෙදා හැර ඇත.

මාකඳුර නියමු මධ්‍යස්ථානයේ සිදුකළ ආදර්ශන 03 ක් මගින් රසායනික පොහොර 25% කින් අඩු කර කාබනික පොහොර යෙදීමෙන් රසායනික පොහොර පමණක් යෙදීමට වඩා අස්වැන්න වැඩි වී ඇති බව පැහැදිලිව හඳුනාගෙන ඇත.

කාබනික පොහොර නිෂ්පාදනය සඳහා යොදා ගන්නා විවිධ අමුද්‍රව්‍ය, පස් හා කොම්පෝස්ට් නියැදි 527 ක් පමණ විශ්ලේෂණය කිරීම ඉලක්ක කර එම සාම්පල් 527 ම විශ්ලේෂණය කිරීමෙන් එම ඉලක්කය සපුරා ගෙන ඇති අතර ඒවායේ පෝෂ්‍ය පදාර්ථ හා බැර ලෝහ පිළිබඳ විශ්ලේෂණයන්ද සිදු කර ඇත.



මාකඳුර නියමු මධ්‍යස්ථානයේ ඉදිකෙරෙමින් පවතින පුහුණු ගොඩනැගිල්ල

කාබනික පොහොර භාවිතය ප්‍රචලිත කිරීම සඳහා ප්‍රදර්ශණ 3 ක් , ක්ෂේත්‍ර දින 120 ක් හා මාධ්‍ය වැඩසටහන් 07ක් පවත්වා ඇත.

ඉහත සිදු කරන ලද ක්‍රියාකාරකම් වලට අමතරව 2012 වර්ෂයේදී මෙම ව්‍යාපෘතිය මඟින් මෙම වැඩසටහනේ නියමු මධ්‍යස්ථානය ලෙස ක්‍රියා කරනු ලබන මාකඳුර ප්‍රාදේශීය කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ පුහුණු කටයුතු සඳහා ගොඩනැගිල්ලක් ඉදි කිරීමට 2012 වර්ෂයේ මැයි මස 10 වෙනි දින මුල් ගල තබා ආරම්භ කල අතර වසර අවසානය වන විට එහි ඉදිකිරීම් කටයුතු වලින් 60% ක් පමණ අවසන් කර ඇත.

කෘෂිකර්ම අමාත්‍යාංශය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව හා ත්‍රිකුණාමලය, මඩකලපුව පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තු මගින් මෙම වැඩසටහන ක්‍රියාත්මක විය.

## 8.ජපන් ප්‍රතිපාර්ශවීය අරමුදල - රජයේ බීජ ගොවිපල් සංවර්ධනය (පරන්තන් හා මුරුක්කන්)

මුරුක්කන් සහ පරන්තන් රජයේ බීජ ගොවිපල වල බීජ නිෂ්පාදනය ආරම්භ කිරීම මූලික අරමුණ විය. මෙම ව්‍යාපෘතිය සඳහා මූලිකව ප්‍රතිපාදන සැපයීම JICA සහ ඒකාබද්ධ අරමුදලෙනි. 2012 වර්ෂය සඳහා භාණ්ඩාගාර ප්‍රතිපාදන ලෙස රු.මි.85 ක් වෙන් වී ඇති අතර, සංශෝධිත ප්‍රතිපාදන රු.මි.72.752 කි. 2012 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය රු.මි. 52.599 කි.

පරන්තන් සහ මුරුක්කන් රජයේ බීජ ගොවිපල වල ප්‍රධාන සංවර්ධන ක්‍රියාකාරකම්,

- වාරිමාර්ග සහ ජල සම්පාදන වැඩිදියුණු කිරීම
- කෘෂිකාර්මික යන්ත්‍රෝපකරණ පුනුරුත්ථාපනය
- කෘෂිකාර්මික ඉදිකිරීම්
- වාහන මිලදී ගැනීම
- භූමිය සහ යටිතල පහසුකම් සංවර්ධනය යනාදී සියළු කාර්යයන් 100 % කින් අවසන් කර ඇත.

## 9.ජාතික කෘෂිකාර්මික පර්යේෂණ සැලැස්ම (NARP)

2012-2016 කාල පරිච්ඡේදය සඳහා වූ ජාතික කෘෂිකර්ම පර්යේෂණ සැලැස්ම මහින්ද චින්තනයට අනුකූලව සම්පාදනය කර අවසන් කර තිබේ. නෛතික හා නියාමන යන්ත්‍රණයන්හි විශේෂිත ක්ෂේත්‍රයන් , ප්‍රමුඛතා ගැලපුම්, මූල්‍ය සම්පත් ඒකරාශි කිරීම, සම්පත් දැනුම හා තාක්ෂණ හුවමාරුව හා ශක්‍යතා වර්ධනය එහිලා සැලකිල්ලට ගෙන තිබේ.

**ජාතික කෘෂිකාර්මික පර්යේෂණ සැලැස්ම - 2012**

ජාතික කෘෂිකර්ම පර්යේෂණ සැලැස්ම ඒකාබද්ධ සැලැස්මක් මෙන්ම ජාතික කෘෂිකර්ම පර්යේෂණ පද්ධතියේ පර්යේෂණ න්‍යාය පත්‍රය අඩංගු ක්‍රියාකාරී වැඩසටහනක් ද වන්නේය. මෙම ජාතික කෘෂිකර්ම පර්යේෂණ සැලැස්ම යටතේ දැනුම පර්යේෂණ ව්‍යාපෘති 186 ක් ක්‍රියාත්මක කෙරෙන අතර, එමගින් කෘෂිකර්මයේ උද්ගතව ඇති ප්‍රධාන ගැටළු වලට විසඳුම් ලබා ගැනීම අපේක්ෂා කෙරේ.

එනම් අඩු බෝග පළුදුව ගුණාත්මක බීජ සහ රෝපණ ද්‍රව්‍ය උපයෝගී කර ගැනීමේ පසුබටතාව,ශ්‍රම හිඟය අක්‍රමවත් පලිබෝධනාශක භාවිතය,ජෛව පලිබෝධනාශක භාවිතයට උනන්දු නොවීම ඉහළ පසු අස්වනු පාඩු,නිම් ඇගයුම් ඉහළ දැමීම,බෝගවලට ඇති විදේශ ඉල්ලුම,ජෛව පොහොර භාවිතයට ගොවීන් නැඹුරු කිරීම,නිෂ්පාදන සීමා කිරීම්,කෘෂිකර්මාන්තයට බලපාන පාරිසරික සාධක හා සම්බන්ධ ගැටළු,තාක්ෂණ හුවමාරුව,සේවා නියුක්තිය හා ශ්‍රම උපයෝජනය,සතුන් ඇතිකිරීම,ප්‍රති නිෂ්පාදන ,ධීවර හා කෘෂිකර්මාන්තය අතර අතිශයින් වැදගත් ගැටළු ලෙස හඳුනාගෙන තිබේ.තවද ජාතික කෘෂිකර්ම පර්යේෂණ ප්‍රතිපත්ති සභාවේ විශේෂ කමිටුවක් විසින් මෙම පර්යේෂණ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම නිර්දේශ කර තිබේ.එමෙන්ම ජාතික කෘෂිකර්ම සැලැස්ම විශේෂ කමිටුවක් විසින් අඛණ්ඩව ඇගයුමට ලක් කෙරේ.තවද ඊට අවශ්‍ය ගුරුපදේශනය පර්යේෂණ වැඩසටහන් හා ව්‍යාපෘති පිළිබඳ ජාතික කමිටුව මඟින් ලබා දෙනු ඇත.

**ජාතික හා ජාත්‍යන්තර ආයතන අතර සබඳතා ස්ථාපන කිරීම**

පර්යේෂණ වැඩ සටහන් හා ව්‍යාපෘති පිළිබඳව ජාතික කමිටුව විසින් කලාපයේ ඒ හා සමාන ආයතන සමඟ සබඳතා ස්ථාපිත කර තිබේ.එහිලා බෙහෙවින් ප්‍රතිලාභ සැලසෙන ගිවිසුම අත්සන් කර ඇත්තේ කෘෂිකර්ම පර්යේෂණ සඳහා වූ අන්තර් ජාතික කවුන්සිලය සමඟය. ඒ අනුව 2012 වර්ෂයේදී දේශීය විශේෂඥයන් නව දෙනෙකු කෘෂිකර්ම පර්යේෂණ සඳහා අන්තර්ජාතික කවුන්සලය යටතේ වූ විශ්ව විද්‍යාල විවිධ පුහුණු පාඨමාලා හදාරමින් සිටියහ.එනම් ඉන්දියානු කෘෂිකර්ම පර්යේෂණ ආයතනය ජාතික කිරි පට්ටි පර්යේෂණ ආයතනය,ධීවර අධ්‍යාපනය පිළිබඳ මධ්‍යම ආයතනය හා තමිල්නාඩුවේ මධ්‍යම ආයතනය වේ. මොවුන් හදාරන කෘෂිකර්මයට අදළ ක්ෂේත්‍රයන් වන්නේ දේශගුණික තත්ත්වයන්ට අනුගත කෘෂිකර්මයට නැඹුරුවීම,කෘෂිකර්ම සංවර්ධනය හා පර්යේෂණ කෘෂිකර්මාන්තයේලා කාන්තා සහභාගීත්වය හා දායකත්වය ඉහළ නැංවීම හා ජීව තාක්ෂණ විධි අනුගමනය වැඩිදියුණු කිරීම ආදිය වේ.

**බාහිර සමාලෝචනය**

විශේෂඥ කාර්ය මණ්ඩලයක් විසින් පශු වෛද්‍ය පර්යේෂණ ආයතනයේ ගුණාත්මක බව,පිරිවැය කාර්යක්ෂම කිරීම සඳහා ඇගයීමක් සිදුකරන ලද අතර, සමාලෝචන කමිටුවේ නිර්දේශ පශු වෛද්‍ය පර්යේෂණ ආයතනයට මෙන්ම පශු සම්පත් හා ග්‍රාමීය වතු සංවර්ධන අමාත්‍යාංශයෙන් ලබා දී තිබේ.

**පර්යේෂණ දීමනා**

සුදුසුකම් ලබන අයදුම් කරුවන් සඳහා පර්යේෂණ දීමනා අනුමත කර තිබෙන අතර ඒ බව ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව විසින් අදාළ ආයතන වෙත දැනුම් දී තිබේ.

**දැනුවත් කිරීම**

රාජකීය උද්භිද උද්‍යාන සමඟ සහයෝගිතාවෙන් උද්‍යාන බෝග වගාව පිළිබඳ ජාතික සමුළුවක් සංවිධානය කිරීම, කාබනික කෘෂිකර්ම ප්‍රමුඛතා පෙළ ගැස්වීම හා මෙහෙයවීම පිළිබඳ වැඩමුළුවක් පැවැත්වීම, ශ්‍රී ලංකාවේ කාබනික කෘෂිකර්ම පර්යේෂණ මූලධර්ම හා විධානයන් සම්පාදනය පිළිබඳව පාර්ශවකරුවන් සමඟ සම්මන්ත්‍රණය කිරීම දැනුවත්භාවය ඇති කිරීම මෙහිදී ගන්නා ලද වැදගත් පියවරයන් වේ.

**පුස්තකාල / කෘෂිකාර්මික තොරතුරු ජාලය**

කෘෂිකාර්මික තොරතුරු ජාලයේ මධ්‍යස්ථානය වූ ප්‍රතිපත්ති සභාවට අයත් පුස්තකාලය විද්‍යාඥයන්ට, ගොවීන්ට අධ්‍යයන කටයුතුවල නියැලී අයවලුන්ට, පෞද්ගලික අංශයේ ආයතනවලට/පුද්ගලයින්ට හා රාජ්‍ය නොවන සංවිධාන වලට තොරතුරු සැපයීම තවදුරටත් සිදු කෙරේ.

**දත්ත පදනම 2012**

ඉන්ෆෝම් දත්ත වැඩි දියුණු කිරීම ආරම්භ කර ඇත. ඒ අනුව එමගින් කෘෂි පර්යේෂණ වල නියැලි පර්යේෂකයින්ට/කළමණාකරුවන්ට අදාළ තීරණ ගැනීම පහසු කෙරෙන පරිදි යවත්කාලීන දත්ත ලබා ගත හැකි වනු ඇත.

## <u>10.ලොකුළුණු බීජ නිෂ්පාදන වැඩසටහන</u>

2013 වර්ෂය වන විට දේශීය ලොකු ළූණු බීජ කි.ග්‍රෑම්25,000 නිෂ්පාදනය කර ගැනීම හා එමඟින් වැඩි ගුණාත්මයෙන් යුතු බීජ ලොකු ළූණු ගොවීන් වෙත ලබා දීම මෙම වැඩසටහනේ මූලික අරමුණ වී ඇත. 2012 වර්ෂය සඳහා රුපියල් මිලියන 22ක් වෙන්කර තිබූ අතර, රුපියල් මිලියන 7.472 ක් වැය කර ඇත. 2012 වර්ෂයේදී මේ සඳහා ගොවීන් 900ක් පමණ සහභාගී කරගෙන ඇත. මේ යටතේ මව් අල කි.ග්‍රෑම්157,000 පමණ වසන්තීකරණය සඳහා යොමු කර ඇත. 2012 වර්ෂයේ රට තුළ ලොකු ළූණු බීජ කි.ග්‍රෑම්23,000ක පමණ ප්‍රමාණයක් නිෂ්පාදනය වී ඇත. වැසි ආවරණ 19ක් සහ ගබඩා තට්ටු 39 සපයා ඇත. ක්ෂේත්‍ර දින 10ක් සිදුකර ඇත. ගොවීන් 10ක් සහ නිලධාරීන් දෙදෙනෙකුට වැඩිදුර පුහුණුව සඳහා ඉන්දියානු අධ්‍යයන සංචාරයක් ලබා දී ඇත.





ලොකු ළූණු බීජ නිෂ්පාදනය

2013 වසර වන විට නිෂ්පාදනයට යෝග්‍ය නව ප්‍රදේශ හඳුනා ගනිමින් මහා පරිමාණ ලෙස ලොකු ළූණු හා රතුළූණු බීජ නිෂ්පාදනය කිරීමට සැලසුම් කොට ඇති අතර, රට තුළ ලොකු ළූණු බීජ අවශ්‍යතාවය වශයෙන් ඉලක්ක කර ඇති කි.ග්‍රෑම් 35,000 ක ප්‍රමාණයම දේශීයව නිෂ්පාදනය කිරීමට අපේක්ෂා කෙරේ. 2013 වසරට වෙන් කර ඇති මුදල රු.මි. 20 කි. මෙයට අමතරව රතුළූණු බීජ කි.ග්‍රෑම් 1,000 ක්ද දිස්ත්‍රික්කවල නිෂ්පාදනය කිරීමට කටයුතු සලසා ඇත.

## 11. දැයට කිරුළ ජාතික සංවර්ධන වැඩසටහන සහ ප්‍රදර්ශනය - 2012

"දැයට කිරුළ" ජාතික සංවර්ධන වැඩසටහන හා ප්‍රදර්ශනය මෙම වසරේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ, ඔයාමඩුව ප්‍රදේශය පාදක කර ගනිමින් ක්‍රියාත්මක කරන ලදී.

අමාත්‍යාංශය යටතේ පවතින සියලුම ආයතන සහ පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මඟින් මෙම වැඩසටහන ක්‍රියාත්මක කල අතර, ප්‍රධාන වශයෙන් ප්‍රදර්ශන භූමියේ කෘෂි උද්‍යානයක් නිර්මාණය කිරීම හා ප්‍රාදේශීය සංවර්ධනය අරමුණු කොට ආදර්ශ ගම්මාන වැඩසටහන ක්‍රියාත්මක කිරීම සිදු විය.

මෙම කාර්යය සඳහා 2011/12 අමාත්‍යාංශ ඍජු ප්‍රතිපාදන යටතේ වෙන් කරන ලද මුදලින් රු.මි 65.5 ක් වැය කරන ලද අතර, කෘෂිකර්ම අමාත්‍යාංශයේ කාබනික පොහොර වැඩසටහන යටතේ රු.මි. 4.31 සහ වියළි කලාපීය ජීවනෝපායන් නගා සිටුවීමේ වැඩසටහන (IFAD) යටතේ රු.මි. 186 ක වැඩසටහන් ක්‍රියාත්මක කරන ලද අතර, 2012 වර්ෂයයේ ප්‍රතිපාදන යටතේ ඉතිරි රු.මි. 28.5 ක මුදල , 2013 දැයට කිරුළ වැඩසටහන පැවැත්වෙන අම්පාර දිස්ත්‍රික්කයේ ප්‍රදර්ශන භූමිය සංවර්ධන කටයුතු සහ ඊට සමගාමීව අම්පාර, පොළොන්නරුව, මඩකලපුව සහ ත්‍රිකුණාමලය යන දිස්ත්‍රික්කයන්හි ක්‍රියාත්මක කිරීමට නියමිත දිස්ත්‍රික් සංවර්ධන වැඩසටහන් සඳහා වෙන් කරන ලදී.

**අදාල ආයතන මඟින් ක්‍රියාත්මක කරන ලද සංවර්ධන වැඩසටහන් හා ප්‍රගතිය**

1. ***කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මඟින් ක්‍රියාත්මක කරන ලද වැඩසටහන්***
    - වෙන් කරන ලද ප්‍රතිපාදන රු.මි. 44.5 - * මූල්‍ය ප්‍රගතිය රු.මි. 42.05

ක්ෂේත්‍ර බෝග ප්‍රවර්ධන වැඩසටහන යටතේ ඉපලෝගම ප්‍රා.ලේ.කොට්ඨාශය තුල අක්කර 5 ක වපසරියක වාරි පහසුකම් ඇති කිරීම, අතිරේක ආහාර බෝග බීජ නිෂ්පාදනය, බහු වාර්ෂික බෝග ස්ථාපනය සහ අක්කර 5 ක තෘණ වගා කිරීම සිදු කරන ලදී. ගොවීන් හා නිලධාරීන් පුහුණු කිරීම හා පස් සාම්පල 90 ක්, ජල සාම්පල 134ක් විශ්ලේෂණය කිරීම.

දැයට කිරුළ ප්‍රදර්ශනයේ, ප්‍රදර්ශන කුටි /ඒකක අතුරින් කෘෂිකර්ම ප්‍රදර්ශන ඒකකය සඳහා ප්‍රථම ස්ථානයට හිමි විය.

### 2. *අන්තර් පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මඟින් ක්‍රියාත්මක කරන ලද වැඩසටහන්*

- වෙන් කරන ලද ප්‍රතිපාදන රු.මි. 9.0 - * මූල්‍ය ප්‍රගතිය රු.මි. 4.40

නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය මඟින් දිස්ත්‍රික්කයේ ප්‍රා.ලේ. කොට්ඨාශ 8 ක ගුණාත්මක බිත්තර වී අක්. 688 ක් නිෂ්පාදනය, වී වගාවට නව තාක්ෂණය ලබා දීම, එළවළු අක්කර 2 ක් , පළතුරු යටතේ අඹ/ගස්ලබු - අක්කර 92 ක් වගා කිරීම, ගුණාත්මක සහල් නිෂ්පාදනය සඳහා ගම්මාන 2 කට වී තම්බන බැරල් 56 ලබා දීම, අක්කර 320 පමණ අතිරේක ආහාර බෝග වගා කිරීම, ලොකු ළූණු බීජ 1000 kg ක් නිෂ්පාදනය සහ කාබනික පොහොර නිෂ්පාදනයට ගොවීන් 163 කු යොමු කරනු ලැබීය.

### 3. *උතුරු මැද පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මඟින් ක්‍රියාත්මක කරන ලද වැඩසටහන්*

- වෙන් කරන ලද ප්‍රතිපාදන රු.මි. 12 - * මූල්‍ය ප්‍රගතිය රු.මි. 5.86



**කෘෂි ප්‍රදර්ශන භූමිය-ඔයාමඩුව**

පැරෂුට් තාක්ෂණයෙන් අක්කර 90 ක් බිත්තර වී නිෂ්පාදනය, ලොකු ළූණු බීජ කි.ග්‍රෑ. 16,185 ක් නිෂ්පාදනය කිරීම, අතිරේක ආහාර බෝග වගාව යටතේ උඳු, කව්පි, මුං - අක්කර 105 ක්, පළතුරු වගාව යටතේ ගස්ලබු/අඹ අක්කර 120 , එළවළු වගාව සහ මී මැසි පාලන ගම්මාන 06 ක් ස්ථාපිත කරන ලදී.

### 4. *පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනය මඟින් ක්‍රියාත්මක කරන ලද වැඩසටහන්*

- වෙන් කරන ලද ප්‍රතිපාදන රු.මි. 3.0 - * මූල්‍ය ප්‍රගතිය රු.මි. 1.33

වැඩසටහන් 28 ක් පවත්වමින් ප්‍රතිලාභීන් 933 ක් සඳහා පසු අස්වනු තාක්ෂණය පිළිබඳ පුහුණුව ලබා දීම, සහල් මෝල් 03 ක් වැඩි දියුණු කිරීම, බේකරි ගෘහ 04 ක් සඳහා සහල් ආශ්‍රිත නිෂ්පාදන හඳුන්වා දීම, සහල් පිටි මෝල් 05ක් නවීකරණය කිරීම, ධාන්‍ය කුළුබඩු බෝග සැකසුම් ඒකක 10ක් ස්ථාපිත කිරම, පළතුරු/සියඹලා ආශ්‍රිත නිෂ්පාදන ප්‍රචලිත කිරීම, එළවළු හා පළතුරු පරිහරණය සඳහා ප්ලාස්ටික් කූඩා 800 ක් ලබා දීම.

### *ශ්‍රී ලංකා හඳබිම අධිකාරිය මඟින් ක්‍රියාත්මක කරන ලද වැඩසටහන්*

- වෙන් කරන ලද ප්‍රතිපාදන රු.මි. 5.0 - * මූල්‍ය ප්‍රගතිය රු.මි. 1.38

ගොවීන් 250 ක් සම්බන්ධ කර ගනිමින් කෝණකුඹුක් වැව ග්‍රාම නිලධාරී වසමේ කුඩා වැව් ආශ්‍රිත පාංශු හා ජල පෝෂක සංරක්ෂණ තිරසාර ඉඩම් කළමනාකරණ නියමු

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, කෘෂි උපකරණ ලබා දීම යටතේ රෝද 2 ට්‍රැක්ටර්/උදලු තල/වීල් බැරෝ/මුල්ලු සහ ගොවීන් වෙත බිත්තර වී බුසල් 50 ක් ලබා දීම.

***5. හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය මඟින් ක්‍රියාත්මක කරන ලද වැඩසටහන්***

- වෙන් කරන ලද ප්‍රතිපාදන රු.මි. 7.0 - * මූල්‍ය ප්‍රගතිය රු.මි. 7.89

රඹෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ගෘහ ඒකක 250 ක් මූලික කර ගනිමින් සහභාගීත්ව ගැමි විමසුම සහ සමාජ ආර්ථික සමීක්ෂණය සිදු කිරීම, කෘෂිකාර්මික යටිතල පහසුකම් යටතේ වැව් 5 ප්‍රතිසංස්කරණය කිරීම හා මේ තුලින් ප්‍රතිලාභින් 248 ක් සඳහා වාරි පහසුකම් වැඩිදියුණු කිරීම, ස්වයං රැකියා ව්‍යාපෘති සඳහා උපකරණ ලබා දීම, කෝණකුඹුක් වැව පාසල අළුත්වැඩියා කිරීම, වැසි ජල ටැංකි 10 ඉදිකිරීම, පොදු ළිං අලුත්වැඩියාව, ගෘහ ඒකක 150 කට ගෙවතු වගාව සඳහා බීජ ලබා දීම , වැව් රක්ෂිතය සංවර්ධනය හා අඹ/පොල්/දෙළුම්/පේර/දොඩම්/දෙහි වැනි පැළ තවාන් පවත්වාගෙන යාම හා ගොවි සංවිධාන 04 සාමාජිකයන් සඳහා අළෙවි කරණය පිළිබඳ දැනුවත් කිරීමේ පුහුණු වැඩසටහන් පැවැත්වීම.

***ජාතික ආහාර ප්‍රවර්ධන මණ්ඩලය මඟින් ක්‍රියාත්මක කරන ලද වැඩසටහන්***

- වෙන් කරන ලද ප්‍රතිපාදන රු.මි. 2.0 - * මූල්‍ය ප්‍රගතිය රු.මි. 2.59

මුළුතැන් ගෙවල් සංවර්ධනය වැඩසටහන යටතේ කෝණකුඹුක් වැව ග්‍රාමයේ නිවාස 250 ක් සඳහා උපකරණ ලබා දීම, මානිංගම ග්‍රාම සංවර්ධන කටයුතු වෙනුවෙන් තෝරා ගන්නා ලද ප්‍රතිලාභීන් වෙත කෘෂි උපකරණ ලබා දීම, කාබනික පොහොර පැකට් ලබා දීම, අඹ, පොල්, දොඩම් පැළ ලබා දීම, හා දේශීය නිෂ්පාදන අළෙවිසැල් 03 ක් ඉදිකිරීම.

***6. කෘෂිකර්ම අමාත්‍යාංශයේ කාබනික පොහොර අංශය මඟින් ක්‍රියාත්මක කරන ලද වැඩසටහන්***

- වෙන් කරන ලද ප්‍රතිපාදන රු.මි. 4.5 - * මූල්‍ය ප්‍රගතිය රු.මි. 4.3

රඹෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ගොවීන් 240 ක් සඳහා කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය කිරීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම, අනෙකුත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 21 ක් ආවරණය වන පරිදි ගම්මාන 21 තුල කොම්පෝස්ට් නිෂ්පාදන වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා උපකරණ කට්ටල ලබා දීම, හා කොම්පෝස්ට් මෙ.ටො. 2,800 පමණ නිෂ්පාදනය කිරීම.

***7. වියළි කලාපීය ජීවනෝපාය නගා සිටුවීමේ වැඩසටහන (IFAD) මඟින් ක්‍රියාත්මක කරන ලද වැඩසටහන්***

- වෙන් කරන ලද ප්‍රතිපාදන රු.මි. 186 - * මූල්‍ය ප්‍රගතිය රු.මි. 186.0

ප්‍රාදේශීය ලේකම්කොට්ඨාශ 16 ක් ආවරණය වන පරිදි උස්බිම් සංවර්ධන වැඩසටහන, අලෙවිකරණය හා කුඩා ව්‍යාපාර සංවර්ධනය, ක්ෂුද්‍ර ණය සැපයීම හා ආදායම් උත්පාදනය, කුඩා වාරි මාර්ග පුනරුත්ථාපනය, ප්‍රජා යටිතල පහසුකම් සංවර්ධනය යන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

## 12.මන්නාරම් දිස්ත්‍රික්කයේ අවතැන් වූ ජනතාවගේ ආහාර සුරක්ෂිතතාව තහවුරු කිරීම සඳහා සහය වීම

මෙම ව්‍යාපෘතිය සඳහා 2012 වර්ෂයට භාණ්ඩාගාර ප්‍රතිපාදන ලෙස රු.මි.40 ක් වෙන් වු අතර මූල්‍ය ප්‍රගතිය රු.මි.44.594 කි.මෙම වැඩසටහනේ ප්‍රධාන අරමුණ මන්නාරම් දිස්ත්‍රික්කයේ අවතැන් වු ජනතාවගේ ආහාර සුරක්ෂිතතාව තහවුරු කිරීම සඳහා සහායවීම වේ.මේ දක්වා සිදුකල කාර්යයන්ගේ ප්‍රගතිය පහත දක්වා ඇත.

| විස්තරය | ප්‍රමාණය |
|---|---|
| i.විල් බැරෝ | 475 |
| ii.දියර ඉසින යන්ත්‍ර | 943 |
| iii.වතුර පොම්ප | 210 |
| iv.උදලු තල | 3200 |
| v.බිත්තර වී බුසල් | 2100 |
| vi.එළවලු බීජ පැකට් | 3200 |
| vii.මිරිස් බීජ | 8 |
| viii.බඩ ඉරිගු බීජ | 80 |
| ix.රතු ලූණු බීජ | 52800 |
| x.රට කජු බීජ | 16000 |
| xi.මුං ඇට | 570 |
| xii.පොල් පැළ | 6400 |
| xiii.අඹපැළ | 6400 |
| xiv.කොස් පැළ | 6400 |

- මීට අමතරව රසායනික පොහොර සහ කෘෂි රසායන ගොවීන් වෙත බෙදා දීම සිදු කර ඇත.

## 13.සහල් අපනයන වැඩසටහන 2012

ඉහත වැඩසටහන සඳහා 2012 වර්ෂයට ව්‍යාප්ති හා පුහුණු අංශය වෙත වැය ශීර්ෂ 118-2-3-30-2502 යටතේ රු. දසලක්ෂ 0.485 ක් පමණ වෙන්කර තිබුණි. එසේම එම මුදලින් සහල් අපනයන කලාප වල පහත සඳහන් ඉලක්ක ඉටුකර ගන්නා ලදී.

| දිස්ත්‍රික්කය | වපසරිය | වී වර්ගය | අස්වැන්න(මෙ.ටො) | ගොවීන් |
|---|---|---|---|---|
| පොළොන්නරුව | 1000 | BG 352 | 2000 | 1800 |
| හම්බන්තොට | 434 | AT 362 | 2823 | 434 |
| අම්පාර | 420 | BG 357 | 2000 | 500 |
| මන්නාරම | 360 | BG 360 | 1700 | 570 |
| එකතුව | 2214 | | 8523 | 3304 |

මෙම ව්‍යාපෘතිය යටතේ නිෂ්පාදනය කරන ලද වී සහල් බවට පත් කිරීමට සුදුසු වී මෝල් 22 ක් ඒ ඒ දිස්ත්‍රික්ක වලින් තෝරා ගන්නා ලදී.

i. අන්තර්ජාතික වෙළඳපොළේ සහල් මිල අඩුවීම කි.ග්‍රෑ 01 ක ගැනුම් මිල රු.50/= ,55/=
ii. සහල් අපනයනය කිරීමේදී අවම වශයෙන් සහල් කි.ග්‍රෑ 01 ක් සඳහා රු.100 කට වැඩි මිලකට වැඩිවිය යුතු බව රජය තීරණය කිරීම

පහත සඳහන් හේතුන් මත අපේක්ෂිත පරිදි සහල් අපනයනය කිරීමට 2012 වර්ෂයේදී නොහැකි විය.කෘෂිකර්ම අමාත්‍යාංශය මගින් මෙම වී වගා වැඩසටහන සඳහා රු.දසලක්ෂ 0.485 ක් වෙන් කර තිබුනත් එම මුදල් ලබා දී තිබුනේ 2012 අවසාන කාර්තුවේදීය.

මේ හේතුව නිසා දිස්ත්‍රික් නියෝජ්‍ය අධ්‍යක්ෂකවරු විසින් ගොවීන් පුහුණු කිරීම් සඳහා වැය වු මුදල් වලින් කොටසක් වෙනත් ව්‍යාපෘති වලින් පියවා තිබීම නිසා ව්‍යාප්ති අංශයට ලබාදුන් මුදලින් රු.273,220.50 පමණක් වැය වී ඇත.

# 4. විශේෂ සංවර්ධන වැඩසටහන්/ ව්‍යාපෘති

## *i. ඉදිරිපත් කල නව ව්‍යාපෘති හා යෝජනා*

1.ගෝලීය කෘෂිකර්මය සහ ආහාර සුරක්ෂිතතාවය පිළිබඳ වැඩසටහන
2. වියළි කලාපීය කෘෂි නිෂ්පාදන ඵලදායිතා ව්‍යාපෘතිය
3.පැලැටි ජාන සම්පත් මධ්‍යස්ථානයේ සංරක්ෂිත ශාඛ විශේෂ හා ජාන ප්ලාස්ම හඳුනා ගැනීම සඳහා ඩී.එන්.ඒ.අඟිලි සලකුණු දත්ත පද්ධතියක් වැඩි දියුණු කිරීම
4.කෘෂිකර්ම අමාත්‍යාංශයේ ප්‍රමුඛතා සංවර්ධන රාමුවට ගැලපෙන අයුරින් ව්‍යාපෘති යෝජනා සකස් කිරිම සඳහා සංකල්ප පත්‍ර 07 ක් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සමඟ සකස් කර ඒ අතරින් තෝරාගත් 03 ක් ව්‍යාපෘති වාර්තා ලෙස වැඩි දියුණු කිරීමට කටයුතු කර ඇත.
5.ශ්‍රීලංකාවේ ආරක්ෂිත ගෘහ තුළ ස්ට්‍රෝබරි (***Fragariaananassa***) වගාව ප්‍රවර්ධනය කිරීම
6.පසු අස්වනු රැක ගැනීම පිළිබඳ ව්‍යාපෘතියක් සකස් කර සාක් සංවර්ධන අරමුදලට ඉදිරිපත් කර ඒ සඳහා ඇමරිකානු ඩොලර් 727,500 ක ප්‍රතිපාදන ලබා ගෙන ඇත.එය 2013 දී ක්‍රියාත්මක කිරීමට නියමිතය.
විදේශ කටයුතු අමාත්‍යාංශය හරහා විවිධ ආයතන / රට වලට ව්‍යාපෘති යෝජනා යැවීම

1. දකුණු අප්‍රිකාවට ව්‍යාපෘති යෝජනා 03 ක් ඉදිරිපත් කරන ලදි.
2. ඕමාන් රාජ්‍යයට ව්‍යාපෘති යෝජනා 01 ක් ඉදිරිපත් කරන ලදි.
3. කටාර් රාජ්‍යයට ව්‍යාපෘති යෝජනා 01 ක් ඉදිරිපත් කරන ලදි.

## *ii.විදේශ සබඳතා හා අදාළ කටයුතු*

### අවබෝධතා සිහිපත් වලට අදාළ කටයුතු :-

- ඉන්දියානු රජය සමඟ අවබෝධතා සිහිපතක් ශ්‍රී ලංකාවේදී අත්සන් කිරීම හා අදාල සංවිධාන කටයුතු
- බ්‍රසීලය සමඟ අවබෝධතා සිහිපතක් බ්‍රසිලයේදී අත්සන් කරන ලදි.අදාළ දූත කණ්ඩායම බ්‍රසීලයට යැවීමට අවශ්‍ය කටයුතු කිරීම
- පිලිපීනය සමඟ අත්සන් කිරීමට යෝජිත අවබෝධතා සිහිපත සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගෙන ඇත.
- බංගලාදේශ රජය සමඟ දැනට අත්සන් කර ඇති අවබෝධතා සිහිපත්සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගෙන ඇත.
- ඉන්දියානු-ශ්‍රී ලංකා අවබෝධතා සිහිපතට අනුව ඒකාබද්ධ සහයෝගිතා කමිටු පත්කර ඉදිරි වර්ෂ සඳහා ක්‍රියාකාරී සැලැස්ම සම්පාදනය කිරීම
- ශ්‍රී ලංකාවේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මඟින් ක්‍රියාත්මක කරන ලද අවබෝධතා සිහිපත් වල ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම පිණිසත් ප්‍රගතිය සමාලෝචන කිරීම පිණිසත් රැස්වීමක් පවත්වන ලදි.
- ශ්‍රී ලංකා ජාතික කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව මඟින් ක්‍රියාත්මක වන අවබෝධතා සිහිපත් සඳහා ක්‍රියාත්මක සැලසුම් කිරීම විශේෂ රැස්වීමක් සංවිධානය කර ඇත.
  දැනට අත්සන් කර ඇති ගිවිසුම් පිළිබඳ පවත්නා තත්වය පිළිබඳ වාර්තාවක් පිළියෙල කර අමාත්‍යාංශ ලේකම් වෙත ඉදිරිපත් කර ඇත.

**ජාත්‍යන්තර වෙළඳාමට අදාළ කටයුතු:-**

- SAFTA ගිවිසුමට අදාළ සංවේදී ලයිස්තුවේ ප්‍රමාණය 20% කින් අඩු කිරීමට අදාළ නිර්දේශ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අදාල නිළධාරීන් සමඟ ද සාකච්ඡා කර වාණිජ දෙපාර්තමේන්තුව වෙත ලබා දෙන ලදි.
- ශ්‍රී ලංකාව හා බංග්ලාදේශය අතර ආර්ථික හා කෘෂිකාර්මික කටයුතු පිළිබඳ ඒකාබද්ධ කොමිසමේ රැස්වීමට අදාල තොරතුරු සමඟ සහභාගි විය.
- තීරු බදු පිළිබඳ HS අංක කරණය සංශෝධනය සඳහා අවශ්‍ය නිර්දේශ වෙළඳ තිරු බදු හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව වෙත ලබා දෙන ලදි.
- ආනයන අපනයන පාලන දෙපාර්තමේන්තුව විසින් බලපත්‍ර පාලනයට යටත් කල යුතු අයිතම නීර්ණය කෙරෙමින් පවතින අතර කෘෂිකාර්මික ක්ෂේත්‍රයට අදාල වන්නාවූ ආනයන අපනයන බලපත් ලබාදිය යුතු අයිතම නීර්ණය කිරීමට අවශ්‍ය නිර්දේශ ලබාදෙන ලදි.

## iii.ජාත්‍යන්තර සමුළු හා සැසි

- ජර්මනියේ බර්ලින් නගරයේ පැවති "හතර වන කෘෂිකර්ම අමාත්‍යවරුන්ගේ සැසිය" සහ වියට්නාමයේ පැවති සැසිය සඳහා ගරු ඇමතිතුමා ඇතුළු දූත කණ්ඩායමට සහභාගිවීමට අවශ්‍ය කටයුතු සකසාදීම
- ඊශ්‍රායල් කෘෂිකර්ම අමාත්‍ය ගරු ඔරිට් නොක්ඩ්ගේ නිල ඇරයුම පරිදි ගරු ඇමතිතුමාට ඊශ්‍රායලයේ පැවැත්වූ 18 වන කෘෂිකර්ම ප්‍රදර්ශනය නැරඹීම පිණිස 2012 මැයි 14 දින සිට 18 දින දක්වා සහභාගි වීමට අවශ්‍ය කටයුතු සලසා දීම
- ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ ආසියානු හා පැසිපික් කලාපයේ වෙළඳ ද්‍රව්‍ය පිළිබඳ ප්‍රශ්න සාකච්ඡා කිරීමේ 69 වනකමිටු සැසියට 2012.05.28 සිට 2012.05.30 සක්වා ඉතාලියේදි ද 2012.10.01 සිට 2012.10.02 තායිලන්තයේ බැංකොක් නුවර පැවති ආසියා පැසිපික් කලාපයේ අධික ආහාර මිල ගණන් වලට ප්‍රතිචාර දැක්වීම සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති පිළිබඳ උපදෙස් ලබාගැනීමේ ඉහළ පෙලේ වැඩසටහන සඳහා ද ගරු ඇමතිතුමාට සහභාගී වීමට අවශ්‍ය කටයුතු සලසා දීම
- ආසියානු ඵලදායිතා සංවිධානයේ (APO) සමුළුව සංවිධානය කිරීම
  කාබනික නිෂ්පාදන සහතික කිරීම හා විගණනය යන මැයෙන් වූ පුහුණු වැඩමුළුවක් ශ්‍රී ලංකාව වෙනුවෙන් සංවිධානය කරන ලදි.ආසියානු හා පැසිපික් කලාපයේ රටවල් 10 ක නියෝජිතයින් 24 දෙනෙකු ඊට සහභාගි වූ අතර ඒ සඳහා අවශ්‍ය කටයුතු ඉටු කරන ලදි.(පිරිවැය රුපියල් මිලියන 2.5)

## iv.ගොවිසතිය

මේ සඳහා රු.මි. 10 ක ප්‍රතිපාදන වෙන් වූ අතර මෙහි ප්‍රගතිය 100 % කි.කෘෂිකර්ම දෙපාර්තමෙන්තුවේ සියවස් සැමරුමට සමගාමීව ජාතික ගොවි සතිය වැඩසටහන ගන්නෝරුවේදී පවතිවන ලදි.ගොවි සතිය වැඩසටහනට අදාල ක්‍රියාකාරකම් මෙහිදී සාර්ථකව ඉටු කර ඇත.





**කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ දී පැවති සියවස් ප්‍රදර්ශනය හා ගොවි සතිය.**

## V.තොරතුරු තාක්ෂණ වැඩසටහන්

2012 වසර තුල කෘෂිකර්ම අමාත්‍යාංශය, තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රය තුල ලබාගත් ප්‍රගතිය පහත පරිදිය.

### 1. අමාත්‍යාංශයේ අභ්‍යන්තර පරිගණක ජාලය නිම කිරීම

2011 වසර ආරම්භ වන විට සීමිත පරිගණක සංඛ්‍යාවක් වෙත පමණක් සේවා සැපයූ අමාත්‍යාංශ පරිගණක ජාලය 2012 වර්ෂය අවසාන වන විට අමාත්‍යාංශයේ සියළුම පරිගණක ජාලගතකොට, ජාලගත පද්ධතියකට අදාල වූ අනෙකුත් සේවාවන් ද ස්ථාපිත කොට, මුළුමනින්ම අවසන් කරන ලද අතර මෙමගින් අමාත්‍යාංශයේ ස්ථාන 194 ක් සම්බන්ධීකරණය කර ඇත.අමාත්‍යාංශයේ සියළුම අංශ සඳහා ක්‍රියාත්මක ඩිජිටල් ලිපි ගොනු සේවාවක් ද ,සියළුම පරිගණක යන්ත්‍ර සඳහා අන්තර්ජාල/ ඊ-මේල් පහසුකම් ද ලබා දී ඇත්තේ සියළුම මට්ටම් වල නිලධාරීන්ට තොරතුරු තාක්ෂණය තුලින් වඩා පහසුවෙන් තම රාජකාරි ඉටු කර ගැනීමට අවස්ථාව ලබා දීම පිණිසයි. තව ද විද්‍යුත් තැපැල හරහා වඩා කාර්යක්ෂමව ලිපි යැවීම සඳහා අන්තර්ජාල සම්බන්ධතා වේගය 2012 වසරේදී 8 Mbps දක්වා ඉහල දමන ලදි. තොරතුරු හා දත්ත වල ආරක්ෂාව සහතික කිරීම පිණිස සියළුම පරිගණක යන්ත්‍ර සඳහා ප්‍රති වෛරස් වැඩසටහන් යොදා ඇති අතර පරිගණක ජාලය භාවිතා කරන්නන් සඳහා වෙනම පරිශීලක නාමයන් හා මුර පදද ලබා දී ඇත.

### 2. අමාත්‍යාංශයේ නව නිල වෙබ් අඩවිය නිර්මාණය

2011 වර්ෂයේ අවසානය දක්වා ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනයේ අනුග්‍රහය හා මෙහෙයවීම මත ක්‍රියාත්මක වෙමින් පැවති අමාත්‍යාංශයීය වෙබ් අඩවිය, 2012 වර්ෂයේදී නව තාක්ෂණය ඔස්සේ නැවත ප්‍රති නිර්මාණය කරන ලදි.

අප අමාත්‍යාංශයේ සියළුම අංශයන් විසින් සිදු කරනු ලබන කාර්ය භාරයන් හා සංවර්ධන වැඩසටහන් වල තොරතුරු ද සහිතව නිර්මාණය කර ඇති මෙම වෙබ් අඩවිය හරහා කෘෂිකාර්මික වැඩසටහන් වලට අදාලව ආකෘති පත්‍ර, චක්‍ර ලේඛන, කෘෂිකාර්මික පනත්, සංඛ්‍යාලේඛන තොරතුරු බාගත කර ගත හැක. තොරතුරු තාක්ෂණ ප්‍රතිපත්තීන්ට අනුකූලව සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන භාෂාවන් තුනෙන්ම නිමවා ඇති මෙම වෙබ් අඩවිය ඕනෑම පුරවැසියෙකුට පහසුවෙන් පරිශීලනය කර තොරතුරු ලබාගත හැකිය.

### 3. පරිගණක හා ඊට අදාල උපාංග අළුත්වැඩියාව, නඩත්තුව හා පරිපාලන කටයුතු අඛණ්ඩව සිදු කිරීම

අමාත්‍යාංශයේ පරිගණක යන්ත්‍ර වල මෘදුකාංග හා දෘඩාංග ආශ්‍රිත සියළු අළුත්වැඩියා කිරීමේ කටයුතු 2012 වසරේදී 95% ක ප්‍රමාණයක් තොරතුරු තාක්ෂණ ඒකකය මගින් සිදු කරන ලදි. එමගින් අමාත්‍යාංශයේ පරිගණක සම්පත් කළමනාකරණයට උපරිම ලෙස දායක වීමට හැකි වූ අතර පරිගණක ආශ්‍රිතව පැන නැගෙන තාක්ෂණික දෝෂයන් ඉතා කෙටි කාලයක් තුලදී නිරාකරණය කර දීමට හැකි විය.

### 4. පරිගණක හා ආශ්‍රිත උපාංග මිලදී ගැනීම හා පරිපාලන කටයුතු ක්‍රමවත් කිරීම

පරිගණක හා ඒ ආශ්‍රිත උපාංග මිලදී ගැනීමේදී, ඊට අදාල පිරිවිතරයන් සැකසීම, තොරතුරු තාක්ෂණ ඒකකයේ අධීක්ෂණය යටතේ සිදු කිරීමටද, අදාල භාණ්ඩ වල පිරිවිතරයනට අනුකූල භාවය හා නිවැරදි ක්‍රියාකාරීත්වය පරීක්ෂාකර බලා පමණක් මිලදී ගැනීමට හැකිවන පරිදි ඊට අදාල ක්‍රමෝපායන් සැකසීමද, සිදුකරන ලද අතර පරිගණක සැපයුම්කරුවන් විසින්

සපයනු ලබන මෘදුකාංග නීත්‍යානුකූල පිටපත්ද යන්න තහවුරු කිරීමටද අවශ්‍ය ක්‍රමවේද සකසන ලදී.

**5. කාර්යාලීය කටයුතු සඳහා අවශ්‍ය මෘදුකාංග නිර්මාණය කර දීම**

2012 වසර අවසාන වන විට පහත සඳහන් කර ඇති කාර්යාලීය කටයුතු සඳහා අවශ්‍ය මෘදුකාංග නිර්මාණය කර දෙන ලද අතර ඒ සඳහා දත්ත ඇතුලත් කිරීම පිළිබඳව පුහුණුවද අදාල විෂයයන් භාර නිලධාරීන්ට ලබා දෙන ලදි.

1. ලැබෙන ලිපි වලට අදාල තොරතුරු (තැපැල සඳහා)
2. විදේශ ශිෂ්‍යත්වලාභීන්ගේ තොරතුරු ( පාලන අංශය සඳහා)
3. කාබනික පොහොර නිෂ්පාදකයින්ගේ තොරතුරු (කාබනික පොහොර ඒකකය සඳහා)
4. ප්‍රධාන සැපයුම්කරුවන්ගේ තොරතුරු (ප්‍රසම්පාදන ඒකකය සඳහා)

**6. නිලධාරීන්ගේ පරිගණක සාක්ෂරතාවය ඉහළ නැංවීම**

මේ සඳහා කාර්යාල කාර්යය සහායක හා රියැදුරු මහතුන් 2012 වසරේ තෝරා ගන්නා ලද අතර ඔවුන් සඳහා මූලික පරිගණක පුහුණු වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලදි.

## vi.දිවි නැගුම ව්‍යාපෘතිය

**අරමුණ** - "නිරෝගී හා ආර්ථික වශයෙන් සවිබල ගැන්වූ සමෘද්ධිමත් පවුලක් නිර්මාණය කිරීම."

දිවි නැගුම - IV අදියර යටතේ 2012 වර්ෂය කෘෂිකර්ම අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක ව්‍යාපෘති සඳහා රු.මි.337 ක් වෙන්කර ඇත.මේ යටතේ කරන ලද කාර්යයන් හා ප්‍රගතිය පහත දක්වා ඇත.

| අනු අංක | කාර්යය | භෞතික ප්‍රගතිය | | මූල්‍ය ප්‍රගතිය(රු.) |
|---|---|---|---|---|
| 1. | එළවළු බීජ අඩංගු කට්ටල ලක්ෂ 50 ක් දිවයින පුරා බෙදා හැරීම. | **දිස්ත්‍රික්කය** | **බීජ කට්ටල ලබා දුන් ගෘහ ඒකක සංඛ්‍යාව** | 333,790,280.00 |
| | | කොළඹ | 315,226 | |
| | | ගම්පහ | 561,238 | |
| | | කළුතර | 297,432 | |
| | | රත්නපුර | 323,432 | |
| | | කෑගල්ල | 215,595 | |
| | | කුරුණෑගල | 444,691 | |
| | | පුත්තලම | 200,671 | |
| | | අනුරාධපුර | 222,608 | |
| | | පොළොන්නරුව | 114,197 | |
| | | ගාල්ල | 202,888 | |
| | | මාතර | 174,169 | |

| | | | | |
|---|---|---|---|---|
| | | හම්බන්තොට | 168,365 | |
| | | මොණරාගල | 125,426 | |
| | | බදුල්ල | 190,506 | |
| | | නුවරඑළිය | 185,241 | |
| | | මහනුවර | 304,963 | |
| | | මාතලේ | 128,007 | |
| | | ත්‍රිකුණාමලය | 77,372 | |
| | | මඩකලපුව | 162,754 | |
| | | අම්පාර | 180,963 | |
| | | යාපනය | 187,666 | |
| | | මුලතිව් | 30,779 | |
| | | කිලිනොච්චි | 35,140 | |
| | | මන්නාරම | 14,441 | |
| | | වව්නියාව | 50,794 | |
| | | **එකතුව** | 4,914,564 | |
| | • ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයෙන් හා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙන් කල ඉල්ලීම් වලට අනුව, ත්‍රිකුණාමලය,ගම්පහ හා මහනුවර දිස්ත්‍රික්ක සඳහා සැපයූ අමතර බීජ කට්ටල ප්‍රමාණය - 99,003<br>• මීට අමතරව, රාජ්‍ය ආයතන සඳහා බීජ කට්ටල ලබාදී ඇත. | | | |

# 5. ගොවීන්ගේ භාරකාර අරමුදල

1994 දී ස්ථාපිත කරන ලද ගොවීන්ගේ භාරකාර අරමුදල පහත කරුණු වෙනුවෙන් ක්‍රියාත්මක වේ.

1. ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික සංවර්ධනය හා ගොවිජනතාවගේ සුබසාධනය වැඩිදියුණු කිරීම.
2. සුළු ගොවීන්ට කෙටි කාලීන කෘෂිකාර්මික ණය පහසුකම් සැලසීම.
3. සුළු ගොවීන්ට කෘෂිකාර්මික යෙදවුම් සම්පාදනය.
4. සුළු ගොවීන්ගේ මූල්‍ය දුෂ්කරතාවයන් මගහරවා ගැනීම සඳහා සුළු ගොවියාට වෙළඳපළ ණය පහසුකම් සැපයීම.
5. සුළු ගොවීන්ගේ කෘෂිකාර්මික සංවර්ධනය හා සුබසාධනය සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන්,ප්‍රදර්ශණ,ආදර්ශන හා වෙනත් ක්‍රියාකාරකම් ඇතුළු නියාමක වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
6. බෝග හා සත්ව නිෂ්පාදන ක්‍රියාවලිය මෙන්ම නිෂ්පාදනය පිරිසැකසුම සඳහා සුළු ගොවීන්ට අවශ්‍ය වෙනත් අනුග්‍රහයන් ලබාදීම.
7. කෘෂිකාර්මික සංවර්ධනයට පහසුකම් සැලසීම සඳහා විශේෂ කෘෂිකාර්මික වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

2012 වර්ෂය තුළ ගොවිභාරකාර අරමුදල විසින් කෘෂිකර්ම අමාත්‍යාංශය හා අනුබද්ධ ආයතන, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව සහ පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තු සඳහා සංවර්ධන වැඩසටහන් හා ණය වශයෙන් ප්‍රතිපාදන ලබාදී ඇත.එම ආයතන අනුව මූල්‍ය ප්‍රගතිය පහත දක්වා ඇත.

| අනු අංක | විස්තරය | වියදම් ස්වභාවය | වියදම 2012 (රු.මි) | ප්‍රතිපාදන ලබාදුන් ආයතනය |
|---|---|---|---|---|
| 1. | සියවස් සැමරුම් උත්සවය හා ගොවි සතිය | සංවර්ධන | 20.00 | කෘෂිකර්ම දෙපාර්තමේන් තුව. |
| | **උප එකතුව** | | **20.00** | |
| 2. | දිස්ත්‍රික් මට්ටමින් වප්මඟුල් උත්සව පැවැත්වීම | සංවර්ධන | 0.75 | ගොවිජන සංවර්ධන දෙපාර්තමේන් තුව |
| 3. | පොහොර ගබඩා ඉදිකිරීම | සංවර්ධන | 0.93 | |
| 4. | ග්‍රාමීය සුළු වාරිමාර්ග නඟාසිටුවීමේ ව්‍යාපෘතිය (මාතර,මහනුවර,ගො.ජ.සං.දෙ) | සංවර්ධන | 8.0 | |
| 5. | පොහොර සහනාධාරය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන | සංවර්ධන | 0.02 | |
| 6. | අළුත් සහල් මංගල්‍යය | සංවර්ධන | 1.0 | |
| 7. | උතුරු පළාතේ කෘෂිකාර්මික ක්‍රියාකාරකම් සංවර්ධනය කිරීම. | සංවර්ධන | 12.75 | |
| 8. | අම්පාර දිස්ත්‍රික්කයේ කෘෂි මාර්ග දෙකක් ඉදි කිරීම. | සංවර්ධන | 3.8 | |

| අනු අංක | විස්තරය | වියදම් ස්වභාවය | වියදම 2012 (රු.මි) | ප්‍රතිපාදන ලබාදුන් ආයතනය |
|---|---|---|---|---|
| 9. | ගොම්බද්දල පන්සල අසල ඇති ආරක්ෂිත පැති බැම්ම හා කෘෂි මාර්ග ඉදිකිරීම. | සංවර්ධන | 1.0 | ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව |
| 10. | බණ්ඩාරවෙල හා නුවරඑළිය දිස්ත්‍රික්ක වලට ප්ලාස්ටික් කුඩ බෙදා හැරීමේ වැඩසටහන | සංවර්ධන | 4.2 | |
| 11. | කිලිනොච්චි දිස්ත්‍රික්කයේ සුළු වාරිමාර්ග නඟා සිටුවීමේ වැඩසටහන | සංවර්ධන | 1.0 | |
| 12. | මුතුර්හි ගොවිජන මධ්‍යස්ථානය පිහිටුවීම | සංවර්ධන | 0.94 | |
| 13. | කෘෂි ළිං ඉදිකිරීමේ වැඩසටහන | සංවර්ධන | 20.0 | |
| 14. | උතුරු වසන්තය (යාපනය/වව්නියාව /කිලිනොච්චි) | සංවර්ධන | 1.4 | |
| 15. | නැගෙනහිරනවෝදය(ත්‍රිකුණාමලය/අම්පාර/ මඩකලපුව) | සංවර්ධන | 3.9 | |
| **උප එකතුව** | | | **59.69** | |
| 16. | ලොකු ළූණු වගාව සඳහා වැසි ආවරණ ලබාදීම | සංවර්ධන | 3.9 | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව (මධ්‍යම පළාත) |
| **උප එකතුව** | | | **3.9** | |
| 17. | ගස්ලබු වගාව ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහන | සංවර්ධන | 0.51 | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව (උතුරු පළාත) |
| 18. | රතුළූණු ගබඩා ඉදිරීමට සැලසුම් කිරිම | සංවර්ධන | 1.5 | |
| 19. | උද්‍යාන බෝග නිෂ්පාදනය සඳහා සුදුසු තාක්ෂණය භාවිතය | සංවර්ධන | 0.995 | |
| **උප එකතුව** | | | **3.005** | |
| 20. | පුහුණු කිරිමේ හා දිරිගැන්වීමේ වැඩසටහන | සංවර්ධන | 0.045 | පුහුණු කිරීම හා දිරි ගැන්වීම් |
| **උප එකතුව** | | | **0.045** | |
| 21. | ණය-කෙටි කාලීන ණය | ණය | 362 | - |
| 22. | දිගු කාලීන ණය | ණය | 35.2 | ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව |

| අනු අංක | විස්තරය | වියදම් ස්වභාවය | වියදම 2012 (රු.මි) | ප්‍රතිපාදන ලබාදුන් ආයතනය |
|---|---|---|---|---|
| 23. | ජාතික ආහාර එකතු කිරීමේ මධ්‍යස්ථාන පිහිටුවීම | ණය | 4.0 | ජාතික ආහාර ප්‍රවර්ධන මණ්ඩලය |
| | **උප එකතුව** | | **4.0** | |
| 24. | යතුරු පැදි ණය | ණය | 1.43 | ගොවිජන සංවර්ධන දෙපාර්තමෙන්තුව |
| 25. | යතුරු පැදි ණය | ණය | 1.35 | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව |
| 26. | යතුරු පැදි ණය | ණය | 3.5 | පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව |
| 27. | යතුරු පැදි ණය | ණය | 2.7 | දකුණු පළාත |
| 28. | යතුරු පැදි ණය | ණය | 0.3 | අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව |
| | **උප එකතුව** | | **9.28** | |
| | **මුලු එකතුව** | | **99.920** | |

# 6.අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක ආයතන වල සංවර්ධන වැඩසටහන්/ව්‍යාපෘති.

## *i)* කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

**2012 වර්ෂය සඳහා වෙන් කළ ප්‍රතිපාදන හා මූල්‍ය ප්‍රගතිය (රු. මිලියන)**

| ව්‍යාපෘතිය | | මූලධන (රු.මි.) | | පුනරාවර්ථන (රු.මි.) | | කෘෂිකර්ම දෙපාර්තමේන්තු විශේෂ ව්‍යාපෘති (රු.මි.) | |
|---|---|---|---|---|---|---|---|
| | | ප්‍රතිපාදන | වියදම් | ප්‍රතිපාදන | වියදම් | ප්‍රතිපාදන | වියදම් |
| 1. | පරිපාලන සහ ආයතනික සේවා | 25.7 | 22 | 222 | 221 | - | - |
| 2. | කෘෂිකර්ම පර්යේෂණ සහ සංවර්ධනය | 228.6 | 123 | 773 | 769 | 291.6 | 167.75 |
| 3. | ව්‍යාප්තිය හා පුහුණුව | 63.7 | 55 | 586 | 581 | 61.7 | 61 |
| 4. | බීජ සහතික කිරීම හා පැළැටි සංරක්ෂණය | 76 | 51 | 410 | 409 | 741 | 676 |
| එකතුව | | 394.1 | 251 | 1991 | 1980 | 1094.3 | 904.75 |

**1. සුවිශේෂී පර්යේෂණ අවස්ථා**

**සහල්**

- නව ප්‍රභේද නිකුත් කිරීම
    - Bw 367

      මාස 3 ½ වයස් කාණ්ඩයේ සුදු පැහැති සම්බා ප්‍රභේදයක් වන අතර හෙක්ටයාරයකට ටොන් 7.9ක අස්වැන්නක් ලබාදෙයි. මෙම ප්‍රභේදය යකඩ විෂවීම, කඳ කඩා වැටීම සහ ගෙල පාළුවට වඩාත් ප්‍රතිරෝධී වේ.
    - Ld 368

      තෙත් කලාපයේ දින 105කින් පැසීම සිදුවන්නාවූ රතු,කෙටි රවුම් හැඩැති බීජ වලින් සමන්විත වන්නා වූ ප්‍රභේදයකි. හෙක්ටයාරයකට ටොන් 7ක සාමාන්‍ය අස්වැන්නක් ලබාදේ. මෙම ප්‍රභේදය පත්‍ර ඇඳවැටීමට, ගෙල පාලුවට ප්‍රතිරෝධීතාවක් පෙන්නුම් කරන අතර බැක්ටීරියා පත්‍ර අංගමාරය, ගොක් මැස්සා සහ දුඹුරු පැළ කිඩැවාට සාමාන්‍ය ප්‍රතිරෝධීතාවයක් පෙන්නුම් කරයි. මෙම ප්‍රභේදය කඳ කඩා වැටීමට ප්‍රතිරෝධී වන අතර ධාන්‍ය අවපැහැ ගැන්වීම සිදු නොවේ.
    - Bg 369

      මාස 3 ½ වයස් කාණ්ඩයේ සුදු එලාවරණයක් සහිත ප්‍රභේදයකි. මෙම ප්‍රභේදයේ දිගැති බීජ හැඩයකින් යුක්තවන අතර වියලි කලාපයේ දින 104කින් වී කරල් පැසීම සිදු වේ. ලවණ පසක් සහිත ප්‍රදේශ සඳහා මෙම ප්‍රභේදය නිර්දේශ කෙරේ. ලවණ සහිත පසෙහි හෙක්ටයාරයකට ටොන් 7.0ක වාර්තාගත අස්වැන්නක් ලැබිණි.

- මැතකදී අස්වැන්නෙන් 90%ක පමණ ප්‍රමාණයකට හානියක් සිදු කළ හැකි වී පළිබෝධනාශකයක් ලෙස වී කොපු මායිටාවන් ***(Stenotarsonemusspinkii*Smiley)** හඳුනාගනු ලැබිණි. මයිටාවන් පාලනය කිරීම සඳහා පළිබෝධනාශකයක් ලෙස උපයෝගී කර ගනු ලබන ප්‍රොෆෙනොෆොස් 50EC හී පරිසරයට සහ ඉලක්ක කර නොගන්නා ක්ෂුද්‍ර ජීවීන්ට සිදුවන උග්‍ර බලපෑම සලකා බලමින් මයිටාවන් පාලනය කිරීම උදෙසා තාවකාලිකව නිර්දේශ කරයි.
- ශ්‍රී ලංකාවේ කුඹුරුවල වල් වී පාලනය කිරීමට ඒකාබද්ධ තාක්ෂණික පිළිවෙත් මාලාවක් වැඩිදියුණු කිරීම උදෙසා වූ අධ්‍යයනයන්ගේ ප්‍රතිඵල මඟින් සම්ප්‍රදායික පිළිවෙත් හා සැසඳීමේදී පිරිසිදු බිත්තර වී පෙළට වැපිරීමෙන් වල් වී මතු වීම සහ වර්ධනය සැලකිය යුතු ප්‍රමාණයකින් අඩු වන බවත් වල් වී හේතුවෙන් සිදු වන අස්වනු හානියද අවම බවත් පෙන්නුම් කෙරිණි.
- පත්‍ර වර්ණ සටහන් පදනම් කොට නයිට්‍රජන් පෙහොර යොදා ගැනීම තුළින් අක්කරයකට කි.ග්‍රෑ. 120ක් පමණ වන වර්තමන යූරියා උපයෝගීතාවය 30%කින් අඩු කරමින් නයිට්‍රජන් භාවිතයේ කාර්යක්ෂමතාවය වැඩිවිය. තෙත් සහ වියලි කලාපයේ තත්ත්වයන්ට යෝග්‍ය නව පත්‍ර වර්ණ සටහන් වැඩිදියුණු කරනු ලැබ ව්‍යාප්ති නිලධාරීන්හට ඔවුන්ගේ අදහස් ලබාගැනීම උදෙසා බෙදාහරිනු ලැබිණි.
- ශ්‍රී ලංකා නැනෝ තාක්ෂණ ආයතනය (Sri Lanka Institute of Nanotechnology) මඟින් නිෂ්පාදන කරනු ලැබූ නැනෝ ආකාරයේ නයිට්‍රජන් සහ පොටැසියම් පොහොර යොදා ගැනීම මඟින් අවම වශයෙන් 25%ක් හෝ ඊට වැඩි වශයෙන් යූරියා සහ පොටැසියම් පොහොර යෙදීමේ වර්තමාන මට්ටමේ අවශ්‍යතාවය අඩු කිරීමට අධාරවන බව මූලික නිරීක්ෂණ මඟින් හෙළිදරවු කෙරිණි.
- සහල් නිෂ්පාදනයේදී පාංශු සාරවත් බව සහ පොහොර භාවිතයේ කාර්යක්ෂමතාව ඉහළ දැමීමට සහ කාබනික පොහොර භාවිතය සහ පාරිසරික දූෂණය අවම කිරීමට කාබනික හා අකාබනික පොහොර යන දෙකෙහිම සංයෝජනය වඩාත් උචිත විකල්ප ක්‍රියාමාර්ගයක් බව සොයා ගනු ලැබිණි.
- වල් වී ආක්‍රමණය කර ඇති ප්‍රදේශයේ වල් වී පාලනය කිරීම උදෙසා තාක්ෂණික පිළිවෙත් මාලාවක් හඳුන්වා දෙනු ලැබිණි.
- නෙලන ලද අස්වැන්නෙන් බොල් වී බාගෙට පිරුණු බීජ, වල් බීජ සහ දූහුවිලි අංශු ඉවත් කිරීම උදෙසා අධි ධාරිතාවයකින් යුත්(පැයට කි.ග්‍රෑ. 400) බිත්තර වී පිරිසිදුකරනයක් වැඩිදියුණු කරනු ලැබීය.
- පෙලට බීජ දැම්ම සහ නැවත උඳුරා සිටුවන ලද කුඹුරු ඉඩම්වල දිනකට අක්කර 1.5 ක්ෂෙත්‍රයක වල් ඉවත් කළ හැකි නව පහතරට බලවේග වල් නෙලනයක් වැඩිදියුණු කරනු ලැබීය.

<u>වෙනත් ක්ෂෙත්‍ර බෝග</u>

- නිකුත් කරන ලද නව ප්‍රභේද
  - හෙක්ටයාරයකට ටොන් 4කට වැඩි අස්වැන්නක් ලබාදෙන දින 90ක වර්ධන කාලයක් සහිත විශාල ක්‍රීම් පැහැතිබීජ සහිත සෝයා බෝංචි ප්‍රභේදයකි. (MISB – 1)
- ප්‍රභේද අනුවර්තන අත්හදා බැලීම් පැවැත්වීමෙන් පසු PC – 01 සහ ICPN වරනය යන බලාපොරොත්තු තැබිය හැකි අමුමිරිස් අභිජනන ආර 2ක් හඳුනා ගනු ලැබීය. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ බීජ සහතිකකරණ සේවයට විශේෂත්වය, ඒකාත්මිකතාවය සහ ස්ථායීතාවය පරීක්ෂා කිරීම උදෙසා මෙම බලාපොරොත්තු තැබිය හැකි ආරවල බීජ ඉදිරිපත් කරනු ලැබිණි.

- විදේශිය ලොකු එණු ආර 21ක් පරීක්ෂා කරනු ලැබ බලාපොරොත්තු තැබිය හැකි ආර 2ක් හඳුනා ගනු ලැබීය.
- ඉන්දුනීසියාවෙන් ලැබූ විවෘත පරාගණ බඩඉරිඟු ප්‍රභේද 3ක් ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අනුවර්තන අත්හදා බැලීම් යටතේ උසස් අස්වනු අත්හදා ලැබීම් හි අගයනු ලැබීය. ගොවි ක්ෂෙත්‍රවල ප්‍රභේද අනුවර්තන අත්හදා ලැබීම් සිදු කිරීම උදෙසා (Srikandiruning, "MIOPVI")ප්‍රභේදයක් තෝරාගනු ලැබිණි.
- බලාපොරොත්තු තැබිය හැකි කුරක්කන් එකතුන් 4ක් ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම් යටතේ පරීක්ෂා කරනු ලැබ ගොවි ක්ෂෙත්‍රවල ප්‍රභේද අනුවර්තන අත්හදාබැලීම් සිදු කිරීම උදෙසා තෝරා ගනු ලැබිණි.
- බලාපොරොත්තු තැබිය හැකි මුං ප්‍රභේද 4ක් (MICP 111, MICP 113, MICP 114 සහ MICP 539 – 17) ගොවි ක්ෂේත්‍රවල හිදි ප්‍රභේද අනුවර්තන අත්හදාබැලීම් උදෙසා පරීක්ෂා කරනු ලැබු අතර තෝරා ගත් ආර විශේෂඥතාව, ඒකාත්මිකතාව සහ ස්ථායීතාවය පරීක්ෂාවට යටත් කරනු ලබයි.
- බෝග මුල් අවස්ථාවේදී සිදුවන පළිබෝධහානිය පාලනය කිරීමේදී තියාමෙතොසාම් 70% WS සහ ඉමිඩක්ලොප්‍රිඩ් 70% WS සමඟ ප්‍රතිකර්මය වඩාත් ඵලදායී බව සොයා ගනු ලැබිණි.
- මිරිස් බෝගයේ රසායනික නයිට්‍රජන් පොහොර අවශ්‍යතාව අවම කිරීම උදෙසා ග්ලිරිසීඩියා පත්‍ර සමඟ රසායනික පොහොර ඒකාබද්ධව යොදා ගැනීම පරීක්ෂා කරනු ලැබිණි. පරීක්ෂණ මඟින් හෙක්ටයාරයකට ග්ලිරිසීඩියා ටොන් 6ක් යෙදීම මගින් මිරිස් බෝගයට අවශ්‍ය රසායනික නයිට්‍රජන් පොහොර අවශ්‍යතාවය 25%කින් අඩුකළ හැකිබව ප්‍රතිඵල මඟින් පෙන්නුම් කෙරිණි. පැල සිටුවීමට සතියකට පෙර මෙම ප්‍රමාණයෙන් භාගයක්ද ඉතිරි ප්‍රමාණය පැල සිටුවා සති 4කට පසුද යොදනු ලැබිය හැක.
- රෝද හතරේ ට්‍රැක්ටරයක් මගින් බලය ජනනය වන අඩි 8ක උපරිමව උසකට එසවිය හැකි මිනිත්තුවට ලීටර 20000ක ධාරිතාවයකින් යුක්ත අඟල් 12 දියයට ගිල්විය හැකි ආක්ෂීය ප්‍රවාහ ජල පොම්පයක් වැඩිදියුණු කරනු ලැබිණි.
- විශාල භූමි සඳහා රෝද හතරේ ට්‍රැක්ටරයට ඇදන ලද විදුම් පැල සිටුවනය, රෝද දෙකේ ට්‍රැක්ටරය මඟින් ක්‍රියාත්මක වන චක්‍රීයව සවිකළ ගොඩබිම වල් නෙලනය සහ වගුරු ඉඩම් සඳහා පැල සිටුවනයක් වැඩිදියුණු කරනු ලැබීය.

<u>උද්‍යාන බෝග</u>

- නිකුත් කළ නව ප්‍රභේද
    - දේශීයව වැඩිදියුණු කළ F1 දෙමුහුම් පිපිඤ්ඤා ප්‍රභේදය (HORDI Green F1)
    - හොඳින් වර්ධනය වු මුල් ආකන්ධය, දිගු නටුවක් සහ පොත්ත ආකර්ෂණීය පැහැයකින් යුතු වැඩි අස්වැන්නක් ලබාදෙන මයියොක්කා ප්‍රභේදය (HORDI Mu 1)
    - තෙත් හා අතරමැදි කලාපයන් සඳහා නිර්දේශිත නාරටි විචිත්‍ර වෛරසයට ප්‍රතිරෝධී වැඩි අස්වැන්නක් ලබාදෙන බණ්ඩක්කා දෙමුහුම්
    - සැපදිල්ලා ප්‍රභේද 2 (***Manilkarazapota***) HoS12 සහ HoS13
    - වෙරළු ප්‍රභේද 4 (***Elaeocarpusserratus )*** HoW 5, HoW 7, HoW 9 සහ HoW 13
    - "හොරණ ජම්බෝ" සහ "හොරණ ගෝල්ඩ්" යන දූරියන් ප්‍රභේද 2 (***Duriozibethinus***) සහ "හොරණ ටිකිරි" සහ "හොරණ යෙලෝ" නමින් හඳුන්වන තවත් දූරියන් ප්‍රභේද 2ක් කොන්දේසි සහිතව නිදහස් කරනු ලැබිණි.

- සාම්ප්‍රදායික ක්‍රමවේදයන්ට සාපේක්ෂව අඩු පාරිසරික බලපෑමක් සහිතව අර්තාපල් පලිබෝධකයන් ඵලදායී කළමනාකරණය සඳහා පිළිවෙත් මාලාවක් අඩංගු පැකේජයක් වැඩිදියුණු කරනු ලැබිණි.
- කොමඩු මැස්සා සහ පළතුරු මැස්සා පාලනය සඳහා ප්‍රදේශයේ ඒකාබද්ධ පළිබෝධ කළමනාකරණය (AW – IPM) වඩාත් සාර්ථක බව හඳුනාගනු ලැබුණු අතර රටපුරා නිදර්ශනය කිරීම මගින් ගොවීන් අතර තාක්ෂණය බෙදාහරිනු ලබයි.
- පාංශු දිලීර පරපෝෂිතයින් පාලනය කිරීමට ආමුකූලනයක් ලෙස ***Trichoderma***Spp එම ස්ථානයෙන් වෙන්කර වානිජමය වශයෙන් ස්පටික ආකාරයට සකස් කිරීම ඵලදායී ජෛව පාලන ක්‍රමයක් ලෙස මෙන්ම ශාක වර්ධන උත්ප්‍රේරකයක් ලෙසද හඳුනාගනු ලැබ ඇත.
- හඳුනාගනු ලැබූ නව පළිබෝධහානි
    - වට්ටක්කා වල මුදුපුල්ලි වෛරස් රෝගය
    - කොස්, පැඟිරි, අනෝදා වල ශිඝ්‍ර පසුමැරීම සඳහා කාරක ජීවියා ලෙස***Lasiodiplodiatheobromae***හඳුනා ගනු ලැබිණි. කාබෙන්ඩසිම් 500g/ l SCසහ ටෙබාකොනසොල 250g / I EW 2m1/l ක සාන්ද්‍රණය සහ කාබෙන්ඩසිම් 50% WP 2g/l සාන්ද්‍රණය, ජීවියා පාලනය කිරීමට වඩාත් ඵලදායී දිලීරනාශකය ලෙස හඳුනා ගනු ලැබිණි.

**වෙනත්**

- ශ්‍රී ලංකාවේ නියං උපද්‍රව පැතිකඩක් වැඩිදියුණු කිරීම.
- පහතරට තෙත් කලාපයේ සහල් නිෂ්පාදන ඵලදායීතාවය වැඩි කිරීම උදෙසා භූමි විශේෂිත නිර්දේශයන් වැඩිදියුණු කිරීම.
- අධිවිභේදන ඡායාරූප පදනම් කොට ගෙන කුඹුරු ඉඩම් ප්‍රමාණය සහ අස්වැන්න පිළිබඳ අනාවැකි පැවසීම.

## 2. මූලික බීජ නිෂ්පාදන හා ගුණාත්මක ප්‍රවර්ධන වැඩසටහන

2012 වර්ෂය තුළදී නිකුත් කරන ලද බීජ ප්‍රමාණය පහත දැක්වේ

| කන්නය | **2011/2012** මහ | **2012** යල |
|---|---|---|
| 2. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කළ වී බීජ ප්‍රමාණය (ටොන්) | | |
| අත්තිවාරම් බීජ | 52.13 | 42.82 |
| ලියාපදිංචි බීජ | 1156.43 | 832.34 |
| සහතිකකළ බීජ | 904.64 | 323.94 |
| වානිජ බීජ | 112.20 | - |
| හදිසි අවශ්‍යතා සඳහා බීජ | 4378.41 | - |
| 2.1. ජාතික වී අවශ්‍යතාවයෙන් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මඟින් සපුරාලන ප්‍රතිශතය. | | |
| අත්තිවාරම් බීජ | 115.9% | 135.6% |
| ලියාපදිංචි බීජ | 64.2% | 65.8% |
| සහතිකකළ බීජ | | 0.6% |
| වානිජ බීජ | | - |

| | | |
|---|---|---|
| හදිසි අවශ්‍යතා සඳහා බීජ | 7.5% | - |
| 3. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් නිකුත් කළ බීජ ප්‍රමාණය. | | |
| අමු මිරිස්(Kg) | **75** | **3614** |
| රතු ළූනු (Kg) | **-** | **-** |
| ලොකු ලූනු (Kg) | **2** | **-** |
| අර්තාපල් (Kg) | **294550** | **93900** |
| කව්පි (Kg) | **6696** | **14875** |
| මුං ඇට (Kg) | **87935** | **80053** |
| බඩඉරිඟු (Kg) | **25363** | **10953** |
| උඳු (Kg) | **23306** | **20185** |

2012 වර්ෂයේ බීජ සහතික කරන වැඩසටහනේ ප්‍රගතිය පහත දැක්වේ

| වැඩසටහන | ප්‍රගතිය | |
|---|---|---|
| | ප්‍රභේද සංඛ්‍යාව | ප්‍රමාණය (මෙ. ටො) |
| **අභිජනන බීජ සහතිකරණය** | | |
| වී | 30 | 6.24 |
| එළවළු | 22 | 0.29 |
| අනෙකුත් ක්ෂෙත්‍ර බෝග | 22 | 2.04 |
| පලතුරු | 1 | 0.0007 |
| එකතුව | 75 | 8.58 |
| **සහතිකකරණ වැඩසටහන** | | |
| වී | 6446.29 | 14386.9 |
| අනෙකුත් ක්ෂෙත්‍ර බෝග | 969.82 | 356.61 |
| එළවළු | 182.78 | 49.88 |
| අර්තාපල් | 72.57 | 749.99 |
| **එකතුව** | **7671.46** | **15542.60** |

**3.2012 වර්ෂය තුළදී දෙපාර්තමේන්තුව මගින් සිදු කරන ලද කෘෂිකාර්මික ව්‍යාපෘති ක්‍රියාවලියෙහි ප්‍රගතිය**

**කෘෂිකාර්මික ව්‍යාප්තිය**

**අන්තර්පළාත් ප්‍රදේශ**

- අන්තර්පළාත් ප්‍රදේශවල වගා කරන ලද වී සහ වෙනත් ක්ෂෙත්‍ර බෝග බිම් ප්‍රමාණය පහත වගුවෙහි පෙන්නුම් කරයි.(අම්පාර, අනුරාධපුර, හම්බන්තොට, මොණරාගල, පොළොන්නරුව සහ මහනුවර යන දිස්ත්‍රික්කයන්හි කොටස්)

| බෝගය | 2011/12 මහ (හෙක්ටයාර) | 2012 යල (හෙක්ටයාර) |
| --- | --- | --- |
| වී | 184,206 | 124,645 |
| ක්ෂේත්‍ර බෝග යටතේ වගාකළ බිම් ප්‍රමාණය | 7,299 | 13,136 |

ජලාශයන්හි ජල හිඟය හේතු කොට ගෙන ඉලක්කගත බිම් ප්‍රමාණය වගා කළ නොහැකි වුවද, නිෂ්පාදනය සැලකිය යුතු අඩු වීමක් වාර්තා නොවිණි.

**කෘෂි ව්‍යවසාය සංවර්ධන හා තොරතුරු සේවාව**

- කුලියාපිටිය, බුත්තල, අයගම, හල්මිල්ලවැව, බලංගොඩ  සහ වව්නියා යන ප්‍රදේශවල නව කෘෂිසේවා පියස 6ක් විවෘත කරනු ලැබීය.
- ගොවිපළ ව්‍යාපාර පාසලේහි ප්‍රධාන පුහුණුකරුවන් ලෙස දිස්ත්‍රික්ක 10ක ව්‍යාපෘති නිලධාරීන් 108 දෙනෙකු පුහුණු කරනු ලැබීය. මෙම ව්‍යාපෘතිය යටතේ පසු අස්වනු තාක්ෂණය විශේෂයෙන් සහල් පදනම් නිෂ්පාදන පිළිබඳව කාන්තා ගොවීන් 885 දෙනෙකු පුහුණු කරනු ලැබීය.

**කාන්තා කෘෂිකාර්මික ව්‍යාපෘති ක්‍රියාවලින්**

- යාපනය, වව්නියා, මුලතිව්, කිළිනොච්චි සහ මන්නාරම් දිස්ත්‍රික්කයන්හි පසු අස්වනු තාක්ෂණය, අදායම් උත්පාදනය සහ පවුල් පෝෂණය පිළිබඳව කාන්තා ගොවි කණ්ඩායම් හට ආධාර කිරීමේ අරමුණ ඇතිව ලෝක ආහාර වැඩසටහන යටතේ පසු අස්වනු සහායක ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරනු ලැබීය.

**කෘෂිකාර්මික පුහුණුව**

ගොවීන්, පාසල් සිසුන්, කෘෂිකර්ම දෙපාර්තමේන්තු, සේවා සංස්කරණ පුහුණු මධ්‍යස්ථාන 3, දිස්ත්‍රික්ක කෘෂිකාර්මික පුහුණු මධ්‍යස්ථාන 4 සහ ගොවිපළ යාන්ත්‍රික පුහුණු මධ්‍යස්ථානය යන ආයතනයන්හි නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන් 623ක් පවත්වනු ලැබිණි.

**කෘෂිකාර්මික අධ්‍යාපනය**

- කෘෂිකර්ම විද්‍යාල වල ශිෂ්‍ය ශිෂ්‍යාවන් 202 දෙනෙකු කෘෂිකර්ම ඩිප්ලෝමාවන් ලබාගත් අතර ශිෂ්‍ය ශිෂ්‍යාවන්485 දෙනෙකු පුහුණු කරනු ලැබීය.
- 2012 වර්ෂය තුළදී කෘෂිකර්ම පර්යේෂණ සහ නිෂ්පාදන සහකාරවරුන් 112 දෙනෙකු වාර්ෂික පුහුණුවක් සම්පූර්ණ කරනු ලැබීය.
- ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ ක්ෂෙත්‍ර සහකාරවරුන් 39 දෙනෙකු සඳහා වාර්ෂික ප්‍රායෝගික කෘෂිකර්ම සහතිකපත්‍ර පාඨමාලාවක් පවත්වනු ලැබිණි.

**කෘෂිකාර්මික තොරතුරු හා සන්නිවේදනය**

- ගන්නෝරුව ජාතික කෘෂිකර්ම තොරතුරු මධ්‍යස්ථානයක් ඉදිකිරීම සඳහා මුල්ගල තැබිණි.
- ශ්‍රව්‍ය, දෘෂ්‍ය මධ්‍යස්ථානය මගින් රූපවාහිනි වැඩසටහන් 98ක් නිෂ්පාදනය කරනු ලැබ රූපවාහිනිය ඔස්සේ විකාශනය කරනු ලැබිණි.
- ශත සංවත්සර ප්‍රකාශන වශයෙන් නව  පොත් 5ක් ප්‍රකාශයට පත් කරනු ලැබ, මෙයින් පිටපත් 30,000ක් කෘෂිකර්ම ප්‍රකාශන ඒකකයේ මුද්‍රණය කරනු ලැබිණි. මෙයට අමතරව

වෙනත් කෘෂිකාර්මික තාක්ෂණ පොත් හා පත්‍රිකා (පිටපත් 23406) පොස්ටර් (191,300), සහතික (33,962), පුවත්පත් සඟරා (33650), ලියුම් (43450)ක් මුද්‍රණය කරනු ලැබිණි.

- ගොවිපල ව්‍යාපාර පාසල මඟින් කෘෂිකර්මය පිළිබඳ ගුවන් විදුලි වැඩසටහන් 1440ක් ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව, රජරට සේවය, වයඹ හඬ ,රන්ගිරි FM සහ කඳුරට සේවය මඟින් විකාශය කරනු ලැබිණි.
- ගොවි සහනසරණ සෘජු දුරකථන උපදේශක සේවාව යටතේ (දුරකථන අංකය 1920) ගොවි ගැටලු 50000 සඳහා දුරකථනය මඟින් විසඳුම් ලබාදුන් අතර ස්කයිප් (Skype) හරහා ගැටළු 60කටද විද්‍යුත් තැපැල් හරහා 400කටද විසඳුම් ලබාදුණි.
- ගන්නෝරුව ශත සංවත්සර සැමරීම හා ඔයාමඩුව දැයට කිරුළ උදෙසා ප්‍රදර්ශන ස්ථාන 2ක් සැලසුම් කරනු ලැබිණි. මෙම තරඟයේ අඛණ්ඩව 7වන වරටත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව පළමු ස්ථානය ලබාගත්තේය.
- වෙබ් අඩවි 3 නඩත්තු කිරීම, යාවත්කාලීන කිරීම සහ සමීක්ෂණය
    1. www.agridept.gov.lk
       2008 වසරේ "e-world" තෑගි ප්‍රදානයේ රජයේ හොඳම වෙබ් අඩවිය විය.
    2. www.govia.lk
       2009 වසරේදී "e –Swabimani"ප්‍රදානය, 2009 වසරේ ඉන්දියාවේ මන්තන් ප්‍රදානය සහ ලෝක සමුළු ප්‍රදානයේ ලෝකයේ හොඳම විද්‍යුත් අන්තර්ගතය (e-content) සහ නිර්මාණශීලීත්වයට උදෙසා පිරිනමන වඩාත් ගෞරවාදරයට පාත්‍ර වූ ප්‍රදානය වන "කයිරෝ 2011" ප්‍රදානය
    3. www.krushilanka.lk
       ශ්‍රී ලංකාවේ සම්පූර්ණ කෘෂි බෝග අංශය සම්බන්ධ කෘෂිකර්මාන්ත තොරතුරු මෙම වෙබ් අඩවියේ සමන්විත වේ.

## 4. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව යටතේ පවත්නා බෝගවල ඵලදායීතාවය ප්‍රවර්ධනය උදෙසා වූ යෝජනා

- ප්‍රභේද වැඩිදියුණු කිරීම.
- පොහොර භාවිතයේ කාර්යක්ෂමතාවය ඉහළ දැමීම.
- පිරිවැය අඩුකිරීම උදෙසා කෘෂිකාර්මික ක්‍රියාවලීන්හි යාන්ත්‍රිකරණය ඉහල දැමීම.
- ගුණාත්මක තත්ත්වයෙන් ඉහල බීජ හා රෝපණ ද්‍රව්‍ය සැපයීම.
- ඒකාබද්ධ කෘෂිකාර්මික කළමනාකරණ ක්‍රම උපයෝගී කර ගැනීම.

<u>වී</u>

- ඉලක්කයන් ලබාදෙමින් ක්ෂෙත්‍ර නිලධාරීන් පුහුණු කිරීම සහ ඔවුන්ගේ කාර්යසාධනය වැඩි කිරීම උදෙසා ශක්තිමත් සමීක්ෂණ පද්ධතියක් අනුගමනය කිරීම
- තෝරාගත් ගොවීන් පුහුණුකිරීම
- කාබනික ද්‍රව්‍ය යොදාගැනීම ප්‍රවර්ධනය

<u>වෙනත් ක්ෂෙත්‍ර බෝග</u>

- ගුණාත්මක තත්ත්වයෙන් ඉහළ බීජ භාවිතය
- වාරි හා වාර්ෂාපෝෂිත තත්ත්වයන් යටතේ ජෛවීය සහ අජෛවීය සාධක හට අනුවර්තනය පෙන්නුම් කරන්නා වූ වැඩි අස්වැන්නක් ලබාදෙන වඩාත් උසස් වෙනත් ක්ෂේත්‍ර බෝග ප්‍රභේදයන් වැඩිදියුණු කිරීම

- හැකි සෑම අවස්ථාවකම වාරික්‍රමයක් යටතේ අදාල නිසිකාලයට වගා කිරීම (දෙමුහුම් සහ විවෘත පරාගන ප්‍රභේද)
- ගොවීන්ගේ තත්ත්වයන් සඳහා ගැලපෙන ආකාරයට පාංශු හා ජල සංරක්ෂණ ක්‍රමවේද ප්‍රවර්ධනයන් ගොවීන් හට ව්‍යාප්ත කිරීම
- භූමියේ ඵලදායීතාව වැඩි කරන අතරම නිෂ්පාදන පිරිවැය අඩුකිරීමේ කාර්යක්ෂම කෘෂි පිළිවෙත් මාලාවක් වැඩිදියුණු කිරීම හා ව්‍යාප්ත කිරීම
- යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම තුළින් වඩාත් ඵලදායී ලෙස ගොවි අවශ්‍යතා සපුරාලීමට හැකි වන පරිදි ආයතනික හැකියාව වැඩිදියුණු කිරීම
- පළිබෝධකයින් හේතුවෙන් සිදුවන බෝග හානිය අවම කිරීම උදෙසා නිර්දේශිත පළිබෝධනාශක (දිලීරනාශක හා කෘමිනාශක) නියමිත මාත්‍රාවෙන් නියමිත කාලයට භාවිතා කරමින් ඒකාබද්ධ පළිබෝධ කළමනාකරණ පිළිවෙත් වැඩිදියුණු කිරීම
- පසු අස්වනු හානිය අවම කරමින් අස්වැන්නට වැඩි අගයක් ලබාදීම ප්‍රවර්ධනය කරමින් අවශ්‍ය සහයෝගය ලබාදීම
- ගොවීන් තම නව තාක්ෂණයන් ව්‍යාප්ත කිරීම උදෙසා විධිමත් ක්‍රම භාවිතා කිරීම

<u>පළතුරු</u>

- ගුණාත්මක තත්ත්වයෙන් ඉහළ බීජ හා රෝපණ ද්‍රව්‍ය ලබාගත හැකිබව වැඩිකිරීම
- ඉහළ අස්වනු ලබාදෙන නව ප්‍රභේද හඳුන්වාදීම
- පූර්ව / පසු අස්වනු සහ ඉහළ වටිනාකමක් ලබාදීම උදෙසා වූ තාක්ෂණ ප්‍රවර්ධනය සහ ව්‍යාප්ත කිරීම

<u>එළවළු</u>

- ගුණාත්මක තත්ත්වයෙන් ඉහළ බීජ හා රෝපණ ද්‍රව්‍ය ලබාගත හැකි බව වැඩිකිරීම
- පූර්ව / පසු අස්වනු සහ ඉහළ වටිනාකමක් ලබාදීම උදෙසා වූ තාක්ෂණ ප්‍රවර්ධනය සහ ව්‍යාප්ත කිරීම
- නව වගා කලමනාකරණ පිළිවෙත් හඳුන්වාදීම සහ වගාකරන භූමි ප්‍රමාණය ඉහළ දැමීම
- වැඩි අස්වනු ලබාදෙන නව ප්‍රභේද/ දෙමුහුම් හඳුන්වාදීම

## 5. උද්‍යාන භෝග අංශය සංවර්ධනය උදෙසා සිදුකළ ක්‍රියාදාමයන් පිළිබඳ කෙටි සටහනක් සහ එහි ප්‍රගතිය

- මුල් හා ආකන්ධ බෝගවල සියලුම නිර්දේශ ප්‍රභේදයන්හි මූලික රෝපණ ද්‍රව්‍ය 50,000ට වැඩි ප්‍රමාණයක් විවිධ සේවා දායකයන් අතර බෙදා හැරීම
- කොම්පෝස්ට් අඛණ්ඩව යෙදීම පිළිබඳ පරීක්ෂණයේ 25වන කන්නයේ ප්‍රතිපල අනුව කාබනික පොහොර සහ රසායනික පොහොර යන දෙකම ඒකාබද්ධව යෙදීම එළවළු නිෂ්පාදනයට ඉතාමත් උචිතය.
- ක්ෂේත්‍රයේ සහ ගබඩාවන්හි අර්තාපල් ආකන්ධ සළඹයාසමීක්ෂණය උදෙසා යොදා ගත හැක(Detroit Dark red2'cristal',රෙඩ් ස්ටාර් සහ AXRB462F1)ගෝවා ප්‍රභේද (CBS153,සුපර් ග්‍රීන් සහ සුදු ගෝවා-බාලශී සහ සුදු ගෝවා-Bandung)මල් ගෝවා ප්‍රභේද (රොකී,බාල්වානි,White Flash, Milkyway andCandid Chams) උඩරට තෙත් කලාපීය තත්ත්වයන්හිදී පලිබෝධ සහ රෝගවලට ප්‍රතිරෝධීතාවය සහ අස්වැන්න සම්බන්ධයෙන් මෙම ප්‍රභේද උචිත ආකාරයෙන් ක්‍රියා කරයිද යන්න පරීක්ෂා කරන ලදි.

- මෘදු වයනයක්,රසයක් සහ යුෂමය මාංශල බවකින් යුත් ඉහල බ්‍රික්ස් අගයක් සහිත අනෝදා (***Annonamuricata***)ප්‍රභේදයකින් රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය වෙමින් පවතී.මෙම ප්‍රභේදය පැලකර වසර 5ට පසුව ගසකට ඵල 29ක සාමාන්‍ය අස්වැන්නක් ලබාදීමට හැකියාවක් ඇත.
- උද්‍යාන භෝග ආයතනයේ බලාපොරොත්තු තැබියහැකි ප්‍රතිඵල ලබාදෙන්නා වූ පැපොල් දෙමුහුම් වර්ග 2ක් ශ්‍රී ලංකාවේ විවිධ කෘෂි පාරිසරික කලාප වලදී ඇගයීම උදෙසා වර්තමානයේ බීජ නිෂ්පාදනය කෙරෙමින් පවතී.
- දේශීය අඹ ප්‍රභේදවල මව් ශාකයෙන් වෙන් වූ නොමේරූ කලල වෙන්කර ආරක්ෂාකාරී අයුරින් වර්ධන කිරිම උදෙසා සුදුසු ප්‍රශස්ත තත්ත්වයන් ලබාදෙන්නාවූ ක්‍රියා පටිපාටියක් වැඩි දියුණු කිරීමේ වැඩසටහනක් ආරම්භ කරනු ලැබීය. ජීවානුහරණ ක්‍රියාවලිය උපරිම කරනලැබූඅතර වැඩසටහන අඛණ්ඩව ක්රියාත්මක වෙමින් පවතී.

### 6.කෘෂිකාර්මික අංශය සංවර්ධනය කිරීම උදෙසා වසර තුළදී එළඹුණු ප්‍රතිපත්තිමය තීරණ

ආහාර බෝග අංශය සංවර්ධනය පහසු කිරීම උදෙසා වසර තුළදී ව්‍යුහාත්මක සංශෝධනයන් සිදු කරණු ලැබිය.දැනට පවතින දිස්ත්‍රික් ලේකම් කාර්යාලීය පරිපාලනමය ව්‍යුහය යටතේ සෑම දිස්ත්‍රික්කයකටම කෘෂිකර්ම දිස්ත්‍රික් අධ්‍යක්ෂකවරුන්ද සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකටම සහකාර අධ්‍යක්ෂවරුන්ද පත් කරනු ලැබිණි.

කෘෂිකර්ම අමාත්‍යාංශය සහ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මඟින් කලාපීය සංවර්ධනය උදෙසා ලබා දෙන අරමුදලේ මුදල් හි ඵලදායීතාවය වැඩිකිරීමේ අරමුණු ඇතිව මෙම ව්‍යුහාත්මක වෙනස්කම් සිදු කරනු ලැබීය.

## *ii) ශ්‍රී ලංකා හදබිම අධිකාරිය*

ශ්‍රී ලංකා හදබිම අධිකාරිය මගින් 2012 වර්ෂය තුළ ආරම්භ කරන ලද කෘෂිකාර්මික සංවර්ධන වැඩසටහන් යටතේ මහාභාණ්ඩාගාර මූල්‍ය ප්‍රතිපාදන මත ක්‍රියාත්මක කරන ලද ප්‍රධාන සංවර්ධන වැඩසටහන මහනුවර,මාතලේ, කුරුණෑගල,රත්නපුර,කෑගල්ල යන දිස්ත්‍රික්ක තුළද කෘෂිකර්ම අමාත්‍යාංශ මූල්‍ය ප්‍රතිපාදන මත ක්‍රියාත්මක කරන ලද විශේෂ සංවර්ධන ව්‍යාපෘති,වවුනියාව,යාපනය,මොණරාගල,නුවරඑළිය,කිළිනොච්චි,මුලතිව්,මන්නාරම,අනුරාධ පුර, පොලොන්නරුව යන දිස්ත්‍රික්කවල ද ක්‍රියාත්මක කරන ලදි.

ඒ අනුව මහාභාණ්ඩාගාර මූල්‍ය ප්‍රතිපාදන මත ක්‍රියාත්මක කරන ලද ප්‍රධාන සංවර්ධන වැඩසටහන, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 29 ක් ආවරණය වන පරිදි ගොවි පවුල් 12000 ක් සහභාගි කරගනිමින් හෙක්ටයාර් 3750 ක භූමි ප්‍රමාණයක් සංවර්ධනය කිරීම ඉලක්ක කරගනිමින් ක්‍රියාත්මක කරන ලදි.

මෙම වර්ෂය තුළ ක්‍රියාත්මක කරන ලද සියළුම කෘෂිකාර්මික සංවර්ධන වැඩසටහන් මගින් මහින්ද චින්තන ඉදිරි දැක්මට අනුව දේශීය ආහාර සුරක්ෂිතාවය තහවුරු කරමින් ස්වභාවික සම්පත් තිරසාර ලෙස කළමණාකරණය සඳහා ප්‍රමුඛතාවයක් ලබාදීමට කටයුතු කර ඇත.

<u>ක්‍රියාත්මක කරන ලද ප්‍රධාන වැඩසටහන්</u>

- <u>පාංශු සංරක්ෂණ හා දියබෙත්ම කළමණාකරණය</u>

2012 වර්ෂයට අදාළව පාංශු ඛාදනය හා හායනයට වන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 22 ක් තෝරා මහාභාණ්ඩාගාර මූල්‍ය ප්‍රතිපාදන මත මෙම වැඩසටහන ක්‍රියාත්මක කරන ලදි.මෙහිදි අධිකාරිය මගින් ලබා දෙනු ලබන නිර්ණායකයන්ට අනුකූලව වසම් තෝරා යෙදවිය හැකි ප්‍රතිපාදන ප්‍රමාණයට අනුව අදාල ග්‍රාම නිළධාරි වසම් තුළ පාංශු සංරක්ෂණ කටයුතු සිදු කරන ලදි.ඒ අනුව 2012 වර්ෂයේ ගොවි පවුල් 12000 ක් හා හෙක්ටාර 3750 ක භූමි ප්‍රමාණයක් ඉලක්ක කරගනිමින් ක්‍රියාත්මක කරන ලදි.

1.ප්‍රජා සහභාගීත්ව ග්‍රාමීය සංවර්ධන සැළසුම්කරණය

සංවර්ධන වැඩසටහන් සඳහා ඉලක්ක කරනු ලබන ගම්මානවලට අවශ්‍ය කෘෂිකාර්මික සංවර්ධන සැළසුම් එම ගම්මානවල ප්‍රජාවන්ගේ සහභාගීත්වයෙන් සකස් කර ගැනීම අරමුණු කරගනිමින් ග්‍රාම නිළධාරී වසම් මට්ටමින් ප්‍රජා සහභාගීත්ව ගැමි පිවිසුම් වැඩසටහන්66 ක් ක්‍රියාත්මක කර ඇත.

2.සමාජ සජීවිකරණ වැඩසටහන

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 29 ක ගොවිපවුල් 12000 ක් ඉලක්ක කරගනිමින් ක්‍රියාත්මක කරන ලද සංවර්ධන වැඩසටහන් වඩාත් ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය ග්‍රාමීය නියෝජනය ලබාගැනීම අරමුණු කරගනිමින් ග්‍රාමීය මට්ටමින් ව්‍යාපෘති සම්බණ්ධීකරණය කිරීම සඳහා ග්රාමීය තරුණ තරුණියන් 255 ක් සමාජ සජීවිකාරකයින් ලෙස හඳුනා ගන්නා ලදි.

3.පාංශු සංරක්ෂණ කටයුතු සඳහා කෘෂි උපකරණ ලබාදීම

පාංශු සංරක්ෂණ කටයුතු සඳහා ගොවි ප්‍රජාව අනුගත කර ගැනීම සඳහා සියළුම පවුල් ඒකක සඳහා කෘෂි උපකරණ ලෙස උදළුතල 8500 ක් ලබාදීමට කටයුතු කරන ලදි.

4.පාංශු සංරක්ෂණ ක්ෂේත්‍ර පුහුණු වැඩසටහන්

පාංශු සංරක්ෂණ කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා ක්ෂේත්‍රයේ ගොවි ප්‍රජාව දැනුවත් කර පුහුණු කිරීම සඳහා මෙම වැඩසටහන ක්‍රියාත්මක කරන ලදි.

5.පාංශු සංරක්ෂණ කටයුතු සඳහා දිරි දීමනා ලබා දීම

පාංශු සංරක්ෂණ කටයුතු විධිමත් ලෙස ඉටු කරනු ලබන ගොවින් සඳහා දිරි දීමනා ගෙවීමට කටයුතු කරන ලදි.2012 වර්ෂයේ ලැබුණු මහා භාණ්ඩාගාර ප්‍රතිපාදන මත මුදල් ගෙවීම සිදු කලේ රු.මි.7.015 කි.ගෙවීම් සිදු කිරීමට ඇති ඉතිරි මුදල 2013 වර්ෂයෙන් ගෙවීම් සිදු කිරීමට නියමිතය.මෙහිදි පාංශු සංරක්ෂණ ක්‍රම අනුගමනය කරමින් ගල් වැටි මීටර 402,726.9 ක් ද,ජීව වැටි මීටර 883,335.5 ක් ද,කුට්ටි කාණු මීටර 739,054.4 ක් ද ,පස් වැටි මීටර 54,505 ක් ද සකස් කර ඇත.

| **පාංශු සංරක්ෂණ ක්‍රමය** | **දිග ප්‍රමාණය (දික් අඩි)** | **ස්වභාවික සම්පත් කළමණාකරණ ආයතනයේ මිල ගණන් අනුව (රු.මි.) වටිනාකම** | **ගෙවන ලද මුදල (රු.මි.)** | **ගොවි දායකත්වය** |
|---|---|---|---|---|
| ගල් වැටි | 402729 | 59.6 | 24.6 | 80% |
| ජීව වැටි | 88336 | 4.0 | | |
| කුට්ටි කාණු | 739054 | 53.2 | | |
| පස් වැටි | 54505 | 3.5 | | |
| නෙත්ති කාණු | 1250 | 0.8 | | |
| **එකතුව** | **1285874** | **121.1** | | |

6.පාසැල් පාදක සංරක්ෂණ ආදර්ශන වැඩසටහන

2012 වර්ෂයේ පාංශු සංරක්ෂණ වැඩසටහන ක්‍රියාත්මක කරන ලද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයන්හි පාසැල් පාදක පාංශු සංරක්ෂණ ආදර්ශන වැඩසටහනක් ද ක්‍රියාත්මක කරන ලදි.එමගින් පාසැල් ළමුන් පාංශු සංරක්ෂණය පිළිබඳව දැනුවත් කරන ලද අතර පාසලෙහි පාංශු සංරක්ෂණ ඒකකයක් සකස් කරන ලදි.

2012 වර්ෂයේ පාසැල් 29 ක් ඉලක්ක කොට මෙම වැඩසටහන ක්‍රියාත්මක කළ අතර ,පාසැල් 12 ක පාංශු සංරක්ෂණ ආදර්ශන වැඩසටහන සාර්ථකව ක්‍රියාත්මක විය.මෙහි මූල්‍ය ප්‍රගතිය රු.මි. 0.210 කි.

- ආදර්ශ ගොවිපල ඒකක සංවර්ධනය

ශ්‍රී ලංකා හදබිම අධිකාරියට සම්බන්ධ ගොවි ප්‍රජාව සඳහා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා ආදායම් උත්පාදනය කළ හැකි ලෙස කොත්මලේ හා පල්ලෙකැලේ ආදර්ශ ගොවිපලවල් 02 ක් පවත්වා ගෙන යනු ලබයි.

මෙම ගොවිපලවල් තුළ පාංශු සංරක්ෂණ ආදර්ශන ඒකක සත්ත්ව පාලනය,බෝග වගාව,පැළ තවාන් කටයුතු කරනු ලබයි. පල්ලෙකැලේ ගොවිපල ආශ්‍රිතව කුකුල් පැටව් පෝෂණ ඒකකයක් පවත්වා ගෙන යනු ලබයි.රුපියල් මිලියන 5.68 ක් වැය කර පල්ලෙකැලේ ගොවිපල නඩත්තු කටයුතු කරන ලද අතර එම ගොවිපල තුළ 2012 වර්ෂය තුළ ආදායම රුපියල් මිලියන 5.92කි. කොත්මලේ ගොවිපල සංවර්ධනය හා නඩත්තු කටයුතු සඳහා 2012

වර්ෂය තුළ වැය කරන ලද මුදල රු. 2.39 ක් වන අතර එම ගොවිපල තුළින් 2012 වර්ෂයේ ලබා ගෙන ඇති ආදායම රුපියල් මිලියන 1.82කි.

- ගෙවතු කළමණාකරණය හා බෝග විවිධාංගීකරණය

2011 වර්ෂයේ පාංශු සංරක්ෂණ කටයුතු සාර්ථක ලෙස ඉටුකරන ලද ඉඩම් දායක කරගනිමින් 2012 වර්ෂයේ ගෙවතු වගා සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කරන ලද අතර,එම අරමුණ සඵල කරගැනීම සඳහා පහත සඳහන් ක්‍රියාකාරනම් ගොවි ප්‍රජාවගේ සහභාගීත්වයෙන් ක්‍රියාත්මක කරන ලදි.

| ක්‍රියාකාරකම | 2012 වර්ෂය ප්‍රගතිය | | | |
|---|---|---|---|---|
| | භෞතික ඉලක්කය (වැඩසටහන්) | භෞතික ප්‍රගතිය | මූල්‍ය ඉලක්ක (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය (රු.මි.) |
| 1.විෂයානුබද්ධ තාක්ෂණික පුහුණු වැඩසටහන | 50 | 68 (සහභාගි වූ ගොවීන් 4537) | 0.250 | 0.230 |
| 2.ප්‍රජා සහභාගිත්ව පැළ තවාන් වැඩසටහන | 45 | 25 (සහභාගි වූ ගොවීන් 4537) | 0.270 | - |
| **3.රෝපණ ද්‍රව්‍ය ලබාදීම** | 3022 | 3022 | 3.071 | 2.247 |
| **4.අර්ධ ගෘහාශ්‍රිත කුකුල් පාලන වැඩසටහන** | 3000 | 3000 | 0.9 | 0.898 |

**<u>ශ්‍රී ලංකා හදබිම අධිකාරිය මඟින් ක්‍රියාත්මක කරන ලද විශේෂ ව්‍යාපෘති</u>**

1.රණවිරු දායකත්ව ඉඩම් හා බෝග සංවර්ධන වැඩසටහන

කිලිනොච්චි,වව්නියාව,මන්නාරම,අම්පාර,පොළොන්නරුව යන දිස්ත්‍රික්කයන්හි යුධ හමුදා කඳවුරු 30 ක් ආවරණය වන පරිදි අක්කර 1000 ක කෘෂිකර්ම සංවර්ධන වැඩසටහන් ඉලක්ක කර ගනිමින් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වූ, අතර 2012 වසරේ අත්කර ගත් ප්‍රගතිය පහත දැක්වේ.

| උප ක්‍රියාකාරකම | 2012 වර්ෂය ප්‍රගතිය | | | |
|---|---|---|---|---|
| | භෞතික ඉලක්ක (වැඩසටහන්) | ප්‍රගතිය | මූල්‍ය ඉලක්ක (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය(රු.මි.) |
| 1.මූලික කෘෂි යටිතල පහසුකම් සංවර්ධනය | 25 | 25 | 1.25 | 0.09 |
| 2.කෘෂි උපකරණ ලබාදීම | 25 | 25 | 2.75 | 1.13 |
| 3. කෘෂි යන්ත්‍රෝපකරණ ලබාදීම | 02 | 02 | **0.**5 | 0.41 |
| 4.කෙටිකාලීන බෝග වගා වැඩසටහන | 300 | 150 | 0.4 | 0.46 |
| 5.මධ්‍ය කාලීන හා ස්ථාවර බෝග වගා වැඩසටහන | 100 | 100 | 2.5 | 0.1 |
| 6.කෙටිකාලීන බෝග වගා වැඩසටහන | 10 | 03 | 0.25 | 0.090 |
| 7.තාක්ෂණික පුහුණු වැඩසටහන් සංවිධානය | 01 | **-** | 0.2 | |

| | | | | |
|---|---|---|---|---|
| කිරීම | | | | |
| 8.නාම පුවරු සකස් කිරීම | | | 0.1 | |
| 9.පරිපාලන වියදම් | | | 0.276 | 0.19 |

2.අතිරේක ආහාර බෝග සංවර්ධන ව්‍යාපෘතිය

2012 වසරේ මොණරාගල දිස්ත්‍රික්කයේ වැල්ලවාය හා තණමල්විල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ තුළ ගොවි පවුල් 1000 ක අක්කර 1000 ඉලක්ක කර ගනිමින් ක්‍රියාත්මක කරන ලද අතර විශේෂයෙන් අතිරේක ආහාර බෝග වන රටකජු ,මුං ඇට,කව්පි,බඩ ඉරිඟු යන බෝග වගා කටයුතු කරන ලදි.

| උප ක්‍රියාකාරකම | 2012 වර්ෂය ප්‍රගතිය | | | |
|---|---|---|---|---|
| | භෞතික ඉලක්ක (වැඩසටහන්) | ප්‍රගතිය | මූල්‍ය ඉලක්ක (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය(රු.මි.) |
| 1.තාක්ෂණික පුහුණු වැඩසටහන් සංවිධානය | 06 | 06 | 0.06 | 0.05 |
| 2.කෘෂි උපකරණ ලබාදීම | 1000 | 1006 | 0.75 | 0.73 |
| 3. බීජ හා රෝපණ ද්‍රව්‍ය ලබාදීම | 1000 | 895 | 5.96 | 3.50 |
| 4.තාක්ෂණික පුහුණු කම්කරුවන්ගේ සේවය ලබා ගැනීම | 02 | 02 | 0.32 | 0.15 |
| 5.ප්‍රවාහන වියදම් | - | - | 0.04 | 0.03 |
| 6. පරිපාලන වියදම් | - | - | 0.12 | 0.10 |

3.සමෝදානික කෘෂි ඉඩම් සංවර්ධන ආදර්ශ ගම්මාන ව්‍යාපෘතිය

ශ්‍රී ලංකා හදබිම අධිකාරියේ දැනට ක්‍රියාත්මක කරන ලද සියලුම වැඩසටහන් එකම ගම්මානයක් තුළ ක්‍රියාත්මක කරමින් කෘෂිකාර්මික සමෝදානික ආදර්ශ ගම්මානයක් වලපනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ඉතා දුෂ්කරම ගම්මානයක් වන කන්දයාය ගම්මානය තුළ ක්‍රියාත්මකකරන ලදි.

| උප ක්‍රියාකාරකම | 2012 වර්ෂය ප්‍රගතිය | | | |
|---|---|---|---|---|
| | භෞතික ඉලක්ක (වැඩසටහන්) | ප්‍රගතිය | මූල්‍ය ඉලක්ක (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය(රු.මි.) |
| 1.ප්‍රජා සහභාගිත්ව ගැමි පිවිසුම | 02 | 02 | 0.02 | 0.02 |
| 2.සජීවිකාරකයින් පුහුණු කිරීම | 01 | 01 | 0.12 | 0.12 |
| 3. පාංශු සංරක්ෂණ කටයුතු පිළිබඳ ක්ෂේත්‍ර පුහුණුව | 02 | 02 | 0.02 | 0.01 |
| 4.ගොවිපලින් බැහැර පාංශු සංරක්ෂණ කටයුතු | 500 | | 0.05 | |
| 5.කෘෂි උපකරණ ලබා දීම | 350 | 120 | 0.26 | 0.25 |
| 6. පාංශු සංරක්ෂණය කටයුතු සඳහා ගෙවීම් කටයුතු | 300 | 205.25 | 0.9 | 0.62 |
| 7.කෙටිකාලීන බෝග වගා වැඩසටහන | 300 | 205.25 | 0.12 | 0.12 |

| | | | | |
|---|---|---|---|---|
| 8.මධ්‍ය කාලීන හා ස්ථිර බෝග වගා වැඩසටහන | 300 | 205.25 | 0.35 | 0.26 |
| 9.කාබනික පොහොර නිෂ්පාදන වැඩසටහන | 350 | 141 | 0.17 | 0.04 |
| 10.මී මැසි පාලන වැඩසටහන | 100 | 100 | 0.09 | 0.08 |
| 11.ජල මූලාශ්‍ර තුළ සංරක්ෂණ වන වගාව | | | 0.10 | 0.003 |
| 12.තාක්ෂණික පුහුණු කම්කරුවන්ගේ සේවය ලබා ගැනීම | 01 | 01 | 0.2 | 0.12 |
| 13.මාධ්‍ය කටයුතු | - | - | 0.02 | |
| 14.පරිපාලන වියදම් | - | - | 0.07 | 0.05 |

### *iii.*හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය

වර්තමාන කෘෂි කර්මාන්තයේ ප්‍රධානතම අභියෝගය වනුයේ කෘෂි ව්‍යාපාරයක් වශයෙන් එය ඉදිරියට ගෙන යාමයි. ඒ සඳහා ගොවියාගේ ආදායම වියදමට සාපේක්ෂව වැඩිකල යුතුය. මේ සඳහා සමාජ ආර්ථික ගැටළු කෙරෙහි වැඩි අවධානයක් යොමු කල යුතුය. 1972 අංක 05 දරණ පාර්ලිමේන්තු පනතින් ස්ථාපනය කරන ලද ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ (1995 වර්ෂයේදී හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය ලෙස නම් කරන ලදී) සමාජ ආර්ථික විද්‍යාඥයින් විසින් සිදුකරන සමාජ ආර්ථික පර්යේෂණ මේ සම්බන්ධයෙන් අතිශයින් වැදගත් වේ. එකී පර්යේෂණ මගින් සමාජ ආර්ථික ගැටළු විසඳීමට අවශ්‍ය නව දැනුම ජනනය කිරීම සිදුවේ.

<u>වගුව 1 :භෞතික ප්‍රගතිය - පර්යේෂණ</u>

| පර්යේෂණ ප්‍රගතිය | 2011 (රු.මි) | 2012 (රු.මි) |
|---|---|---|
| අවසන් කළ අධ්‍යයන | 12 | 25 |
| 75% අවසන් කළ අධ්‍යයන | 04 | 05 |
| 75% අඩු අවසන් කළ අධ්‍යයන | - | 08 |
| මුළු අධ්‍යයන සංඛ්‍යාව | 16 | 38 |

<u>වගුව 11 : මුල්‍ය ප්‍රගතිය - පර්යේෂණ හා පුහුණු</u>

| විස්තරය | 2011 | 2012 | 2011 | 2012 |
|---|---|---|---|---|
| | ලැබීම්(රු.මි) | | වියදම(රු.මි) | |
| භාණ්ඩාගාර වෙන් කිරීම | 24.0 | 17.0 | 23.9 | 13.98 |
| වෙනත් ආයතන මඟින් ලැබීම් | 3.46 | 10.65 | 3.14 | 8.93 |
| එකතුව | 27.46 | 27.65 | 26.04 | 21.91 |

## <u>2012 වසරේ සිදුකරන ලද අධ්‍යයන කීපයක සොයාගැනිම් හා නිර්දේශ</u>

අධ්‍යයන 25 ක් අවසන් කර ඇති අතර තෝරාගත් අධ්‍යයන 06 ක සොයාගැනීම් සහ නිර්දේශ පහත දැක්වේ.

### 1. හම්බන්තොට දිස්ත්‍රික්කයේ රජයේ ඉඩම් පාලනය සහ සේවා සැපයීම පිළිබඳ අධ්‍යයනය

සේවාලාභීන්ගේ භුක්තියට යටත්ව පවතින ඉඩම් වලින් 30% ක් අනවසර ඉඩම් බව අනාවරණය විය. සේවා සැපයීමේදී රාජ්‍ය අංශයේ ආයතන හා නිලධාරීන්ගේ ක්‍රියාත්මක වීමේ හා ක්‍රියාවලිවල අකාර්යක්ෂමතාවයන් පවතින බව සේවාලාභීන් විසින් හෙළිකර ඇත. දත්ත පද්ධතියක් ගොඩ නැගීම එය මාසිකව යාවත්කාලීන කිරිම, ප්‍රාදේශීය මට්ටමෙන් තීරණ ගෙන ලිපිගොනු කටයුතු අවසන් කිරිම යෝජනා කරන ලදි.

### 2. කොන්ත්‍රාත් ගොවීන් හරහා සිදුවන දේශීය එළවලු බීජ නිෂ්පාදන ක්‍රියාවලිය හා එහි වත්මන් තත්වය පිළිබඳ අධ්‍යයනය

බොහෝ ගොවීන් සුළු පරිමාණ (අක්කර 0.25 – 0.5) ගොවීන් වන අතර ඔවුන් මුහුණපා ඇති ප්‍රශ්න වලට විසඳුම් ලෙස කෘෂිකර්ම දෙපාර්තමෙන්තුවේ කාර්යභාරය ප්‍රභල කිරීම,රජයේ

කොන්ත්‍රාත් බීජ නිෂ්පාදන වැඩසටහනට පුළුල් ප්‍රචාරයක් ලබා දීම, සහතික කල බීජ සඳහා ගෙවන මුදල වැඩිකිරීම සහබීජ නිෂ්පාදනය ව්‍යාප්ත කිරීම නිර්දේශ කර ඇත.

### 3. සහල් සැකසුම් ගම්මාන ව්‍යාපෘතිය ඇගයීම

අධ්‍යයනයට ලක්වූ සහල් නිෂ්පාදකයින්ගෙන් 47% ක් වෙළඳපොල සඳහා සහල් නිෂ්පාදනය කරන බව අනාවරණය විය.ගුණාත්මක තත්තවයේ සහල් පරිභෝජනය දිරිගැන්වීම සඳහා මෙම තාක්ෂණය කෘෂි ව්‍යාප්ති සේවා හරහා දිවයින පුරා ව්‍යාප්ත කිරීම, ඉල්ලුම මත පදනම් වෙමින් කණ්ඩායම් ප්‍රවේශයන් ඔස්සේ පුහුණු වැඩසටහන් දියත් කිරීම,කර්මාන්තයක් ලෙස ප්‍රවර්ධනය සඳහා පුද්ගල ප්‍රවේශයන් අනුගමනය කිරීම,ආදිය උපයෝගි කරගත යුතු බවට යෝජනා ඉදිරිපත් කරන ලදී.

### 4. උතුරු පළාත තුල කෘෂිකර්මාන්තය මත පදනම් වූ ජීවනෝපායන් හා දායක අනුග්‍රහය පිළිබඳ අධ්‍යයනය

මෙම අධ්‍යයනය තුළින් ඉහල අස්වනු ලබාදෙන බිජ නොමිලේ ලබාදීම තුලින් නිෂ්පාදනය වැඩිවී ඇති බව,ගොවින් බීජවල ගුණාත්මය පිළිබඳ සැහිමට පත්ව ඇති බව,ඉඩම් අයිතිය පිළිබඳ ගැටලු හේතුවෙන් ණය ලබා ගැනීම බාධවක් වී ඇති බව හෙළි විය. මධ්‍යකාලීන හා දිගුකාලීන වශයෙන් ජීවනෝපායන් සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම,ජනතාවට බැංකු කටයුතු පිළිබඳ අධ්‍යාපනයක් ලබා දීම සහකාන්තා මූලික ගෘහස්ථ හා වැඩිහිටි ජන කොටස්වල අවශ්‍යතා හඳුනාගෙන ඔවුන්ට උචිත ආදයම් උත්පාදන අවස්ථා ලබාදීමට පියවර ගැනීම අධ්‍යයනය මගින් නිර්දේශ කර ඇත.

### 5. හදබිම අධිකාරිය මගින් ක්‍රියාත්මක කරන ලද පාංශු සංරක්ෂණ වැඩසටහන ඇගයීම පිළිබඳ අධ්‍යයනය

ව්‍යාපෘති කාලය තුල පාංශු සංරක්ෂණ කටයුතු කෙරෙහි ගොවින් යොමුවිම ඉහල මට්ටමක පැවතියද ව්‍යාපෘති කාලයෙන් පසුව ගොවීන්ගේ ඒ පිළිබඳ අවධානය ක්‍රමයෙන් ගිලිහෙන බව හෙලිවිය. එම නිසා පාංශු සංරක්ෂණ ක්‍රම භාවිත කිරීම සඳහා ගොවින්ගේ ආකල්පමය වෙනසක් ඇති කිරීමට ප්‍රමාණවත් කාල සීමාවක් දක්වා පසු විපරම් කටයුතු ප්‍රාදේශිය නිලධාරින් මගින් ඉටු කිරීමටත් රජයේ වෙනත් ප්‍රතිලාභ සඳහා මෙය අවශ්‍යතාවයක් බවට පත්කිරීමටත් නිර්දේශ ඉදිරිපත් කර ඇත.

### 6. බස්නාහිර පළාතේ පළතුරු පරිභෝජනය පිළිබඳ අධ්‍යයනය

කුටුම්භයක පළතුරු සඳහා වැය කරනුයේ ආහාර සඳහා වැයකරන මුදලින් ඉතාමත් සුළු ප්‍රමාණයක් (3%) බවද අධ්‍යයනයට ලක්කල පාරිභෝගිකයින්ගෙන් 50% පරිභෝජනයේ ප්‍රතිලාභ පිළිබඳ දැනුවත් භාවයකින් යුක්ත බවද පළතුරු පරිභෝජනයේ අඩුමට්ටමක පැවතීමට හේතුව පළතුරු ඉදවීමට යොදාගන්නා ක්‍රමය සම්බන්ධයෙන් ඇති අකමැත්ත බවද හෙළි විය. අධ්‍යයනයේ නිර්දේශ වශයෙන් පාරිභෝගිකයා අපේක්ෂිත ගුණාත්මක හා රසයෙන් යුතු පළතුරු ලබා දීමට ප්‍රතිපත්ති රජය විසින් ඇති කල යුතු බවද පළතුරු පරිභෝජනයේ ඇති පෝෂණමය හා සෞඛ්‍යමය වටිනාකම පිළිබඳවත් දිනකට අවම වශයෙන් ගතයුතු පළතුරු ප්‍රමාණය පිළිබඳවත් මහජනතාව දැනුවත් කිරීම සිදුවිය යුතු බවත් ඉදිරිපත් කර ඇත.

## ***iv.ජාතික ආහාර ප්‍රවර්ධන මණ්ඩලය***

2012 වර්ෂය සඳහා ජාතික ආහාර ප්‍රවර්ධන මණ්ඩලය මගින් ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් ගණනාවක් වන අතර,මේ සඳහා කෘෂිකර්ම අමාත්‍යාංශය (අපි වවමු-රට නගමු)වැඩසටහන යටතේ ,ගොවි භාරකාර අරමුදල සහ ආයතනයේ ස්ව-මුදල් ප්‍රතිපාදන වශයෙන් යොදා ගන්නා ලදි.

<u>අමාත්‍යාංශය මූල්‍ය ප්‍රතිපාදන ව්‍යාපෘති</u>

1.දේශීය ආහාර ප්‍රචලිත කිරීමේ ව්‍යාපෘතිය

මේ සඳහා රු.මි. 2.99 ක ප්‍රතිපාදන වෙන් වූ අතර රු.මි.1.23 ක මූල්‍ය ප්‍රගතියක් අත් විය.මේ යටතේ වැඩසටහන් 19 ක් ක්‍රියාත්මක කල අතර සහභාගී වූ ප්‍රතිලාභීන් සඳහා සුවපෝෂ සහ සහල් පිටි ලබා දීම සිදු කෙරුණි.

2.ගොවිපොළ සංවර්ධනය ව්‍යාපෘති

- බුත්තල ගොවිපොළ සංවර්ධනය ව්‍යාපෘති
- තණමල්විල ගොවිපොළ සංවර්ධනය ව්‍යාපෘති
- වඩ්ඩකච්චි ගොවිපොළ සංවර්ධනය ව්‍යාපෘති

මේ සඳහා ප්‍රතිපාදන රු.මි. 13.68 ක් වෙන් වූ අතර මෙහි ප්‍රගතිය රු.මි. 8.41 කි.දෙහි,පැගිරි ,අඹමිරිස් හා පැපොල් වගා කිරීම,දේශීය වී වගා කිරීම,වගා උපකරණ අලුත් වැඩියාව,අලි වැට ඉදිකිරීම හ කෘෂි ළිං ගැඹුරු කිරීම ආදිය සිදු කර ඇත.

<u>ගොවි භාරකාර අරමුදල මගින් ලබා ගන්නා ලද මුදල් මගින් ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක ව්‍යාපෘති</u>

<u>1.ආහාර නිෂ්පාදනය එකතු කිරීමේ මධ්‍යස්ථානය</u>

මෙහිදී රු.මි. 5.0 ක් වෙන් කර තිබූ අතර රු.මි.0.59 ක මූල්‍ය ප්‍රගතියක් අත්කර ගෙන ඇත.වී කි.ග්‍රෑම් .9523.5 ක් මිලදී ගැනීම සිදු කර ඇත.

<u>2.සහල් පිටි නූඩ්ල්ස් කර්මාන්ත ශාලාව ඇතිකිරීම</u>

මේ සඳහා රු.මි. 8.78 ක ප්‍රතිපාදන වෙන් වූ අතර දිස්ත්‍රික්ක ඉඩම් පරිහරණ කමිටු අනුමැතිය මත මේ සඳහා ඉඩම් වෙන් කරන ලදි.

<u>3.සහල් පිටි නූඩ්ල්ස් ප්‍රවර්ධන ව්‍යාපෘතිය-උපකරණ මිලදී ගැනීම</u>

රු.මි. 2.5ක ප්‍රතිපාදන වෙන්වූ අතර ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භ කර ඇත.

ස්වයං-මූල්‍ය ප්‍රතිපාදන ව්‍යාපෘති

| රු.මි. 2.5ක ප්‍රතිපාදන වෙන් වූ අතර ප්‍රවර්ධන_ව්‍යාපෘතිය | වියදම (රු .මි) | ආදායම (රු .මි) | ලාභය(රු .මි) |
|---|---|---|---|
| පැලතවාන - නාරහේන්පිට | 6.45 | 7.9 | 1.45 |
| කෘෂි නිෂ්පාදන අලවිසැල - නාරහේන්පිට | 20.331 | 19.559 | -0.772 |
| කෘෂි නිෂ්පාදන අළෙවිසැල දෙහිවල | 58.719 | 63.619 | 4.9 |
| විලමුල්ල බිම කර්මාන්තශාලාව | 0.595 | 0.11 | -0.485 |
| සහල් පිටි ප්‍රවර්ධන ව්‍යාපෘතිය-වැවිලි අංශය | 15.38 | 14.65 | -0.73 |
| සුවපෝෂ ව්‍යාපෘතිය | 0.78 | 0.56 | -0.22 |
| සුවදැල් ස්ලෝ ෆුඩ් භෝජනාගාරය | 7.741 | 6.125 | -1.616 |
| **මුළු එකතුව** | **109.996** | **112.523** | **2.527** |

## *V.ශ්‍රී ලංකා ජාතික කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව*

**2012 වර්ෂයේ ආයතනය විසින් ඉටු කරන ලද සමස්ථ කාර්යභාරය**

| වියදම් විස්තරය | රු.මි. |
|---|---|
| මුලූ ප්‍රාග්ධන වෙන් කිරීම | 30.0 |
| 2012.12.30 දිනට භාණ්ඩාගාර ලැබීම් | 19.955 |
| 2012.12.31 දිනට සත්‍ය වැය | 18.756 |
| වර්ෂය තුල මූල්‍ය ප්‍රගතිය | 95.94% |

1987 අංක 47 දරණ ශ්‍රී ලංකා ජාතික කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව පිහිටුවීමේ පණතින් පැවරුන කාර්යභාරය සහ කෘෂි පර්යේෂණ ක්ෂේත්‍රයේ ජාතික ප්‍රමුඛතා පදනම් කරගෙන 2012 කාර්යයන් සැලසුම් කරන ලදි. එම කාර්යයන් පහත දැක්වේ.

1.ජාතික කෘෂිකාර්මික පර්යේෂණ සැලැස්ම

මහින්ද චින්තන ඉදිරි දැක්මේ ප්‍රමුඛතා අනුපිලිවෙල සහ ජාතික කමිටුව විසින් හඳුනාගන්නා ලද පර්යේෂණ ප්‍රමුඛතා පදනම් කරගෙන ජාතික කෘෂිකාර්මික පර්යේෂණ සැලැස්ම 2012 සම්පාදනය කරන ලදි.ඒ අනුව ජාතික කෘෂිකාර්මික පර්යේෂණ ආයතනවල පර්යේෂණ ව්‍යාපෘති 133 ක් ජාතික කමිටු හරහා තක්සේරු කර කෘෂිකර්ම අමාත්‍යාංශයට හා මහා භාණ්ඩාගාරයට වාර්තා කර ඇත.

2. කෘෂිකාර්මික පර්යේෂණ සඳහා සහාය දීමේ වැඩසටහන

පනතින් කියම කර ඇති කාර්යභාරය තුළ ජාතික කෘෂිකාර්මික පර්යේෂණ පද්ධතියේ පර්යේෂණ ව්‍යාපෘති/කාර්යයන් සඳහා සභාව ක්‍රියාකාරීව සහය ලබා දෙයි.ඒ වෙනුවෙන් කෘෂිකාර්මික පර්යේෂණ ආධාර අරමුදලක් පිහිටුවා තිබේ.එමගින් ජාතික කෘෂිකාර්මික පර්යේෂණ පද්ධතියට ඇතුලත් ආයතන වෙත විද්‍යාත්මක කෘෂි උපකරණ ලබා දී තිබේ.

3.සම්මන්ත්‍රණ,සම්මේලන හා පාර්ශවයන් අතර සාකච්ඡා

2012.12.11 දින ශ්‍රී ලංකා ජාතික කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව විසින් එහි 25 වැනි වර්ෂ පූර්ණය වෙනුවෙන් ඉකුත් වර්ෂ 25 තුළ සභාවේ දායකත්වය ඇගයුමට ලක් කෙරුණි.

තවද කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාවේ මල්වගා පර්යේෂණ හා සංවර්ධනය පිළිබඳ ජාතික කමිටුව හා ජාතික වනෝද්‍යාන දෙපාර්තමේන්තුව ඒකාබද්ධව 2012.12.17 දින පේරාදෙණිය මල්වත්ත ශ්‍රවනාගාරයේදී මල්වගාව පිළිබඳ 5 වැනි ජාතික සමුළුව පැවැත්විණි.

4.සම්පූර්ණ කරන ලද වෙනත් කාර්යයන්

2012 පෙබරවාරි 4 -12 දක්වා අනුරාධපුර ඔයාමඩුව පැවති දැයට කිරුළ ජාතික උත්සවයට සහභාගිවීම,ප්‍රදර්ශන කුටියක් ඉදි කිරීම හා කෘෂිකර්ම පර්යේෂණ ප්‍රමුඛතා ප්‍රකාශන පලකිරීම සිදු කරන ලදි.

## *vi.පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනය.*

- **ව්‍යාපෘතිය : ඇසුරුම් ගෘහ තාක්ෂණය මගින් එළවළු පලතුරු වල පසු අස්වනු හානිය අවම කිරීම.**

| **වෙන් කල මුදල (රු.මි)** | **මූල්‍ය ප්‍රගතිය (රු.මි)** | **ප්‍රතිශතය** | **භෞතික ඉලක්කය** | **භෞතික ප්‍රගතිය** |
|---|---|---|---|---|
| 1.9 | 1.420 | 4.73% | ආදර්ශ ඇසුරුම් ගෘහ 03 ක් නියමු ව්‍යාපෘතියක් ලෙස ක්ෂේත්‍රය වෙත හඳුන්වා දීම හා ප්‍රතිලාභීන් 225ක් පුහුණු කිරීම. | ආදර්ශ ඇසුරුම් ගෘහ 03ක් බ්ලැක්පූල් නුවරඑළිය, කිරිබත්කුඹුර, මහනුවර හා ඇටවීරගොල්ලෑව, මැදවච්චිය, අනුරාධපුරය ප්‍රදේශවල ප්‍රතිලාභීන් තුන් දෙනෙක් සඳහා හඳුන්වාදී ඇත. මෙම ප්‍රදේශවල 269 දෙනෙකු පුහුණුකර ඇත. ආදර්ශ ඇසුරුම් ගෘහයක් ආයතනය තුල ස්ථාපිත කර ඇත. |

- **ව්‍යාපෘතිය : පසු අස්වනු තාක්ෂණ ආදර්ශ ගම්මාන ස්ථාපිත කිරීම**

| **වෙන් කල මුදල(රු.මි)** | **මූල්‍ය ප්‍රගතිය (රු.මි)** | **ප්‍රතිශතය** | **භෞතික ඉලක්කය** | **භෞතික ප්‍රගතිය** |
|---|---|---|---|---|
| 3.0 | 2.061 | 68.7% | පසු අස්වනු තාක්ෂණ ආදර්ශ ගම්මාන 06 ක් පිහිටුවීම. ඔවුන්ට අවශ්‍ය යෙදවුම් ලබාදීම හා ප්‍රතිලාභීන් 120 ක් පුහුණු කිරීම. | ප්‍රතිලාභීන් 141 දෙනෙක් පුහුණු කර ඇත. පසු අස්වනු තාක්ෂණය ආදර්ශ ගම්මාන 06 ක් සාලිය අශෝකපුර - කුරුණෑගල, බිසෝබණ්ඩාරපුර - පොළොන්නරුව, නුවරඑළිය, ගෝණගල - අම්පාර, වැලිපිටිමෝදර - ගාල්ල, උල්ලල - මාතර පිහිටුවා ඇත. |

- **ව්‍යාපෘතිය :මධ්‍ය හා කුඩා පරිමාණයේ සහල් පිටි සැකසීමේ මෝල් වල පහසුකම් වැඩි දියුණු කිරීම**

| **වෙන් කල මුදල (රු.මි)** | **මූල්‍ය ප්‍රගතිය (රු.මි)** | **ප්‍රතිශතය** | **භෞතික ඉලක්කය** | **භෞතික ප්‍රගතිය** |
|---|---|---|---|---|
| 0.25 | 0.105 | 112.21% | දිස්ත්‍රික් 08 ක ප්‍රතිලාභීන් 150 ක් සහල් පිටි සැකසීම පිළිබඳව පුහුණු කිරීම හා සහල් පිටි මෝල් 25 ක් වැඩි දියුණු කිරීම. | පුහුණු කල සංඛ්‍යාව - 285 වැඩි දියුණු කල සහල් පිටි මෝල් සංඛාව 30 |

- ව්‍යාපෘතිය : එළවළු හා පලතුරු අලෙවිය සඳහා වැඩි දියුණු කල ජංගම වෙළෙඳ කුටි හඳුන්වා දීම හා ප්‍රවර්ධනය කිරීම.

| වෙන් කල මුදල (රු.මි) | මුල්‍ය ප්‍රගතිය (රු.මි) | ප්‍රතිශතය | භෞතික ඉලක්කය | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|
| 0.75 | 0.731 | 97.57% | ජංගම වෙළෙඳ කුටි 10ක් ප්‍රතිලාභීන් අතරේ බෙදාදීම හා ප්‍රතිලාභීන් 120 ක් මේ පිළිබඳව පුහුණු කිරීම. | වෙළෙඳ කුටි 10 ක් සාදා නිම කර ඇත. ජංගම කුටි බෙදා දීම සඳහා ප්‍රතිලාභීන් 10 දෙනෙකු මාතර, කුරුණෑගල, පොළොන්නරුව, අම්පාර හා වව්නියාව යන දිස්ත්‍රික්ක වලින් හඳුනාගෙන ඇත. මේ සම්බන්ධයෙන් 150 දෙනෙකු පුහුණු කර ඇත. |

- ව්‍යාපෘතිය : සහල් පිටි අයිස්ක්‍රීම් මැෂින් දිස්ත්‍රික් මට්ටමින් බෙදාදීම.

| වෙන් කල මුදල (රු.මි) | මුල්‍ය ප්‍රගතිය (රු.මි) | ප්‍රතිශතය | භෞතික ඉලක්කය | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|
| 1.00 | 1.122 | 112.21% | සහල් පිටි අයිස්ක්‍රීම් මැෂින් 05 ක් ප්‍රතිලාභීන් අතරේ බෙදා දීම. | සහල් පිටි අයිස් ක්‍රීම් මැෂින් 05 ක් මාතර, හම්බන්තොට හා කොළඹ දිස්ත්‍රික්ක වල ප්‍රතිලාභීන් හතර දෙනෙක් සඳහා බෙදා දීම සඳහා සූදානම් කර ඇත. |

- ව්‍යාපෘතිය :සහල් මෝල් වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය

| වෙන් කල මුදල(රු.මි) | මුල්‍ය ප්‍රගතිය (රු.මි) | ප්‍රතිශතය | භෞතික ඉලක්කය | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|
| 0.09 | 0.076 | 84% | සහල්මෝල් 20 ක් නවීකරණය කිරීම හා ප්‍රතිලාභීන් 180 ක් පුහුණු කිරීම. | ප්‍රතිලාභීන් 190 ක් පුහුණු කර ඇත. සහල් මෝල් 18 ක් නවීකරණය කර ඇත. |

- ව්‍යාපෘතිය :ග්‍රාමීය ප්‍රදේශ වල සහල් ආශ්‍රිත නිෂ්පාදනය සඳහා කුඩා ව්‍යවසායකත්වයන් ආරම්භ කිරීමේ ව්‍යාපෘතිය.

| වෙන් කල මුදල (රු.මි) | මුල්‍ය ප්‍රගතිය (රු.මි) | ප්‍රතිශතය | භෞතික ඉලක්කය | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|
| 0.25 | 0.215 | 86% | ප්‍රතිලාභීන් 400 ක් පුහුණු කිරීම. | ප්‍රතිලාභීන් 869 ක් පුහුණු කර ඇත. |

- ව්‍යාපෘතිය :ග්‍රාමීය මට්ටමේ ධාන්‍ය/ කුළුබඩු කෘෂි නිෂ්පාදන සැකසීමේ කර්මාන්ත ශාලා ස්ථාපිත කිරීමේ ව්‍යාපෘතිය

| වෙන් කල මුදල(රු.මි) | මුල්‍ය ප්‍රගතිය(රු.මි) | ප්‍රතිශතය | භෞතික ඉලක්කය | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|
| 0.05 | 0.046 | 92% | ග්‍රාමීය මට්ටමේ ධාන්‍ය/ කුළුබඩු කෘෂි නිෂ්පාදන සැකසීම පිළිබඳව ප්‍රතිලාභීන් 100 දෙනෙක් පුහුණු කිරීම. | පුහුණු කිරීම සඳහා ප්‍රතිලාභීන් මාතර හා කුරුණෑගල දිස්ත්‍රික්ක වලින් හඳුනාගෙන 130 දෙනෙකු පුහුණු කර ඇත. |

## vii.ජාතික පොහොර ලේකම් කාර්යාලය

**ප්‍රතිපත්ති, ආයතනික සම්බන්ධිකරණ සහ බලපත්‍ර අංශය**

- 1988 අංක 68 දරන පොහොර විධිමත් කිරීමේ පනතට සංශෝධනය ඇතුළත් කර, නීති කෙටුම්පත් සම්පාදක විසින් එවා ඇති අවසාන කෙටුම්පත ගොවිජන සේවා හා වනජීවි අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය එකඟතාවය හා අනුමැතිය සඳහා යොමු කර ඇත.
- පොහොර ව්‍යවසායකත්ව කාර්යයන් සඳහා නව බලපත්‍ර නිකුත් කිරීම හා පැරණි බලපත්‍ර අලුත් කිරීම මනා පසු විපරමක් යටතේ අඛණ්ඩව ක්‍රියාත්මකව ඇත.ආනයනය යටතේ නව බලපත්‍ර 08 ක් හා පැරණි බලපත්‍ර අලුත් කිරීම් 53 ක් ද සකස් කිරීම යටතේ නව බලපත්‍ර 04 හා පැරණි බලපත්‍ර අලුත් කිරීම් 18 ක් ද සිදු කර ඇත.
- එසේම නිෂ්පාදනය සඳහා නව බල පත්‍ර 02 ක් හා පැරණි බලපත්‍ර අලුත් කිරීම් 01 ක්ද බෙදා හැරීම හා අලෙවි කිරීම යටතේ පැරණි බලපත්‍ර නව බලපත්‍ර 135 ක් සහ අලුත් කිරීම් 19 ක් ද ක්‍රියාත්මක කර ඇත.
- නව බලපත්‍ර නිකුත් කිරීම් මඟින් රුපියල් 305,000.00 ක් සහ පැවති බලපත්‍ර අලුත්කිරීම මඟින්1,420,000.00 ලෙස අයකර රජයේ ගිණුමට බැර කර තිබේ.
- මාස 03 කට වරක් පැවැත්විය යුතු පොහොර උපදේශන කමිටු රැස්වීම් මාර්තු, ජූනි , සැප්තැම්බර් හා දෙසැම්බර් මාස වල පවත්වා ඇත.

__තාක්ෂණික හා ආර්ථික ඇගයුම් ඒකකය__

2012 වර්ෂයේ ආනයනික පොහොර තොගයෙන් තත්ත්ව විශ්ලේෂණය කොට බෙදාහරින ලද පොහොර ප්‍රමාණයන් පහත පරිදි වේ.

| පොහොර වර්ගය | එකතුව |
|---|---|
| යූරියා | 396,888.80 |
| මියුරියේට් ඔෆ් පොටෑෂ් | 144,676.74 |
| ත්‍රිත්ව සුපිරි පොස්පේට් | 109,708.41 |
| තනි සුපිරි පොස්පේට් | - |
| ඇමෝනියම් සල්පේට් | 74,334.05 |
| කීසරයිට් | 10,517.87 |
| සින්ක් සල්පේට් | 1,438.00 |
| ඩයි ඇමෝනියම් පොස්පේට් | 4,576.08 |
| කැල්සියම් ඇමෝනියම් නයිට්‍රේට් | 100.00 |
| එප්සම් සෝල්ට් | 784.27 |
| පොටෑසියම් සල්පේට් | 332.99 |
| කැල්සියම් නයිට්‍රේට් | 337.00 |
| මුහුදු පැළෑටි නිස්සාරකය (Seaweed) (ලීටර්) | 4,520.60 |
| මුහුදු පැළෑටි නිස්සාරකය (Seaweed) | 10.01 |
| දියර පොහොර (ලීටර්) | 241,221.80 |
| මිශ්‍ර පොහොර | 4,879.25 |

2012 යල , මහ කන්න සඳහා වී වගා කරන භූමි ප්‍රමාණය හා පොහොර නිර්දේශ පදනම් කරගනිමින් පොහොර අවශ්‍යතාවය තක්සේරු කර පොහොර බෙදාහැරීම සිදු කරන ලදි.තවද 2012/2013 මහ කන්නය සඳහා වී වගා කරන භූමි ප්‍රමාණය හා පොහොර නිර්දේශ පදනම්

කර ගනිමින් පොහොර අවශ්‍යතාවය තක්සේරු කර බෙදාහැරීම මේ වන විට සිදු කරමින් පවතී.

2012 යල කන්නය

| කාරණය | මහා වාරිමාර්ග | සුළු වාරිමාර්ග | වර්ෂාපෝෂිත | එකතුව |
|---|---|---|---|---|
| වගා ඉලක්ක (හෙක්ටාර) | 302,175 | 151,965 | 82,820 | 536,960 |

| කාරණය | මහා වාරිමාර්ග | සුළු වාරිමාර්ග | වර්ෂාපෝෂිත | එකතුව |
|---|---|---|---|---|
| පොහොර අවශ්‍යතාවය | 130,154.75 | 44,438.70 | 40,680.98 | 215,274.43 |
| පොහොර බෙදා හැරීම | 90,868.10 | 29,761.57 | 26,050.24 | 146,679.91 |

2012/ 2013 මහ කන්නය

| කාරණය | මහා වාරිමාර්ග | සුළු වාරිමාර්ග | වර්ෂාපෝෂිත | එකතුව |
|---|---|---|---|---|
| වගා ඉලක්ක (හෙක්ටාර) | 336,570.00 | 207,041.00 | 209,821.00 | 753,432.00 |

| කාරණය | මහා වාරිමාර්ග | සුළු වාරිමාර්ග | වර්ෂාපෝෂිත | එකතුව |
|---|---|---|---|---|
| පොහොර අවශ්‍යතාවය | 166,556.23 | 57,313.73 | 50,242.33 | 274,112.29 |
| පොහොර බෙදා හැරීම(**2012.12.31)** | 143,476.35 | 46,980.35 | 40,011.89 | 230,468.59 |

- රජයේ ගොවිපළ හා රාජ්‍ය ආයතන සතු කුඹුරු ඉඩම් වල වී වගාව සඳහා ද සහනාධාර මත පොහොර සැපයීම සිදු කරනු ලැබේ.

**2012** යල කන්නය

| වගා ඉලක්ක (හෙක්ටාර) | යූරියා (මෙ.ටො.) | ටී.එස්.පී. (මෙ.ටො.) | එම්.ඕ.පී. (මෙ.ටො.) | එකතුව (මෙ.ටො.) |
|---|---|---|---|---|
| **1,161.10** | 229.25 | 75.70 | 65.87 | 370.82 |

2012/ 2013 මහ කන්නය

| වගා ඉලක්ක (හෙක්ටාර) | යූරියා (මෙ.ටො.) | ටී.එස්.පී. (මෙ.ටො.) | එම්.ඕ.පී. (මෙ.ටො.) | එකතුව (මෙ.ටො.) |
|---|---|---|---|---|
| **3,317.95** | 808.35 | 278.05 | 219.00 | 1.305.40 |

- පොහොර සහනාධාර වැඩසටහන යටතේ ගෙවීම් විස්තර 2012.12.31 දිනට පහත දක්වා ඇත.

| කාරණය | ගෙවන ලද මුදල (රු.) |
|---|---|
| වී පොහොර සහනාධාරය සඳහා | 20,165,989,623.95 |
| තේ පොහොර සහනාධාරය සඳහා | 2,181,078,079.31 |
| පොල් පොහොර සහනාධාරය සඳහා | 625,864,984.60 |
| වෙනත් කෘෂි හා වැවිලි බෝග සඳහා | 13,483,506,509.44 |
| එකතුව | **36,456,439,197.30** |

## ix.සී/ස ලංකා පොහොර සමාගම

1964 වසරේදී ආරම්භ කරන ලද ලංකා පොහොර සංස්ථාව 1992 දී සීමාසහිත ලංකා පොහොර සමාගම නමින් නැවත ස්ථාපිත විය.මහින්ද චින්තන ප්‍රතිපත්තියෙන් ප්‍රකාශිත , ශ්‍රී ලාංකික ගොවි ජනතාව සඳහා වන පොහොර සහනාධාරය යථාර්ථයක් කිරීමේ ප්‍රධානතම රාජ්‍ය ආයතනය ලෙස කටයුතු කරන සීමාසහිත ලංකා පොහොර සමාගම වර්තමානයේ ලබා ඇති ප්‍රගතිය පහත දැක්වේ.

1. සමාගමේ 2011 -2015 දක්වා වූ සංයුක්ත සැලැස්ම සහ 2011 -2013 දක්වා වූ ක්‍රියාකාරී සැලැස්ම සකස් කොට ක්‍රියාත්මක කර ඇත.
2. විගණනය කරන ලද ගිණුම් වාර්තා අදාල ආයතන වෙත ලබාදීම මෙන්ම 2012.03.31 න් අවසන් වාර්ෂික වාර්තාවද මේ වන විට පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කර ඇත.
3. අනුමත කරනු ලැබූ 2013/2014 අය-වැය ක්‍රියාත්මක කර ඇත.
4. වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කොට ක්‍රියාත්මක කර ඇත.
5. වාර්ෂික විගණන සැලැස්ම සකස් කොට ක්‍රියාත්මක කර ඇත.
6. සමාගමේ සේවක සංඛ්‍යා සංයුතිය මෙන්ම බඳවා ගැනීමේ පටිපාටියට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගෙන ඇත.එමෙන්ම සියළුම බඳවා ගැනීම් හා උසස්වීම් අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියට යටත්ව සිදුවේ.
7. 2007/2008 වසර වන විට සෘණ රුපියල් මිලියන 330 ක ශුද්ධ වගකීමක් ලෙස පැවති ලංකා පොහොර සමාගම 2011/2012 වසර වන විට ශුද්ධ වත්කම් රුපියල් මිලියන 543 ක ධන අගයක් දක්වා වර්ධනය කර ගැනීමට හැකි විය.
8. 2011/2012 ගිණුම් වර්ෂය තුළදී රුපියල් මිලියන 95.4 ක බදු පෙර ලාභයක් ලබමින් ආයතනික ඉතිහාසයේ වාර්තාගත වැඩිම බදු පෙර ලාභය සටහන් කිරීමට හැකිවිය.මීට පෙර ආයතනික වාර්තාව වූයේද 2010/2011 වසරේ වූ රුපියල් මිලියන 73.9 ක බදු පෙර ලාභයයි.
9. 2009/2010 වසරේදී රුපියල් මිලියන 35 ක්ද 2010/2011 වසරේදී රුපියල් මිලියන 43.6 ක්ද 2011/2012 වසරේදී රුපියල් මිලියන 50.2 ක්ද රජයට ආදායම් බදු වශයෙන් ගෙවීම් කරනු ලැබීය.
10. පිළිවෙලින් 2009 වසරේ රුපියල් මිලියන 03 කුත්, 2010 වසරේ රුපියල් මිලියන 03 කුත්,2011 වසරේ රුපියල් මිලියන 09 කුත්,ලාභාංශ ගෙවීමට හැකි විය.
11. හුණුපිටිය හා පොළොන්නරුව ප්‍රධාන ගබඩා සංකීර්ණය ඇතුළුව දිවයින පුරා ගබඩා 54 කින් සමන්විත ගබඩා ජාලයේ ධාරිතාව මෙ.ටො.150,000 කි. දිවයින පුරා ස්ථාපිත කර ඇති ලක්පොහොර ගබඩා ජාලය මඟින් ගොවිජන සේවා මධ්‍යස්ථාන 376 කට නිකුත් කරන වී සහනාධාර පොහොර නිසි කලට ගොවිජනතාව වෙත ලබා දීමට කටයුතු කරනු ලබයි.
12. වී පොහොර සහනාධාරය යටතේ 2011/2012 වසර සඳහා පොහොර මෙ.ටො.306,691 ක ප්‍රමාණයක අලෙවියක් සිදු කරනු ලැබීය.
13. වී පොහොර සහනාධාර අලෙවියට පමණක් සීමානොවී රජය විසින් 2011.05.06 දින හඳුන්වා දුන් අනෙකුත් සියළුම බෝග සඳහා සහනාධාර පොහොර ලබාදීමේ වැඩපිළිවෙළ යටතේ රජයේ සහ පෞද්ගලික අංශයේ අවශ්‍යතාවයන්ට අනුව පොහොර ලබාදෙමින් තරඟකාරී වෙළඳපළ තුල ක්‍රියාත්මක වී විශාල වෙළඳපළ කොටසක් අත්පත් කර ගැනීමට ආයතනයට හැකි වී ඇත. මෙම අලෙවිය පසුගිය වසරට සාපේක්ෂව 326% ක වර්ධනයකි.ඒ සඳහා දිවයින පුරා 750 කට ආසන්න අලෙවි නියෝජිත ජාලයක් ස්ථාපිත කිරීමට පියවර ගෙන ඇත.

14. රජයේ දිවිනැගුම ජාතික වැඩසටහනට සමගාමීව නාගරික ගෙවතු වගාවක් ඉලක්ක කර ගනිමින් 500 gm කුඩා ඇසුරුම් පොහොර පැකට් "Mini Pack" නමින් හඳුන්වා දී ඇත.මේ වන විට සුපිරි වෙළඳසැල් වල හා රාජ්‍ය වාණිජ විවිධ නීතිගත සංස්ථාවේ ප්‍රදර්ශනාගාර හා ඊට අනුබද්ධිත අලෙවිසැල් වලින් මෙන්ම ලක්පොහොර අලෙවි ජාලයෙන් මෙම "Mini Pack" මිලදී ගත හැක.

15. සේවා හා පරිපාලන කටයුතු වෙනුවෙන් ISO-9001:2008 අන්තර්ජාතික තත්ව සහතිකය ලබා ගැනීමට මෙම වකවානුව තුළ සමාගමට හැකිවිය.එය රාජ්‍ය ව්‍යාපාරයක් ලෙස ලද සුවිශේෂී ජයග්‍රහණයකි.

16. සමාගම සතු රසායනාගාරය ජාත්‍යන්තර මට්ටමේ සහතික ලත් මධ්‍යගත රසායනාගාරයක් බවට පරිවර්තනය කිරීමේ කටයුතු මේ වන විට සිදු කර ඇති අතර, ඒ සඳහා ISO/IEC/17025:2005 ජාත්‍යන්තර තත්ත්ව සහතිකය ලබාගෙන ඇත.එමෙන්ම ශ්‍රී ලංකා ප්‍රමිතන මණ්ඩලය පිළිගත් පොහොර සම්බන්ධ පරීක්ෂණ සිදු කල හැකි ශ්‍රී ලංකා රාජ්‍ය ආයතන තුන අතරට ඇතුළත්වීමේ අවස්ථාව සමාගම හිමිකරගෙන ඇත.(SLSI,ITI,CFC)

17. සමාගමේ සේවක හවතුන්ගේ කාර්යක්ෂමතාවය වර්ධනය සඳහා පංචවිධ සංකල්පය ඇතුලු ඵලදායිතා සංකල්ප ප්‍රමුඛ කරගත් ඵලදායිතා වැඩසටහන් සෑම අංශයක්ම ආවරණය වන පරිදි ක්‍රියාත්මක කර ඇත.2011 ඵලදායිතා සම්මාන උළෙලේදී මහා පරිමාණ නිෂ්පාදන අංශයේ සම්මානයක් දිනා ගන්නා ලදි.

18.පොළොන්නරුව ප්‍රදේශීය ගබඩා සංකීර්ණය තුළ දීර්ඝ කාලයක සිට භාවිතයට නොගෙන තිබූ ගොඩනැගිලි 04 ක් අවම පිරිවැයක් යටතේ සේවක හවතුන්ගේ ශ්‍රම දායකත්වය ඇතිව ප්‍රතිසංස්කරණය කර නිවාඩු නිකේතන 04 ක් බවට පත් කරන ලදි.එම අංග සම්පූර්ණ නිවාඩු නිකේතන 04 ආයතනයේ සේවක හවතුන් හට විශේෂ සහන මිලකට හා බාහිර පුද්ගලයන් වෙතද වාණිජ ගාස්තු ක්‍රමයට අනුව වෙන් කරවා ගැනීමේ පහසුකම් සලසා ඇත.මෙය ආයතනයට අමතර ආදායමක් උපයන මාර්ගයක් වී ඇත.

19. හරිත ඵලදායිතාව සඳහා හුණුපිටිය කාර්යාල භූමියේ ඇති ලක්පොහොර ගොවිපළ සියළු අංගයන්ගෙන් සමන්විත කාබනික පොහොර පමණක් භාවිතා කරනු ලබන ආදර්ශ ගොවිපළක් ලෙස සංවර්ධනය කර පවත්වාගෙන යනු ලබයි.

20.බලශක්ති පාරිභෝජනය අවම කර ගෙන ඒ තුළින් බලශක්තිය සංරක්ෂණය කිරීම සඳහා ක්‍රමවේද සකස් කර ක්‍රියාත්මක කර ඇත.

21.අලෙවි ප්‍රවර්ධන කටයුතු සඳහා විවිධ අංශ ඔස්සේ ක්‍රියාත්මක වන ලංකා පොහොර සමාගම සමාජ සත්කාරයන් ලෙස ජාතික ගොවි සතියට සමගාමීව ලක්පොහොර පා පැදි සවාරිය වාර්ෂිකව පවත්වන අතර ගොවි ජනතාවගේ පස් වැනි වසරේ ඉගෙනුම ලබන දූවා දරුවන් ඉලක්ක කර ගනිමින් ශිෂ්‍යත්ව විභාගය සඳහා ආදර්ශ ප්‍රශ්න පත්‍ර කට්ටල සහිත ශිෂ්‍යත්ව පුහුණු පොතක්ද එළි දැක්විය.

22.ආයතනය සතුව තිබූ සියලුම අබල ද්‍රව්‍ය,නියමිත ක්‍රමවේදයට අනුව අපහරණය කිරීම සිදු කර ඇත.

## x.සී/ස කොළඹ කොමර්ෂල් පොහොර සමාගම

**කාර්යයන්**

- දිවයිනේ වී වගාව සඳහා පොහොර ප්‍රමාණයෙන් 35% කට නොඅඩු ප්‍රමාණයක් ආනයනය කොට දිවයිනේ පිහිටි ගොවිජනසේවා මධ්‍යස්ථාන හරහා ගොවිජනතාව වෙත සහනාධාර යෝජනා ක්‍රමය යටතේ සහන මිලට හිඟයකින් තොරව නියමිත වේලාවට සපයාදීම
- අනෙකුත් භෝග සඳහා අවශ්‍ය සියළුම මිශ්‍ර සහ අමිශ්‍ර පොහොර ගොවිජන සේවා මධ්‍යස්ථාන හරහා සහ දිවයින පුරා විසිරී සිටින අලෙවි නියෝජිත ජාලයන් හරහා ගොවිජනතාව වෙත සහනාධාර මිල යටතේ ලබාදීම.
  ගොවිජනතාවට පොහොර භාවිතයේදී ඇතිවන ගැටළු සම්බන්ධයෙන් වහාම ක්‍රියාත්මක වී ඒ සම්බන්ධයෙන් අවශ්‍ය උපදෙස් ලබාදීම

**2012 වර්ෂයේ ක්‍රියාත්මක කල සංවර්ධන වැඩසටහන්**

1.2012 දැයට කිරුළ ජාතික සංවර්ධන ප්‍රදර්ශනයට සමගාමීව පොහොර ගබඩාවක් ඉදිකිරීම

2012 වර්ෂයේ පැවති දැයට කිරුළ ජාතික සංවර්ධන ප්‍රදර්ශනයට සමගාමීව අනුරාධපුර දිස්ත්‍රික්කයේ මිහින්තල සීප්පුකුලමග්‍රාමයේ වර්ගඅඩි ප්‍රමාණයකින් යුත් මෙ.ටො.2500 ගබඩා ධාරිතාවයකින් යුත් ගබඩාවක් රු.මි.13.5ක් වැයකොට ඉදිකරනලද අතර අප්‍රේල් 9දින විවෘත කරන ලදි.

**2.පරිපාලන ගොඩනැගිල්ල ඉදිකිරීම**

ආයතනයේ පරිපාලන කටයුතු නිසි පරිදි කරගෙන යාමට පරිපාලන ගොඩනැගිල්ල දැඩි අවශ්‍යතාවය ආයතනය 1994 පුද්ගලික කරණයෙන් පසුව නැවත 1996 රජයට පවරාගැනීමෙන් පසුව පැවති අතර එයට විසඳුමක් වශයෙන් වර්ග අඩි 10000 කින් සමන්විත වන රු.මි.44 ක වියදමින් දෙමහල් පරිපාලන සංකීර්ණයක් ඉදිකිරීමේ කටයුතු 2012 වසරේ ආරම්භ කරන ලද අතර 2013 අප්‍රේල් මාසය වන විට එහි වැඩකටයුතු අවසන් කිරීමට නියමිතය.මේ සඳහා අවශ්‍ය අරමුදල් ආයතනයේ ව්‍යාපාර කටයුතු වලින් උපයාගන්නා ලදි.

**3.පොහොර ගබඩාවක් ඉදිකිරීම**

පොහොර අවශ්‍යතාවයෙන් 35% ප්‍රමාණයක් ගොවිජන සේවා මධ්‍යස්ථාන වෙත සපයාදීමේදී ආයතනය සතු ගබඩා පහසුකම් ප්‍රමාණවත් නොවීමද ආයතනය ඇනට මුහුණ පා ඇති ප්‍රධාන අභියෝගයකි.ඊට පිළියමක් වශයෙන් වර්ග අඩි 22000 සමන්විත පොහොර මෙ.ටො. 8000 ක ගබඩා ධාරිතාවයකින් යුතු රු.මි.61 ක ඇස්තමේන්තුගත වියදමකින් හුණුපිටිය ප්‍රධාන ගබඩා සංකීර්ණ පිහිටි භූමියට ආසන්නව නව ගබඩාවක් ඉදිකිරීම සඳහා භූමිය සකස්කොට ඇත.ඉදිකිරීම් කටයුතු සඳහා ටෙන්ඩර් කැඳවීම් සිදුකර ඇති අතර මේ සඳහා අරමුදල් කොළඹ කොමර්ෂල් පොහොර සමාගම විසින්ම උපයා ගන්නා ලද අරමුදල වීම විශේෂත්වයකි.

**2012 සහනාධාර පොහොර බෙදාහැරීම -2012.12.31 දිනට ප්‍රගතිය**

| දිස්ත්‍රික්කය | පොහෙර වර්ගය (මෙ.ටො.) | | | එකතුව (මෙ.ටො.) | විකුණුම් ආදායම (රු) |
|---|---|---|---|---|---|
| | යූරියා | ටී.එස්.පී. | එම්.ඕ.පී. | | |
| කොළඹ | 222.45 | 99.05 | 180.40 | 501.90 | 3,151,932.00 |
| ගම්පහ | 1036.05 | 477.40 | 470.80 | 1984.25 | 12,461,090.00 |
| කළුතර | 933.00 | 484.35 | 795.05 | 2212.40 | 13,893,872.00 |
| මහනුවර | 365.15 | 171.80 | 140.45 | 677.40 | 4,254,072.00 |
| මාතලේ | 1922.85 | 612.85 | 508.90 | 3044.60 | 19,120,088.00 |
| නුවරඑළිය | 243.15 | 117.60 | 119.65 | 480.40 | 3,016,912.00 |
| ගාල්ල | 700.30 | 327.05 | 589.80 | 1617.15 | 10,155,702.00 |
| මාතර | 1344.35 | 568.60 | 857.55 | 2770.50 | 17,398,740.00 |
| හම්බන්තොට | 5619.40 | 1885.20 | 1583.15 | 9087.75 | 57,071,070.00 |
| කුරුණෑගල | 8522.00 | 2678.70 | 2337.65 | 13538.35 | 85,020,838.00 |
| පුත්තලම | 2247.50 | 708.90 | 612.65 | 3569.05 | 22,413,634.00 |
| රත්නපුරය | 1460.20 | 487.80 | 489.45 | 2437.45 | 15,307,186.00 |
| කෑගල්ල | 189.95 | 84.55 | 88.55 | 363.05 | 2,279,954.00 |
| බදුල්ල | 2967.20 | 1128.60 | 913.80 | 5009.60 | 31,460,288.00 |
| මොණරාගල | 4161.90 | 1327.75 | 1122.05 | 6611.70 | 41,521,476.00 |
| අනුරාධපුරය | 14121.20 | 4649.35 | 3838.45 | 22609.00 | 141,984,520.00 |
| පොළොන්නරුව | 6395.30 | 2111.80 | 1782.20 | 10289.30 | 64,616,804.00 |
| මඩකලපුව | 3097.70 | 1080.45 | 834.25 | 5012.40 | 31,477,872.00 |
| අම්පාර | 14062.70 | 4644.00 | 3698.90 | 22405.60 | 140,707,168.00 |
| ත්‍රිකුණාමලය | 4808.40 | 1566.05 | 1199.60 | 7574.05 | 47,565,034.00 |
| වව්නියාව | 1750.00 | 562.50 | 418.75 | 2731.25 | 17,152,250.00 |
| මුලතිව් | 1285.20 | 412.35 | 364.70 | 2062.25 | 12,950,930.00 |
| මන්නාරම | 2493.05 | 773.65 | 693.00 | 3959.70 | 24,866,916.00 |
| කිලිනොච්චි | 1883.75 | 512.00 | 461.50 | 2857.25 | 17,943,530.00 |
| **එකතුව** | **81,832.75** | **27,472.35** | **24,101.25** | **133,406.35** | **837,791,878.00** |

# 07.මූල්‍ය වාර්තා

## *7.1. අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රගතිය(2012.12.31 දක්වා)*

**ශීර්ෂය - 118 - වැඩසටහන 01 මෙහෙයුම් වැඩසටහන - අමාත්‍ය කාර්යාලය**

| විස්තරය | 2012 ඇස්තමේන්තුව (රු.මි) | ප්‍රතිශෝධිත ඇස්තමේන්තුව (රු.මි) | මුළු වියදම (රු.මි) | ප්‍රතිශතය (%) |
|---|---|---|---|---|
| **පුනරාවර්තන වියදම්** | **30.15** | **32.264** | **31.458** | **98** |
| පුද්ගල පඩි නඩි | 10.5 | 11.075 | 10.669 | 96 |
| ගමන් වියදම් | 2.5 | 5.324 | 5.284 | 99 |
| සැපයීම් | 6.25 | 6.75 | 6.577 | 97 |
| නඩත්තු වියදම් | 5.5 | 5.9 | 5.89 | 100 |
| සේවා | 5.4 | 3.215 | 3.036 | 94 |
| **මූලධන වියදම්** | **7.9** | **7.8** | **7.050** | **90** |
| මූලධන වත්කම් වල පුනුරුත්තාපනය හා වැඩි දියුණු කිරීම | 7.2 | 6.739 | 6.237 | 93 |
| මූලධන වත්කම් අත්පත් කර ගැනීම | 0.7 | 1.061 | 0.812 | 77 |
| **මුළු ව්‍යාපෘතිවල වියදම** | **38.050** | **40.064** | **38.508** | **96** |

**ශීර්ෂය - 118 - වැඩසටහන 01 මෙහෙයුම් වැඩසටහන**

**ව්‍යාපෘතිය 02 ආයතන පරිපාලන සේවා**

| විස්තරය | 2012 ඇස්තමේන්තුව (රු.මි) | ප්‍රතිශෝධිත ඇස්තමේන්තුව (රු.මි) | මුළු වියදම (රු.මි) | ප්‍රතිශතය (%) |
|---|---|---|---|---|
| **පුනරාවර්තන වියදම්** | **88.390** | **87.193** | **85.225** | **98** |
| පුද්ගල පඩි නඩි | 49.0 | 47.8 | 46.067 | 96 |
| ගමන් වියදම් | 1.35 | 1.425 | 1.418 | 100 |
| සැපයීම් | 6.64 | 7.54 | 7.45 | 99 |
| නඩත්තු වියදම් | 8.0 | 8.57 | 8.556 | 100 |
| සේවා | 22.2 | 20.144 | 20.066 | 100 |
| මාරු කිරීම් | 1.2 | 1.714 | 1.666 | 97 |
| පාඩු හා කපා හැරීම් | | 0.514 | 0.514 | 100 |
| **මූලධන වියදම්** | **12.8** | **12.35** | **11.711** | **92** |
| මූලධන වත්කම් වල පුනුරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම | 7.85 | 6.698 | 6.683 | 100 |
| මූලධන වත්කම් අත්පත් කර ගැනීම | 3.95 | 5.050 | 4.241 | 84 |
| හැකියා වර්ධනය | 1.0 | 1.0 | 0.787 | 79 |
| **මුළු ව්‍යාපෘතිවල වියදම** | **101.19** | **99.941** | **96.937** | **97** |

<u>ශීර්ෂය - 118 - වැඩසටහන 02 සංවර්ධන වැඩසටහන්</u>

<u>ව්‍යාපෘති 03 කෘෂි සංවර්ධන වැඩසටහන</u>

| විස්තරය | 2012 ඇස්තමේන්තුව (රු.මි) | ප්‍රතිශෝධිත ඇස්තමේන්තුව (රු.මි) | මුළු වියදම (රු.මි) | ප්‍රතිශතය (%) |
|---|---|---|---|---|
| **පුනරාවර්තන වියදම්** | **77.29** | **75.073** | **73.087** | **97** |
| පුද්ගල පඩි නඩි | 24.95 | 25.535 | 24.010 | 94 |
| ගමන් වියදම් | 2.35 | 3.674 | 3.595 | 98 |
| සැපයීම් | 3.53 | 3.374 | 3.225 | 96 |
| නඩත්තු වියදම් | 2.26 | 2.26 | 2.25 | 100 |
| සේවා | 14.2 | 11.33 | 11.313 | 100 |
| මාරු කිරීම් | 30.0 | 28.9 | 28.691 | 99 |
| **මූලධන වියදම්** | **2058.947** | **1881.841** | **1536.591** | **82** |
| මූලධන වත්කම් වල පුනුරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම | 0.95 | 2.15 | 2.101 | 98 |
| මූලධන වත්කම් අත්පත් කර ගැනීම | 1.05 | 1.05 | 1.048 | 100 |
| හැකියා වර්ධනය | 0.1 | 0.1 | 0.04375 | 44 |
| අනෙකුත් ප්‍රාග්ධන වියදම් | 2056.847 | 1878.5 | 1533.39 | 82 |
| අස්වනු පූරෝකතන වැඩසටහන | 4.0 | 0.3 | 2.126 | 71 |
| පාංශු සංරක්ෂණ වැඩසටහන | 20 | 12.414 | 9.427 | 76 |
| ක්ෂුද්‍ර ජල සම්පාදන වැඩසටහන | 20 | 7.586 | 6.16 | 81 |
| අපි වවමු - රට නගමු විශේෂ වැඩසටහන | 460 | 403.18 | 313.11 | 68.1 |
| කාබනික පොහොර ප්‍රවර්ධන වැඩසටහන | 125 | 100 | 92.74 | 93 |
| (2 KR) ජපන් - ශ්‍රී ලංකා ප්‍රතිපාර්ශවීය අරමුදල රජයේ බීජ ගොවිපල් සංවර්ධනය (මුරුක්කන් හා පරන්තන්) | 84.847 | 72.752 | 52.599 | 72.29 |
| වියළි කලාපීය ජීවන සහයෝගීතා වැඩසටහන (IFAD ) | 613 | 573 | 530.391 | 92.56 |
| ආහාර නිෂ්පාදන සඳහා ජපන් ප්‍රදාන (2 KR) | 585 | 493.70 | 430.466 | 87.19 |
| NARP වැඩසටහන | 20 | 10 | 5.056 | 50.56 |
| ලොකළුණු නිෂ්පාදන වැඩසටහන | 25 | 25 | 7.472 | 30 |
| දැයට කිරුළ වැඩසටහන | 60 | 60 | 38.315 | 64 |
| මන්නාරම් දිස්ත්‍රික්කයේ අවතැන් වූ ජනතාවගේ ආහාර සුරක්ෂිතතාව ඇතිකිරීම | 40 | 60.14 | 44.594 | 76 |
| සහල් අපනයන කලාප වැඩසටහන | | 0.94 | 0.94 | 100 |
| **මුළු ව්‍යාපෘතිවල වියදම** | **2136.237** | **1956.915** | **1609.679** | **82** |

## වැඩසටහන - 02 සංවර්ධන වැඩසටහන

## ව්‍යාපෘතිය 5 කෘෂිකර්ම / ගොවිජන සංවර්ධන ආයතන හා සමාගම්

| විස්තරය | 2012 ඇස්තමේන්තුව (රු.මි) | ප්‍රතිශෝධිත ඇස්තමේන්තුව (රු.මි) | මුළු වියදම (රු.මි) | ප්‍රතිශතය (%) |
|---|---|---|---|---|
| **පුනරාවර්තන වියදම්** | **235** | **230.3** | **218.307** | **95** |
| මුදල් මාරු කිරීම් හා සහනාධාර | | | | |
| හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු ආයතනය | 115 | 112.7 | 108.487 | 96 |
| ශ්‍රී ලංකා හදබිම අධිකාරිය | 36 | 35.28 | 34.352 | 97 |
| පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනය | 50 | 49 | 46.601 | 95 |
| කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව | 22 | 21.56 | 18.462 | 86 |
| ජාතික ආහාර ප්‍රවර්ධන මණ්ඩලය | 12 | 11.76 | 10.403 | 88 |
| **මූලධන වියදම්** | **120** | **109.2** | **55.212** | **51** |
| රජයේ ආයතන වලට මාරු කිරීම | | | | |
| හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු ආයතනය | 10 | 9.1 | 5.261 | 58 |
| ශ්‍රී ලංකා හදබිම අධිකාරිය | 70 | 63.7 | 29.996 | 47 |
| කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව | 30 | 27.3 | 19.955 | 73 |
| ජාතික ආහාර ප්‍රවර්ධන මණ්ඩලය | 10 | 9.1 | - | 0 |
| **මුළු ව්‍යාපෘතිවල වියදම** | **355** | **339.5** | **273.520** | **81** |

## *7.2 අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන කටයුතු*

අභ්‍යන්තර විගණන ඒකකය විධිමත්ව ස්ථාපනය කරනු ලැබුවේ 2011 ජූනි මස 01 වෙනි දින සිටය.

- විගණන හා කලමණාකරණ කමිටු රැස්වීම් පැවැත්වීම - ඉලක්කය 04 , ප්‍රගතිය 0

**<u>විගණන පරීක්ෂණ හා විශේෂ පරීක්ෂණවලට අදාල ප්‍රගතිය 2012</u>**

| ආයතනය | ඉලක්කය | 2012 වර්ෂය තුළ යවා ඇති විගණන විමසුම්/පරීක්ෂණ වාර්තා සංඛ්‍යාව |
|---|---|---|
| 1.කෘෂිකර්ම අමාත්‍යාංශය | 1.වාහන අලුත්වැඩියාව පිළිබඳ පරීක්ෂාව<br>2. බඩු වට්ටෝරු පොත් හා ස්ථාවර වත්කම් පිළිබඳ සිදු කළ විගණන පරීක්ෂාව<br>3.වායු සමීකරණ යන්ත්‍ර සහ ඡායාපිටපත් යන්ත්‍ර සේවා කිරීම පිළිබඳ සිදු කල විගණන පරීක්ෂාව<br>4.සංචිත වාහනවල ධාවන සටහන් පරීක්ෂාව<br>5. සංචිත වාහනවල ඉන්ධන පිළිබඳ පරීක්ෂාව<br>6.වාහන අලුත්වැඩියාව සම්බන්ධව ඉදිරිපත් කර ඇති වාර්තා මත මූලික පරීක්ෂණය<br>7.බැංකු සැසඳුම් පිළිබඳ පරීක්ෂාව<br>8.ගොවිහාරකාර අරමුදල මගින් කෘෂි ළිං ඉදිකිරීම පිළිබඳ පරීක්ෂාව<br>9.විදුලි බිල්පත් පිළිබඳ පරීක්ෂාව | 11 |
| 2.ජාතික ආහාර ප්‍රවර්ධන මණ්ඩලය | 1.අලෙවිසැල් පිළිබඳ පරීක්ෂාව<br>2.සුවදැල් ස්ලෝෆුඩ් භෝජනාගාරය සඳහා මිලදීගත් උපකරණ පිළිබඳ පරීක්ෂාව<br>3.සුවපෝෂ අතිරේක ආහාර ව්‍යාපෘතිය පිළිබඳ පරීක්ෂාව<br>4.නාරාහේන්පිට කිරිමණ්ඩල මාවතේ අංක 55/2 දරන නිල නිවසය පිළිබඳ පරීක්ෂාව | 05 |
| 3.ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව | 1. අභ්‍යන්තර විගණන පරීක්ෂාව | 01 |
| 4.වියළි කළාපීය ජීවනෝපායන් සඳහා සහයවීමේ හා හවුල්වීමේ වැඩසටහන | 1.අභ්‍යන්තර විගණන පරීක්ෂාව (කුරුණෑගල,මොණරාගල,අනුරාධපුරය)<br>2.විශේෂ භාණ්ඩ සමීක්ෂණය (බදුල්ල, මොණරාගල,අනුරාධපුරය, කුරුණෑගල) | 02 |

| | | |
|---|---|---|
| 5.කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | 1.අනුරාධපුර කෘෂිකර්ම විද්යාලයේ විදුහල්පති තුමාගේ පාලනය පිළිබඳ ජනාධිපති කාර්යාලයෙන් එවා ඇති ලිපිය පිළිබඳ විශේෂ පරීක්ෂණය<br>2.ගිරාදුරුකෝට්ටේ කෘෂිකර්ම පර්යේෂණ මධ්‍යස්ථානය පිළිබඳ විශේෂ පරීක්ෂණය<br>3.අම්බලන්තොට වී පර්යේෂණ ආයතනය පිළිබඳ විශේෂ පරීක්ෂාව<br>4.ආනයන බලපත්‍ර ලබාගැනිමේදී සිදුවන ප්‍රමාදයන් පිළිබඳ විශේෂ පරීක්ෂණය<br>5.පැළෑටි ජාන සම්පත් මධ්‍යස්ථානයේ කටයුතු පිළිබඳ විශේෂ පරීක්ෂණය<br>6.කාබනික පොහොර ව්‍යාපෘතිය යටතේ ලබාදී ඇති විද්‍යාගාර උපකරණවල උපයෝජනය පිළිබඳ බෝඹුවල සහ හොරණ පර්යේෂණ මධ්‍යස්ථානවල සිදුකළ විශේෂ පරීක්ෂාව<br>7.සීතාඑළිය බීජ අර්තාපල් ගොවිපල පිළිබඳ විශේෂ පරීක්ෂාව<br>8.බණ්ඩාරගම උද්‍යාන විද්‍යා ගොවිපල පිළිබඳ විශේෂ පරීක්ෂාව | 08 |
| 6.පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනය | 1.අනුරාධපුර කාර්යාලයේ අභ්‍යන්තර විගණන පරීක්ෂාව<br>2.නුවරඑළිය කාර්යාලය පරීක්ෂාව | 02 |
| 7.හදබිම අධිකාරිය | 1.අභ්‍යන්තර විගණන පරීක්ෂාව | 01 |
| 8.හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය | 1.විශේෂ විගණන පරීක්ෂණය | 01 |